# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2564 ක් වූ ඇසළ පුර අටවක පෝය දින රාජ්‍ය වර්ෂ 2020 ජූනි 28 වනදා ඉරිදා BUDUSARANA SUNDAY JUNE 28, 2020

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 55 වන කාණ්ඩය, 04 වන පත්‍රය, පිටු 20 ආරම්භය 1965-06-13 මිල රු.40.00




## අභයගිරිය සෑරදුන් වහන්සේ

විස්තර 09 පිටුවේ




# පරමාදර්ශී ශ්‍රාවක පිළිවෙත

**ලෞකිකත්වයෙන් බැහැර ව, නිවන අරමුණු කරගත් පිළිවෙතක යෙදෙමින් බොහෝ දෙනාගේ හිත සුව පිණිස ක්‍රියා කිරීම බෞද්ධ භික්ෂුවගේ කාර්ය භාරයයි. එවන් උත්තරීතර අරමුණක් ඇතිව ක්‍රියාත්මක වූ භික්ෂූන් ඇතුළත් සමාජය පරමාදර්ශී සමාජයක් ලෙස හැඳින්විය හැකි ය.**

ලෝකයේ පවතින ස්වභාවයත්, එය දුක් සහගත බවත්, එයින් මිදී නිවන් ලැබීම තම ශ්‍රාවකයන්ගේ පිළිවෙත විය යුතු බවත් බුදුරජාණන් වහන්සේ වදාළහ. බුදු සසුන බිහි වී වසර 20 ක් තරම් කල් ගතවන තුරු සියලුම භික්ෂූන් වහන්සේලා තුළ එම පරමාදර්ශී ලක්ෂණ පැවතුණි. විවිධ ආගමික කණ්ඩායම් පැවතුණු එද භාරතීය සමාජයේ එම සියලු කණ්ඩායම් අභිබවා භික්ෂු සමාජය ප්‍රචලිත විය. ඒ නිසාම බොහෝ දෙනාගේ ප්‍රසාදයට ලක් වී භික්ෂූන්ට ප්‍රත්‍ය පහසුකම් ලැබීම ද වැඩි වන්නට විය. එම වාතාවරණය යටතෙහි ධර්ම විනයට අනුව එතරම් දුරට හික්මීමක් නොලද පුහුදුන් භික්ෂූන් ප්‍රත්‍යලාභයට හා කීර්ති ප්‍රශංසාවලට ගිජු වී ක්‍රියා කිරීමට පෙළඹුණු අතර ඒ පිරිස ක්‍රමයෙන් වැඩි වන්නට විය.

ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා පසු පස හඹා ගිය අය අතර ප්‍රථමයෙන් ම මතු වී පෙනුණේ දෙවුදත් තෙරුන් ය. තෙරුන්ට ලැබෙන අධික ලාභ සත්කාර පිළිබඳ ව පුහුදුන් භික්ෂුවක් බුදු රදුන්ට සැළ කර සිටි විට උන්වහන්සේ වදාළේ දෙව්දත්ට ලැබෙන ලාභ සත්කාරවලට ඊර්ෂ්‍යා නොකරන ලෙස හා එම ලාභ සත්කාර නිසාම උන්වහන්සේ පිරිහී යන බවයි. එය එසේ සිදුවිය. නිවන් මග යනු එකක් බවත්, ලාභ සත්කාර ලැබීමේ මග අනෙකක් බවත් 'අඤ්ඤා හි ලාභූපනිසා අඤ්ඤා නිබ්බාණගාමිනී' යනුවෙන් බුදු හිමියන් පෙන්වා දී ඇත.

බුදුන් ජීවමාන කාලය තුළම ලාභ කීර්ති ප්‍රශංසාවලට ගිජු වූ භික්ෂූන් අශාසනික පිළිවෙත්වල යෙදෙන්නට වූහ. ධර්ම විනය විරෝධී එවැනි භික්ෂූන්ගෙන් ධර්ම විනය ආරක්ෂා කරගැනීමටත්, පිවිතුරු බුද්ධ වචනය එලෙසින් ම තහවුරු කර තැබීමටත් මහා කාශ්‍යප මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වූහ. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 100 ක් යන විට එම පිරිස වර්ධනය වී වජ්ජිපුත්තක නමින් කණ්ඩායමක් හැදී විනය විරෝධී දස වස්තුවක් ඉදිරිපත් කරගෙන එය සම්මත කර ගැනීමට උත්සාහ දැරූහ. ධර්ම විනය ගරුක භික්ෂූහු ඔවුන්ට එරෙහි වූහ. එම භික්ෂු පිරිසේ ප්‍රධානියා වූ බදිරවතිය රේවත මහ රහතන් වහන්සේට අල්ලස් දීමට පවා වජ්ජිපුත්තකයෝ උත්සාහ දැරූහ. එහෙත් එය සාර්ථක නොවිනි. පරිනිර්වාණයෙන් වසර 236 ක් ගිය තැන තුන්වන ධර්ම සංඝායනාව පැවැත්වීමට ප්‍රධාන හේතුව වූයේ ද ඒ වන විට විශාල වශයෙන් භික්ෂූන් ලාභ සත්කාර පසු පස හඹා යෑමයි.



**බෙංගමුවේ නාලක අනුනාහිමි**

භික්ෂුව ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවලට ගිජු වීමේ භයානකකම හා ආදීනව පිළිබඳව බුද්ධ දේශනා සංයුක්ත නිකායේ තුන්වන කොටසේ මහා කස්සප හා ලාභ සත්කාර සංයුක්ත වල එන සූත්‍රවල පැහැදිලි කර ඇත. ඒ පිළිබඳ කරුණු පැහැදිලි කරන එක සූත්‍රයක් නම් මීලහක සූත්‍රයයි. එහි මෙසේ සඳහන් වේ. මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසා ඉතා දරුණු ය. අසූචි ආහාරයට ගන්නා පණුවෙක්, ඉදිරියේ ඇති ලොකු අසූචි ගොඩක් දැක මට අසූචි කන්න අවස්ථාවක් පැදී ඇත. අනෙක් පණුවන්ට වඩා තමා වාසනාවන්ත යැයි හේ සිතයි.

එසේම මහණෙනි, ලාභ සත්කාර කීර්ති ප්‍රශංසාවලට ගිජු වී එයින් මඩනා ලද සිත් ඇති භික්ෂුව ද පිඬුසිගා ගොස් ඇති තරම් පිණ්ඩපාතය ලබා පසු දිනයට ද ඇරයුම් ලබාගෙන භික්ෂූන් ඉදිරියට පැමිණ තමාගේ ප්‍රත්‍ය ලාභය පිළිබඳ වර්ණනා කරයි. අනෙකුත් භික්ෂූන් තමන් සේ ලාභී නොවන බව ද සිතයි. එහෙත් ඔහුගේ එම ලාභ කීර්ති ප්‍රශංසා ඔහුගේ විනාශයට ම හේතු වෙයි.'

කස්සප සංයුක්තයේ තතිය ඕවාද සූත්‍රයේ සඳහන් කරුණු සැකෙවින් මෙසේ ය. 'දිනක් බුදු රදුන් වෙත පැමිණි මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ තමන් වහන්සේ හා සම සමව සලකා භික්ෂූන්ට අවවාද කරන ලෙස සැළ කළහ. එවිට උන්වහන්සේ දැන් භික්ෂූන් දුර්වල බවත්, ධර්මයට අනුව කරන අවවාද පිළි නොගන්නා බවත්, ඒවා නුහුරට ගන්නා බවත් කීහ. ඒ ඇසූ බුදු හිමියෝ ඉස්සර භික්ෂූන් මෙන් දැන් සිටින භික්ෂූන් ධර්මානුකූල පිළිවෙත් ගරු නොකරන හා පිළි නොපදින බවත් වීර්යාරම්භයේ නොයෙදෙන බවත් වදාළහ. එද පිළිවෙත්ගරුක භික්ෂූන්, මහ තෙරවරු සේ ම, නවක භික්ෂූහු ද පිළිගත්හ. උන්වහන්සේලාට ගරු කළහ. එහෙත් දැන් එසේ නොවේ. එවන් උසස් ගතිගුණ ඇති භික්ෂූන්, සමහරු පිළි නොගනිති. ප්‍රසිද්ධියට පත් ලාභ කීර්ති ප්‍රශංසාවලින් අග තැන්පත් භික්ෂූන්ට ඇතැම්හු සලකති. නවක භික්ෂූහු ද ඒ අනුව ක්‍රියා කරති. මහණෙනි මෙය බ්‍රහ්මචර්යාවට ඇති වූ උවදුරකි. බ්‍රහ්මචර්යාව නිසා ලැබෙන ලාභ කීර්ති ප්‍රශංසා පිළිබඳ ව අධික ගිජුකම බ්‍රහ්මචර්යාවට (භික්ෂු ශාසනයට) බොහෝ කලක් අහිත පිණිස, දුක් පිණිස පවතී."

ශාසන ඉතිහාසය පුරාම ඒ ඒ යුගවල කිසියම් භික්ෂු කණ්ඩායමක් බුද්ධ විනයට එරෙහිව ලාභ කීර්ති ප්‍රශංසා පසුපස යමින් ක්‍රියා කර ඇත. මෙතෙක් ශාසනය ආරක්ෂා වී ඇත්තේ එවන් ගති පැවතුම්වලින් බැහැර වූ ධර්ම විනයානුකූලව කටයුතු කරමින් ලාභ කීර්ති ප්‍රශංසාවලට ගිජු නොවූ භික්ෂූන් වහන්සේ නිසයි. පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යන බටහිර අධිරාජ්‍යවාදීන්ට වසර 400 ක් තරම් කාලයක් උත්සාහ කළ ද රට අත්පත් කරගත නොහැකි වූයේ ලාභ, කීර්ති, ප්‍රශංසා පසුපස හඹා නොගිය සිංහල භික්ෂූන් වහන්සේගේ අනුශාසනා හා මග පෙන්වීම් ලැබූ වීරෝදාර සිංහල ජන නායකයින් හා ජනතාව නිසයි. මේ තත්ත්වය වටහා ගත් ඉංග්‍රීසිහු භික්ෂූන් වහන්සේට නායක පදවි හා විහාරාධිපතිකම් පිරිනමා ඒ පිළිබඳ ව භික්ෂූන් තුළ ආශාවක් ඇතිවන ලෙසට කටයුතු යෙදූහ. මේ නිසා එතෙක් පරමාදර්ශී සමාජය තුළ ක්‍රියාත්මක වූ සමහර භික්ෂූන් වහන්සේ ඉන් ඈත් වී ක්‍රියා කිරීමට නැඹුරු වූහ. ක්‍රමයෙන් ලාභ සත්කාර හා කීර්ති ප්‍රශංසාවලට ගිජු වී ඒවා පසුපස හඹා යන තැනට පත්වූහ.

බුද්ධ ශාසනයේ පැවැත්මට අතිශයින්ම අහිතකර වූ ලාභ සත්කාරවලට හා කීර්ති ප්‍රශංසාවලට ගිජු වී ක්‍රියා කිරීමට හා එසේ ක්‍රියා කරන අයට වැට බැඳීමට ධර්ම විනයධර ශාසනමාමක භික්ෂූන් වහන්සේලා මෙන්ම සැදැහැවත් බුද්ධිමත් ගිහි පින්වතුන් ද ක්‍රියා කළ යුතුව ඇත. පෙර රජුන් දවස මෙන් සංගායනාවක් කිරීම හෝ කතිකාවතක් සකස් කිරීම මෙහිලා වැදගත්වන බව සඳහන් කළ යුතු ය.

ඇසළ පුර අටවක පෝදා

## දම් දෙසුම

# පාපය මී පැණි වැනි විඳින කල ගිනිදලු මෙනි



මණ්ඩාවල - පුංචි මණ්ඩාවල මල්ලිකාරාමයේ
දහම් සරසවි ඩිප්ලෝමා
ධම්ම - අභිධම්ම - පාලිධර්මාචාර්ය
**කුඩාවේ ගුණරතන හිමි**

අත්තාහි අත්තනෝ නාථෝ
කෝහි නාථෝ පරෝ සියා
අත්තනාව සුදන්තේන
නාථං ලභති දුල්ලභං

**රජගහ නුවර සිටුතුමාගේ දියණිය ඉතාමත් දැහැමි ගුණවන්තියකි. පැවිදිවීමට මිස ගිහි සැප පිළිබඳ ව එතරම් ඇලීමක් නැත. සිටු මව්පියෝ කුමරිය සිටු කුමාරයෙකුට සරණ පාවා (විවාහකර) දුන්හ. එම කුමාරයා ද කුමාරිය මෙන් පිනට දහමට කැමති ය.**

වැඩිකල් යන්නට පෙර කුමරිය ස්වාමියාගේ සිත දිනාගෙන මහණවීමට අවසර ලබා ගෙන මෙහෙණි ආරාමයක පැවිදි වූවා ය. එම ආරාමය දෙව්දත් තෙරුන්ගේ පාක්ෂික මෙහෙණින් වාසය කරන ස්ථානයකි. පැවිදි වූයේ විවාහයටපත් අලුතම ය. ඒ වන විට ද කුමරියගේ කුසෙහි දරු ගැබක් පිළිසිඳ ගෙන තිබුණි. පැවිදි වූයේ ඒ බව නොදැන ය. ටිකෙන් ටික කුස වර්ධනය විය. කුසෙහි ස්වභාවය දක්නට ලැබීමෙන් පසු, නේවාසික මෙහෙණින් වහන්සේලා ත්‍රාසයට, භීතියට, කුතුහලයට කළ කිරීමට පත්වූහ. මේ සිද්ධිය දෙව්දත් තෙරුන්ට දැන්වීමෙන් පසු වෙන කළ හැක්කක් නොවන බැවින් අන් මෙහෙණින් වහන්සේලාට ද මෙය අපහාසයක් නින්දවක් නිසා සිවුරු හරවා යවන ලෙස දැන්වී ය.

එම මෙහෙණින් වහන්සේ පැවිදිවූ පසු සිදුවූ දෙයක් නොවන බව හොඳාකාරව ම දනී. දෙවුදත්ගේ බසට කළකිරී ඒ බව බුදුරජාණන් වහන්සේට දැන්වූවා ය. බුදුරජාණන් වහන්සේ මෙහෙණියගේ දරු ගැබ ගිහි කළ සිදුවූවක් බව හොඳාකාර ව ම දනී. නමුත් මහජනතාවගේ සැකය දුරු කර නිවැරැදි විනිශ්චයක් ලබා ගැනීමට කොසොල් මහරජතුමා, අනේපිඬු සිටුතුමා විශාකා මහ උපාසිකාව යන අයට බාර කළහ.

විනය සම්බන්ධ අගතැන්පත් උපාලි තෙරුන් වහන්සේ විනය පරීක්ෂණය සිදු කළහ. සියලු තොරතුරුවලින් ප්‍රකාශ වූයේ මෙහෙණින් වහන්සේ නිරවද්‍ය බවත්, පිරිසුදු බවත් ගිහි ජීවිතයේ දී සිද්ධ වූ දෙයක් ලෙසට සනාථ විය. විනයානුකූල ව හා සාකච්ඡා තුළින් ස්ථිර විය. මෙසේ දින සති මාස සම්පූර්ණ වීමෙන් පසුව මෙහෙණින් වහන්සේ මහා පුණ්‍යවන්ත පුත් රුවනක් බිහි කළා ය.

'කුමාරකස්සප' නම් වූ ඒ පින්වත් කුමරු කොසොල් මහ රජතුමාගේ රාජ මන්දිරයේ වැඩුණේ ය. සසර පුරුද්ද අනුව කුඩා කාලයේ සිට ම පැවිදි වීමට ඉමහත් කැමැත්තක්, ඇල්මක් දක්වූ හෙයින් අලංකාර පෙරහරකින් බුදුරජාණන් වහන්සේ හමුවට පුතු රැගෙන විත් උතුම් පැවිදි භූමියෙහි පිහිටවූයේ උන්වහන්සේට පෙර මහා වාසනා ගුණය තිබූ නිසා ටික කලකින් ම විදසුන් වඩා උතුම් රහත් ඵලයට පත්වූහ.

කුමාරකස්සප තෙරුන් වහන්සේගේ මාතෘ මෙහෙණින් වහන්සේ පුහුදුන් ය. පුරා වසර දොළහක් ම සිය පුතු නොදැක සෝකයෙන්, වේදනාවෙන් කම්පනයෙන් පෙළිණ. පුතු නොදැක දුකින් පීඩිත ව කල්යවන අවස්ථාවේ දී ඇතුලු වීදියේ දී දක්නට ලැබුණි. දරු ස්නේහය බුර බුරා නැගෙන ගින්නක් සේ ඉස්මතු වී අනේ පුතණුවනි, කියා වේගයෙන් සමීප ව අල්ලන්නට සූදනම් වන විට 'මේ කිමෙක් ද? වහා ඉවත්වන්න, ඉවත්වන්න' කියා වැදූ මව් මෙහෙණට සෙනෙහසක් නොදක්වන බව හැඟවී ය.

එසේ කළේ ඉදිරියේ සිදුවන යහපත දැක ය. දරු ස්නේහය බිඳී මවු මෙහෙණ පුතු කෙරෙහි කළකිරි සිත දමනය කරගෙන පසුව අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ ධර්ම අවබෝධයෙන් විදසුන් වඩා උත්තරීතර රහත් ඵලයට පත්විය. ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ එම සිද්ධිය නිමිති කරගෙන "තමාට පිහිට තමාම බවත් තමා දමනය කළ තැනැත්තා අති දුර්ලභ අමා නිවනෙහි පිහිට ලබන බවත්' ධර්මානුකූල ව වදාළ සේක.

මේ සම්බුදු වදන වර්තමාන සමාජය දෙසට යොමු කිරීමේ දී බොහෝ පිරිස සිතන්නේ, මට බොහෝ පිරිස සිටිනවා. වස්තු සම්පත්, යාන වාහන මිල මුදල් තිබෙනවා. එය ස්ථිර ය. සදකාලික ය කියා කටයුතු කරනවා. මෙලොව ගැන, පරලොව ගැන සිතන්නේ කල්පනා කරන්නේ නැහැ. පින්, පව් ගැන සිතන්නේ නැහැ. තෘෂ්ණාව, ආසාව, ලෝභකම පසුපස හඹාගිය ආත්මාර්ථය ප්‍රධාන කොට ගෙනයි කටයුතු කරන්නේ. ක්‍රියා කරන්නේ. 'සිගිති' කාලයේ සිට යොවුන් විය දක්වා හදවතට හදවත මෙන් මධුර වූ මිතු දමින් කල් යවමින් කටයුතු කිරීමේ දී සිතනුයේ ඕනෑම දෙයකට පිරිසත්, හිත මිතුරනුත් සැමද සිටිනවා යනුවෙනි. සැමදම කායික, මානසික ශක්තිය, හැකියාව සම්පත් තිබෙනවා යනුවෙනි.

නමුත් ක්‍රම ක්‍රමයෙන් ශරීර දුබලතාවය පසිඳුරන්ගේ දුර්වලකම, දෙපා වාරු නැතිවීම, තමාට තමාගේ කාර්යයත් සිදුකර ගැනීමට අපොහොසත් වීම, දුර්වල වීමේ දී එද සිට හිත මිතුරන්ගේ වෙන්වීම ආදී මේ සියල්ල කෙමෙන් සිදුවෙන විට අසරණ දුගී දුප්පත් බවට පත් වෙනවා. අගහිගකම් ඇතිවෙනවා. ජීවිතයේ ළමා කාලය, තරුණ කාලය ගෙවී වයස් ගතවන විට ධාරණ ශක්තිය (මතක ශක්තිය) ඉන්ද්‍රියන්ගේ සජීවී බව අක්‍රියත්වයට ගොදුරු වෙනවා.

එවිට සිය ජීවිතයේ බොහෝ දුර ගෙවී ගොස් හමාර ය. ආපස්සට හැරී නැවත බලනවිට දුකක්, කනගාටුවක්, වේදනාවක් ඇති වෙයි. එවිට සියල්ල සිදු වී හමාර ය. මුල් කාලයේ සිටිය හිත මිතුරන් සියලු දෙනාම ඈත් වෙලා. නැවත එම අවස්ථාව සුන්දරයි කියූ ලෝකය ළංකර ගැනීමට බැරි ය. අපහසු ය. නමුත් පාප මිත්‍ර සේවනයක් ඇසුරු කරගෙන තිබුණා නම්, මුළු ජීවිතය ම සිහිකරන විට වේදනාවක්, දුකක්, කඳුලක් ලැබෙනවා. මෙලොව සතුටක් නැතිව පිරිහී ගියා වගේ ම, පරලොව දිවිය ද අපායගාමී දුක් සහිත තත්ත්වයකට උරුම වෙනවා. ආත්ම භව කෝටි ගණනක් සසර ගමනේ මොහොතක් පාසාම අනන්ත දුක් විඳවන්න සිදුවෙනවා. බෞද්ධ ලෝවැඩ සඟරාවෙහි එන ලෙස පාපය කරන කාලයෙහි ම මී පැණි මෙන් රසවත් ය.


එහි දුක් විඳින කල්හි ගිනිමෙන් දරුණු ය. එම පාපයන් දුරු කරන්නා වූ උපදේශය දැන ගෙන සිත, කය, වචනය යන ත්‍රිවිධ ද්වාරයෙන් පාපයට අවකාශ නොදිය යුතු ය.

මිනිසත් බව දුර්ලභ ය. පූර්වයේ මහා පුණ්‍ය විපාකයකට ලැබුණ මිනිසත් භාවය සර්ව සම්පූර්ණ කර ගැනීමට බුදු දහමෙහි දෙන සජීවී ජීවී ශක්තිය මහා බලවත් ය.

රහත් ඵලය ලැබූ කුමාර කස්සප තෙරණුවන් සහ මෙහෙණි මවු හමුවීමේ දී ඇති වූ සිද්ධිය කෙතරම් වේදනාකාරී කඳුළක් වුවත්, එය මවට නිවන දැකීමට දොර විවර කිරීමකි. ඔබ ජීවත් වන වයස් ප්‍රමාණයේ සිට තව වසර කීයක් මේ භවය තුළ ජීවත් වෙනවා ද? ඔබ සතු නිශ්චල, චංචල සියලුම සම්පත් ඇසුරු කළ හිතවත් ප්‍රජාව මොනදේ තිබුණ ද ඒ සියල්ල ම අතහැරී ගිලිහී යයි. සිත, කය, වචනය යන තිදොර සංවර කරගෙන, කායික මානසික දියුණුවක් ලබා ගැනීම, තමාට පිහිට තමා ම ය. බව මොහොතක් මොහොතක් පාසාම මෙනෙහි කිරීම දෙව්ලොවට ඉණිමගකි.



# උදායි මහරහතන් වහන්සේගේ උදානය



**අසිරිමත් ප්‍රඥාවකින් හෙබි අපගේ ශාස්තෘ වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන් හට ද ඒ ප්‍රඥාව බෙදා දුන් සේක. උන්වහන්සේලා ද ඒ සම්බුදු ප්‍රඥා මහිමයේ උපකාරයෙන් තම ප්‍රඥාව පුබුදුවා ගත්හ.**

> මහ පාර අයිනේ කැළි කසළ බහාලන මඩ වගුරේ නෙළුම් මලක් පිපෙනවා. ඒ පිපෙන නෙළුම හරිම ලස්සනයි. සුවඳ හමනවා. ඒ වගේමයි කුණු කසළ බඳු අදහස්වලින් පිරුණ, බාල පුහුදුන් ජනතාව වාසය කරන මේ ලෝකයේ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේ ප්‍රඥාවෙන් බබළනවා.

සාමාන්‍ය ලෝකයා සමඟ මිශ්‍ර නොවී සියල්ලට ම ඉහළින් සිටින්නට හැකිවූයේ ඒ ප්‍රඥා මහිමය නිසයි. බුදු සමිඳුන් ඒ බව පැහැදිලි කොට මෙසේ වදාළහ.

"මහ පාර අයිනේ කැළි කසල බහාලන මඩ වගුරේ නෙළුම් මලක් පිපෙනවා. ඒ පිපෙන නෙළුම හරිම ලස්සනයි. සුවඳ හමනවා. අන්න ඒ වගේමයි කුණු කසල බඳු අදහස්වලින් පිරුණ අඩබාල පුහුදුන් ජනතාව වාසය කරන මේ ලෝකය තුළම සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රාවකයන් වහන්සේ ප්‍රඥාව කරණකොට අතිශයින්ම බබළනවා."

බුද්ධ ශාසනයේ සාරය වන අරහත්ඵල විමුක්තිය ලබා පිරිනිවන් පා වදාළ ඒ මහෝත්තම රහතන් වහන්සේලාගේදිවි පෙවෙත අසිරිමත් ය. අපමණ වීර්යයකින් ,චිත්ත ධෛර්යකින්, ජීවිත පරිත්‍යාගයෙන් උන්වහන්සේලා ධර්මයේ හැසිරුණු ආකාරය පුදුම සහගත ය.

"සංඝං සරණං ගච්ඡාමි" යනුවෙන් අප සරණ යන ඒ ශ්‍රාවක සංඝරත්නය කෙ තරම් ශ්‍රේෂ්ඨ ද? මොනතරම් පිවිතුරු ද? කියා අපට වටහා ගැනීමට උතුම් රහතන් වහන්සේලාගේ උදානයන් මහෝපකාරී ය. උන්වහන්සේලා තුළ තිබූ විස්මිත අවබෝධයත්, ශාස්තෘ ගෞරවයත්, ප්‍රඥා මහිමයත්, අපමණ ගුණ සමුදායත් ඒ තුළින් මැනවින් ඉස්මතු වේ.

අද අප සිත පහදවා ගන්නේ උදායි නම් මහරහතන් වහන්සේ සිය නිකෙලෙස් හද මඩලින් ශාස්තෘන් වහන්සේගේ සම්බුදු ගුණ වර්ණනා කළ ආකාරය ගැනයි.

උදායි ස්වාමින් වහන්සේ ද අතීත බුද්ධ ශාසනවලදී තෙරුවන් කෙරෙහි සිත පහදවාගෙන ධර්මාවබෝධය පිණිස උපකාරි වන පින් රැස්කර ගත්තා.

අපගේ ශාස්තෘ වූ ගෞතම බුදුරජාණන් වහන්සේ පහළ වූ සමයේ කපිලවස්තු නුවර බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද උදායි යන නාමය ලැබුවා. බුදුරජාණන් වහන්සේ නිකෙලෙස් රහතුන් විසිදහසක් පරිවරාගෙන ඥාති සංග්‍රහය පිණිස කිඹුල්වත් නුවරට වැඩි ගමනේදී සම්බුදු අසිරිය දැක උතුම් පැවිදි බව ලබා ගත්තා. බලවත් සැදැහැ සිත් ඇති උදායි තෙරුන් සමථ – විදර්ශනා වඩා නොබෝ කලකින් උත්තම අරහත්වය සාක්ෂාත් කළසේක.

දිනක් භාග්‍යවතුන් වහන්සේ මහජනයා විසින් ප්‍රශංසා කරනු ලබන සියලු අලංකාරයෙන් යුතු සුදු ඇතෙකු අරමුණු කරගෙන දහම් කාරණා ඉස්මතු කරමින් නාගෝපම සූත්‍රය දේශනා කළ සේක. එම දේශනාව අවසානයෙහි උදායි තෙරණුවෝ තම ඥාණ බලයට අනුරූප ලෙස බුදුගුණ සිහිපත්කොට බුද්ධාලම්භන ප්‍රීතියෙන් පිනාගිය සිත් ඇති ව බුද්ධමහා හස්ති රාජයාගේ ගුණ ප්‍රකට කරන්නෙමියි සිතා මෙම ගාථා වදාළ සේක.

- "බෝසතාණන් වහන්සේ මිනිස් ලෝකයේ උපත ලැබුවා. තමා දමනය කර ගත්තා. සිත සමාධි කර ගත්තා. ඇවතුම් පැවතුම් ශ්‍රේෂ්ඨ කර ගත්තා. සිතේ සංසිඳීම ඇතිකර ගත්තා.
- ලෝකයේ තිබෙන හැම දෙයකින් ම එතෙර වුණා. ඒ බුදු හිමියන්ට මිනිසුන් වඳිනවා. දෙවියොත් වඳිනවා. මේ ගැන මම ඇසුවේ රහතන් වහන්සේලාගෙන්.
- හැම බන්ධනයකින් ම නිදහස් වුණා කෙලෙස් වනාන්තරයෙන් එළියට වැඩියා. කාමයන් අත හැර නිදහස් ජීවිතයකට ඇලුණා. බුදුරජාණන් වහන්සේ ගල් පර්වතයක් මුඳුනෙන් නිදහසේ බිම වැටෙන රත්තරන් ආභරණයක් වගේ.
- උන්වහන්සේ ඇත්තෙන් ම ලෝකයේ ඉන්න ලස්සන ම හස්තියා වාගෙයි. හැම පර්වතයක් ම පැරදවූ ලස්සන හිමාල පර්වතය වගෙයි. සියලු දෙනා අතර හස්තියෙක් වගෙයි. අතිශයින් ම ශ්‍රේෂ්ඨ යි. උන්වහන්සේට පැවසිය යුතු නම සත්‍යය යනුවෙන්.
- මම දැන් ඔබට ඒ සුන්දර හස්තිරාජයාණන් ගැන කියන්ටයි හදන්නේ. පව් කරන්නේ නැහැ. ඒ හස්තියාගේ ඉදිරි පාද දෙක තමයි සීලය යි, කරුණාව යි.
- ඒ හස්තියාණන්ගේ පසු පාද දෙක සිහියයි නුවණයි. ඒ ඇතාට ලස්සන හොඬවැලක් තිබෙනවා. එහි නම ශ්‍රද්ධාව. සුදෝ සුදු දළ දෙකක් තිබෙනවා. ඒ නම් උපේක්ෂාව යි.
- ඒ හස්තියාණන්ගේ ලස්සන ගෙල සත්‍යයි. පුළුල් හිස කියන්නේ ප්‍රඥාවටයි. මේ හස්තිරාජයාණන්ට තිබෙනවා නුවණින් විමසන ධර්ම චින්තාවන්. කුසල සද්ධර්මය යි. මේ හස්තිරාජයාණන්ට තිබෙනවා විවේකය නමැති වලිගයක්. තමා තුළ ඉතා හොඳින් සමාධිගත වූ සිතකුයි තිබෙන්නේ. සම්පූර්ණයෙන් ම සංසිඳිලයි ඉන්නේ. භාවනා කරනවා. ඒ හස්තිරාජයාණන් ඇවිදින්නේ එකඟ වූ සිතින්. හිටගෙන ඉන්නෙත් එකඟ වූ සිතින්. ඒ හස්තිරාජයාණන් නිදා ගන්නෙත් එකඟ වූ සිතින්. වාඩි වෙන්නෙත් එකඟ වූ සිතින්. හැම තැනකදී ම සංවරයි. මේ හස්තිරාජයාණන්ගේ සම්පත්තිය කියන්නේ ඒකට යි.
- මේ හස්තිරාජයාණන් ඉතා දැහැමිව ලැබෙන දේ පමණයි වළඳන්නේ. වැළඳීම පිණිස දැහැමි නොවන කිසිම දෙයක් ගන්නේ නැහැ. ආහාරපාන වස්ත්‍ර ආදිය ලැබුණ විට කවදාවත් ඒවා එකතු කරන්නේ නැහැ.ලොකු කුඩා හැම බන්ධනයක් ම නැති කරලයි ඉන්නේ. යම් තැනකට යනවානම් කිසිම අපේක්ෂාවක් නැතිවයි යන්නේ.
- වතුරේ හටගත්ත සුදු නෙළුම් පිපුණ විට හරිම ලස්සනයි. සුවඳ හමනවා. නමුත් ඒ මල් තිබෙන්නේ වතුර ගෑවි ගෑවී නොවෙයි.
- මිනිස් ලොව පහළ වූ බුදු සමිඳුන් අන්න ඒ ආකාරයට ම යි මේ ලෝකයේ වැඩ වසන්නේ. වතුර නො ගෑවෙන නෙළුම් මලක් වගේ. උන්වහන්සේ ගේ ජීවිතය සමඟ ලෝකයට අයිති කිසිදෙයක් ගෑවෙන්නේ නැහැ.
- ඇවිළෙන ගින්න නිවී යන්නේ තවදුරටත් ඇවිළෙන්නට දර නැති වූ විටයි. ඒ ගින්න නිවී ගිහින් අඟුරු මතු වුණාම ගින්න නිවුණා යැයි කියනවා.
- නිකෙලෙස් උතුමන් විසිනුයි මේ උපමාව කියා තිබෙන්නේ. රහත් මුනිවරු කියන්නේ මහා හස්තීන් වගේ. මාත් ඒ වගේම හස්තියෙක් තමයි. ඒ නිසයි බුදුරජාණන් වහන්සේ නමැති හස්ති රාජයාණන් මේ වගේ ලස්සනට හඳුනා ගත්තේ.
- බුදු හිමි තුළ රාගයක් නැහැ. ද්වේෂයකුත් නැහැ. මෝහයකුත් නැහැ. ආශ්‍රවත් නැහැ. ආශ්‍රව නැති නිසාම මේ සිරුර අතහරින විටම පිරිනිවී යනවා.

භාග්‍යවතුන් වහන්සේගේ ළය මඬලින් උපන් අරහත් ශ්‍රාවකයෙකු තම ශාස්තෘන් වහන්සේගේ ගුණ වැයූ අයුරු කෙ තරම් අපූරු ද? ඒ උතුම් මහරහතන් වහන්සේලාගේ ශාස්තෘ ගෞරවය කෙ තරම් අසිරිමත් ද?



පොල්ගහවෙල මහමෙව්නා භාවනා අසපු සංචිතයේ නිර්මාතෘ සහ අනුශාසක
**කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි**

ඒ රහතන් වහන්සේලා බොජ්ඣංග ධර්ම නම් වූ මාණික්‍ය රත්න හතෙන් යුක්තයි. සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිධ ශික්ෂාවෙහි හික්මිලයි වැඩ සිටින්නේ. සමාහිත් සිත් ඇති උන්වහන්සේලා අරහත් ඥානය උපදවාගෙන ශ්‍රේෂ්ඨත්වයට පත් වී වැඩ සිටිනවා. රහතන් වහන්සේලාගේ සිත් කැළඹෙන්නේ නැහැ. උන් වහන්සේලා ලෝකය සමඟ තැවැරෙන්නේ නැහැ. කයින් යහපත් වචන කතා කරන එබඳු නිකෙලෙස් මුනිවරයන්ගෙන් තමයි මේ පරිසරය පවා ලස්සන වෙන්නේ යැයි කියා වරක් භාග්‍යවතුන් වහන්සේ වදාළා. මානය නැති කළ, අකම්පිත සිත් ඇති ඒ නිකෙලෙස් රහතන් වහන්සේ දෙවියන්ට පවා ඉතා ප්‍රියයි. ලෝකයෙහි බුදුරජාණන් වහන්සේ උත්තරීතර යැයි උන්වහන්සේලා මේ අයුරින් සිංහනාද පවත්වනවා. රහතන් වහන්සේ නමක් ගැන අසන්නට ලැබීම පවා ඇත්තෙන්ම වාසනාවක්. ආශ්චර්යවත් මනුෂ්‍ය රත්නයක් වූ ඒ රහතන් වහන්සේලාගේ සුන්දර අදහස් උන්වහන්සේලාගේ උදාන තුළින් ඉගෙන ගන්නට ලැබීම ශ්‍රාවක අප ලත් භාග්‍යයක්. ඒ රහතන් වහන්සේලාගේ පරම පිවිතුරු හද මඩල ඔබ ඉදිරියේ විදහා දැක්වෙන මේ උතුම් උදාන කෙරෙහි පහන් සිත් ඇති කරගෙන ඔබත් මුළු හදවතින්ම තෙරුවන් සරණ යන්න. බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සඟරුවන ඒකාන්යෙන් ම සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න, සාමීචිපටිපන්න ගුණයන්ගෙන් යුක්ත සේක. ආහුනෙය්‍ය, පාහුනෙය්‍ය, දක්ඛිණෙය්‍ය, අංජලිකරණීය වන සේක. ලොවට උතුම් පින්කෙත වන සේක.

**නයනා නිල්මිණී**



# දැවෙන සිත් නිවන්නට සුමිතුරෙකි සාහිත්‍යය

> ලෝකයේ අඳුරත්, ආලෝකයත් එක් වූ හැම විටම එම අඳුර ආලෝකයට බියෙන් පැන යයි. අඳුරු කුටියකට පහනක් රැගෙන ගිය විට එහි අඳුර ආලෝකයේ කෙළවර දක්වා පැන යයි. අඳුරත්, ආලෝකයත් සටන් කොට ජයගත් අඳුරක් නැත.

**සත්වයාගේ සම්භවය කවදා කෙසේ සිදු වූවා දැයි පැහැදිලි නිගමනයකට එළඹීමට තවමත් ලොව කිසිවෙකුටවත් නොහැකි වී ඇත.**

ඒ කෙසේ වෙතත් මානවයින්ගේ ආරම්භයෙන් දීර්ඝ කාලයකට පසුව විවිධ තර්ක විතර්ක වාද විවාද මගින් ඔවුනොවුන්ගේ දාර්ශනික මතවාදවල සංවාදවෙමින් ඥාන ගවේෂණයට පෙළඹී ගිය අයුරු මානව ඉතිහාසයේ සටහන් වී ඇත. මෙමගින් සිදු වූයේ මානවයින් ලොව අනෙක් සියලු සත්වයින් අභිභවා මොළය සංවර්ධනය කර ගනිමින් ඥාන ගවේෂණයේ පෙර ගමන් කරුවන් බවට පත් වීමයි. මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් පමණක් මිනිසා සම්පූර්ණත්වයට පත් නොවන බවට තේරුම් ගත් බවක් වැටහී යන්නේ මානසික සුවයක් බලාපොරොත්තුවෙන් ආගම දහම තම සමීපතමයින් ලෙස සලකා කටයුතු කිරීමට නැඹුරු වීමෙන් ය. ආගම දහම මෙන්ම මානව සිතට මෙකී සහනසීලී ආස්වාදයක් ලබාදෙන අනෙක් සුවිශේෂී අංගය වන්නේ සාහිත්‍යයි. සාහිත්‍ය සේවනයට යමෙක් මෙහෙයවනු ලබන්නේ ඔහු තුළ උපන් අසීමිත මානව දයාවයි. එහෙයින් ම සාහිත්‍යකරුවා සොඳුරු හිතවතෙකි.

සාහිත්‍ය යනු සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාවට රැගෙන යාමය යන්න සාහිත්‍ය විෂය ක්ෂේත්‍රය කෙරෙහි දැක්විය හැකි පරිපූර්ණ එක් නිර්වචනයෙකි. අනුරාධපුර යුගයෙන් පටන්ගත් සිංහල සාහිත්‍ය වංශ කතාව පෝෂණය වූයේ බෞද්ධ දර්ශනය මුල් කොට ගෙන බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ. එකී සාහිත්‍ය හෙළ යන්ගේ ගමන් මග යහපත් ව ධාර්මික ව ඉදිරියට පවත්වා ගෙන යාමට මහඟු පිටුබලයක් සපයා ඇත. මෙහි දී අපගේ ව්‍යායාමය වන්නේ සිංහල සාහිත්‍ය තුළ අනර්ඝ නිර්මාණයක් වන පොළොන්නරු යුගයේ විද්‍යාචක්‍රවර්තීන් විසින් රචිත බුත්සරණ නම් කෘතියෙහි සමුදයාර්ථය විමසා බැලීමයි. බුදුන්වහන්සේ නාලාගිරි ඇතා දමනය කිරීම නිරූපණය කළ අවස්ථාව ලොව සමස්ත මානවයින්ට ම විශිෂ්ටතම පාඩමක් කියා දෙයි. එම අවස්ථාව නිරූපණය කළ අයුරු මෙසේ ය.

“ඇතැ ධූලීන් වැසීගිය ඇත්රජ යැ, මැතැ සවණක් ඝන බුදු රසින් සැදී ගිය බුදුරජාණෝ යැ; ඇතැ කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජ යැ, මැත කරුණායෙන් තෙත් වැ ගිය නිල් මහනෙල් පෙති පරයන ඇස් ඇති බුදුරජාණෝ යැ; ඇතැ එබූ එබූ පයින් මහ පොළොව පළාපියන්නා සේ දිවන ඇත් රජ යැ, මැතැ එබූ එබූ පයින් මිහි කත සනහ සනහා වඩනා බුදුරජාණෝ යැ; ඇතැ බැලූ බැලූවන් ‘අනේ! අනේ!’ යි කියවන ඇත් රජ යැ, මැතැ බැලූ බැලූවන් ‘සාධු! සාධු!’ යි කියවන බුදුරජාණෝයැ. එවේලෙහි එ ඇතු ළං වත් වත් සැදැහැත්තෝ ලෙහි අත් ගසන්නට වන්හ, මුහුණෑ අත් දෙන්නට වන්හ, බලා සිටියැ නො හෙම්හ’යි මුහුණින් හෙන්නට වන්හ”

රා කළ දාසයක් පානය කළ නාලාගිරි ඇතු පවුරු පදනම් බිඳගෙන දූවිලි ද අවුස්සමින් මහපොළව දෙදරවමින් ඉදිරියට දිව ඒම අතිශයින් ම චිත්තරූප මවන්නකි. කෝපයෙන් රත්පැහැ ගැන්වුණ යවට මෙන් ඇස් ඇති ඇතුගේ දර්ශනය කාගෙත් සිත්වල බිය උපදවන්නකි. මෙහි දී චක්‍රවර්ති ඇතා මුල් කොට ගෙන තම සදාදරණීය ශ්‍රාවක මනසේ පියවරෙන් පියවර ලෝකයේ බිහිසුණු බව ජනිත කරවයි. රළු ගොරෝසු අමිහිරි තිත්ත මනෝභාවයන් ඇතා මුල්කොට ගත් මේ නිර්මාණය මගින් ශ්‍රාවක මනසේ ලොව බිහිසුණු ගොඩගැසී ඇත.

නාලාගිරි ඇතු හා බුදුන්වහන්සේ හමුවේ දී බුද්ධ චරිතය නිරූපණය කළ අයුරු අතිශයෙන් ම ප්‍රශංසනීයයි. සවනක් රැස් විහිදවමින් වඩින උන්වහස්සේගේ ශ්‍රීපාදවලින් මහී කාන්තාව සනසමින් නිල්මහනෙල් පෙති පරයන ජනක්‍රාන්ත දෙනෙත්වලින් බබළන මුව කමල ශ්‍රාවකයින්ගේ මනසේ නිවුණ සැනහුණ සුන්දර මාවනවාදී හැඟීම් ජනිත කිරීමට සමත් වී ඇත.

බුත්සරණ කර්තෘ විද්‍යාචක්‍රවර්ති එම අවස්ථාව නිරූපණය කර ඇත්තේ සහෘදයා ආනන්දයෙන් ප්‍රඥාවට රැගෙන යාමේ අරමුණින් බව ඉතා පැහැදිලි ය. ආන්නදය යනු සතුටයි. මෙහි දී එකී සතුට ඇති කරන්නේ කතුවරයා භාවිත භාෂාව විරිත උපමා රූපක කාව්‍යාලංකාර ආදී කාව්‍යෝක්ති මගිනි. සහෘද මනසේ සාහිත්‍ය මගින් එකී ආනන්දය ඇති කොට අනතුරුව රැගෙන යන්නේ ප්‍රඥාව කරා ය. මෙහිදී ප්‍රඥාව යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න ගැඹුරින් විමසා බැලිය යුතු ය. එනම් යම් සාහිත්‍ය මාර්ගයක් මගින් කිසියම් සමාජ යථාර්ථයක් පාඨකයින්ට අවබෝධ කරවීමට සමත් වීම ප්‍රඥාවයි. එසේම, එකී සාහිත්‍ය කෘතිය



කැලණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අංශයේ අංශාධිපති
පෑලියගොඩ විද්‍යාලංකාර පිරුවන්හි
ආචාර්ය
**ආචාර්ය මල්වානේ චන්දරතන හිමි**

පාඨකයින්ගේ ඉමහත් ගෞරවයට පාත්‍ර වන සර්වකාලීන කෘතියක් වේ. බුත්සරණ සාහිත්‍ය කෘතියේ යථෝක්ත නාලාගිරි දමන අවස්ථාව මගින් පාඨකයා වෙත සමීප කරනු ලබන ජීවිතාවබෝධය කෙරෙහි මෙහිලා විශේෂ අවධානය යොමුවිය යුතු ය. ලෝකයේ ගින්දර බිහිසුණු ය. එය චණ්ඩ පරුෂ රළු ස්වභාවයෙන් යුක්ත ය. ගින්දර වෙත සමීප වන සෑම දෙයක්ම අළු බවට පත් කොට විනාශ කොට දමයි. සියලු සත්වයෝ ද ගින්දරට අතිශයන් ම බිය වන්නාහ.

එසේ වුව ද එකී චණ්ඩ පරුෂ බිහිසුණු ගින්දර සීතල ජලය හමුවේ පරාජයට පත්වේ. සීතල ජලයත් සමග සටන් කොට ජයගත් ගින්දරක් ලෝකයේ නැත. හැම විටම ජය ගන්නේ බිහිසුණු ගින්දර පරාජය කරන සීතල ජලයයි. මෙය විශ්වයටම පොදු සාධාරණ ධර්මතාවයකි. ලෝකයේ අඳුරත් ආලෝකයත් එක් වූ හැම විටම එම අඳුර ආලෝකයට බියෙන් පැන යයි. අඳුරු කුටියකට පහනක් රැගෙන ගිය විට එහි අඳුර ආලෝකයේ කෙළවර දක්වා පැන යයි. අඳුරත් ආලෝකයත් සටන් කොට ජයගත් අඳුරක් නැත. ජය ගන්නේ ආලෝකයයි. එම නිසා අඳුර ගමන් කරන්නේ ආලෝකයට පසු පසිනි.

බුත්සරණ කතුවරයා ස්වකීය නිර්මාණයේ දී එම අවස්ථාව නිරූපණය කරන්නේ මානව සිත්තුළ ජනිතවන වෛරය ක්‍රෝධය තරහව ආදි චෛතසිකවල බිසිසුණු බව කරුණාව මෛත්‍රිය ආදි මානව දයාවේ සීතල වතුරෙන් තෙමා නිවිය හැකි බවයි. බුත්සරණ කතුවරයා ස්වකීය සහෘදයිනට මෙම අවස්ථා නිරූපණයෙන් ආරාධනා කරන්නේ වෛරයේ ගිනිදැල් මෛත්‍රියේ සීතල වතුරෙන් නිවා දැමීමට ඉඩසලසා දෙන ලෙසයි. එවිට මේ මුළු මහත් ලෝකයම ගිනිනිවී සුවපත් වන බව කතුවරයා මෙයින් ද්වනිත කරවයි.

වර්තමාන අප ජීවත් වෙන ලෝකය අතිශයින් ම විවිධ ය, විෂම ය, සමාචාරවලට වඩා විශමාචාරවලින් යුක්ත ය. මම කැමති දේට ඔබ අකමැති ය. ඔබ කැමති දේට මම ද අකමැති ය. මාගේ කැමැත්තට ඔබ අකමැති වන විට මම ඔබට විරුද්ධ වෙමි. ඔබගේ කැමැත්තට මා අකමැති වන විට ඔබ මට ද විරුද්ධ වන බව මම දනිමි.

ලෝකයේ දෙපිරිසකට එකම මතයකට සමීපවීමට නොහැකි වීම නිසා ප්‍රශ්නකාරී, ගැටලුකාරී නොනවතින ගැටලුවකට මුළු ලෝකයම හසු වී ඇත. එවන් ලෝකයක් සුවපත් කිරීමට ආගම දහම මෙන්ම සාහිත්‍යකරුවා දැඩි උත්සාහයක් දරා ඇත. එම සාහිත්‍ය හිතවත් ව පරිශීලනය කිරීම සුන්දර ලෝකයක් බලා පොරොත්තු වන අප කාගේත් යුතුකමකි. සීතල ජලයෙන් බිහිසුණු ගින්දර නිවා දමන්නාක් මෙන් වෛරයේ ගිනිදැල් නිවා දැමීමට අප වග බලා ගත යුතු ය. බුදුන් වහස්සේගේ අපරිමිත කරුණාව ඉදිරියේ ලෝකයේ දැවැන්තම සතා වන නාලාගිරි ඇතු දණ නමන්නේ ද මෙම සමුදයාර්ථය ලෝකයාට පසක් කරමිනි.



# ආර්ථික දියුණුවට කර්මය බලපානවා ද?

**ඓතිහාසික දිවාගුහාව රජමහා විහාරාධිපති ගෞරව ශාස්ත්‍රවේදී**
**රාස්සගල චන්දකිත්ති හිමි**

**දෛනික ජීවිතය තුළ පුද්ගලයා ස්වකීය ආර්ථිකය සමෘද්ධිමත් කරගැනීමට විවිධ වූ වෘත්තීන්**

තුළ නියැළෙන බව අපි දනිමු. සියලු ජීවිකාවන් සිදුකිරීමට අවශ්‍ය වන්නේ උත්සාහය, කැපවීම හා අවංකභාවය යි. එනිසා ධර්මික සීමාවක් තුළ කැපවීමෙන් උපයන ධනය ගෘහස්ථ ජීවිතයට සැපයකි. එමෙන් ම ආලෝකයකි.

මෙලොව දී යමක් ලැබීමට නම්, අප සසර පුරාවට පිරූ දාන පාරමිතා ඇත්තේ විය යුතු ය.

මජ්ඣිධිමනිකාය චූල්ලකම්මවිභංග සූත්‍රයේ දී සුභ මානවකා විමසා සිටින්නේ ද එය යි. ඔහු විමසන පරිදි "භාග්‍යවතුන් වහන්ස, මෙලොව පුද්ගලයෙකු ධනවත් වීමට හා දිළිඳු වීමට හේතු කවරේ ද?" යන්නයි. එවිට භාග්‍යවතුන් වහන්සේගේ පිළිතුර වූයේ, "මානවකය, පෙර භවයන්හි දී දන් දීම හා දන් නොදීම කරණකොටගෙන පුද්ගලයා ධනවත් වීම හා ධනවත් නො වීම සිදු වන බවයි." මෙයින් අපට පැහැදිලි වන්නේ අතීත කර්මයේ බලපෑම ද එක් හේතුවක් කොට ගෙන පුද්ගල ජීවිතයේ සාර්ථකත්වය හා අසාර්ථකත්වය රඳා පවතින බවයි.

දිනක් සැරියුත් තෙරුන් තථාගතයන් වහන්සේ වෙත පැමිණ, එකත් පසෙක හිඳ මෙවැනි ප්‍රශ්න හතරක් විමසයි. මෙම ධර්ම විග්‍රහයට පාදක වී ඇත්තේ ද ඉහතින් සඳහන් කර ඇති අංගුත්තර නිකායේ වණිජ්ජා සූත්‍රය යි. එම කරුණු හතර කුමන කාලයක වුවත් වෙළෙඳම හා සම්බන්ධ කර ගත හැකි වැදගත් සාධක කිහිපයකි. සැරියුත් හිමියන් විමසන පරිදි,

"භාග්‍යවතුන් වහන්ස, ඇතැම් වෙළෙඳ ව්‍යාපාර ආරම්භ කර වැඩි කලක් නො ගොස් විනාශ වෙයි. එයට හේතුව කුමක් ද?"

පිළිතුරු වදාළ භාග්‍යවත්හු මෙසේ වදාළහ."

සාරිපුත්‍රය, ඇතැම් පුද්ගලයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත ගොස් ඔබවහන්සේලාට අවශ්‍ය

මොනවා දැයි විමසන නමුත්, එය අමතක කර ඒ දේවල් ගෙනත් නො දෙයි. මෙම අකුසලය හේතු කොට ගෙන ව්‍යාපාර මෙලෙස විනාශ වන බව දෙසූහ."

දෙවනුව මෙසේ ද විමසයි.

"භාග්‍යවතුන් වහන්ස, ඇතැම් වෙළෙඳ ව්‍යාපාර ඔවුන් අපේක්ෂා කරන තරමට දියුණු තත්ත්වයට පත් නො වී විනාශ වී යයි. එයට හේතුව කුමක් ද?" "සාරිපුත්‍රය, එයට හේතු වන්නේ, ඇතැම් පුද්ගලයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත ගොස් ඔබ වහන්සේලාට අවශ්‍ය මොනවා දැයි විමසන නමුත්, ශ්‍රමණ බ්‍රාහ්මණයින් බලාපොරොත්තු වන තරමට ඉල්ලූ දේවල් ගෙනත් නො දෙයි. ඒ හේතුවෙන් කර්මානුරූපී ව එම ආත්මයෙන් චුතව මිනිසත් බව ලබා ආරම්භ කරන වෙළඳ ව්‍යාපාර සිතූ තරම් සාර්ථකත්වය කරා නො යයි. හේතුව වන්නේ ඉහතින් දැක් වූ අයහපත් ක්‍රියාවයි. වචනයේ විශ්වාසය නො රැකීම, මුසා බස් තෙපළීම වැනි පාප ක්‍රියාවන් මෙයට මුල් වෙයි.

තෙවනුව සැරියුත් තෙරණුවෝ මෙසේ විමසති.

"භාග්‍යවතුන් වහන්ස, ඇතැම් වෙළෙඳ ව්‍යාපාර ආරම්භ කොට, කාලයාගේ ඇවෑමෙන් ඔවුන් අපේක්ෂා කරන තරමට ම දියුණු තත්ත්වයට පත්වෙයි. එයට හේතුව කුමක් ද?" භාග්‍යවතුන් වහන්සේ වදාරන්නේ, "සාරිපුත්‍රය, ඇතැම් පුද්ගලයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත ගොස් ඔබ වහන්සේලාට අවශ්‍ය මොනවා දැයි විමසා, අනතුරුව ශ්‍රමණ බ්‍රාහ්මණයන් බලාපොරොත්තු වන අයුරින් ම අවශ්‍ය සියලු දේ ගෙනවිත් දෙයි. විශ්වාසවන්ත භාවය රැකීම, කර්ම ඵල පිළිගැනීමේ නුවණින් ක්‍රියා කිරීම වැනි සාධු ක්‍රියාවන් නිසා එලෙස ප්‍රතිවිපාක ගෙන දෙන බව බුදුහු දෙසූහ." අවසානයේ ශාරිපුත්‍රයන් වහන්සේ මෙවැනි ප්‍රශ්නයක් විමසයි.

"භාග්‍යවතුන් වහන්ස, ඇතැම් වෙළඳ ව්‍යාපාර ආරම්භ කොට, කාලයාගේ ඇවෑමෙන් ඔවුන් අපේක්ෂා කරන තරමට වඩා වැඩි සිය දහස් ගුණයකින් වෙළඳ ව්‍යාපාර ඉතා සීඝ්‍රයෙන් දියුණුව කර ගමන් කරයි. භාග්‍යවතුන් වහන්ස, එයට හේතුව කුමක් ද?" යන්න යි. "සාරිපුත්‍රය, ඇතැම් පුද්ගලයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් වෙත ගොස් ඔබවහන්සේලාට අවශ්‍ය මොනවා දැයි විමසා, අනතුරුව ශ්‍රමණ බ්‍රාහ්මණයන් බලාපොරොත්තු වන තරමටත් වඩා වැඩියෙන් අවශ්‍ය දෑ සපයයි. මේ හේතුව කරන කොට ගෙන එම ආත්ම භවයෙන් චුත ව මිනිස් ආත්මයේ නැවත ප්‍රතිසන්ධිය ලබන එම පුද්ගලයා ධන ධාන්‍යයෙන් ආඪ්‍ය වූ ඉතා සැපවත් ජීවිත ලබන්නන් බවට පත් වෙයි.

මෙවැනි විවිධ වෙළෙඳ ව්‍යාපාර මට්ටමේ මිනිසුන් අපට සමාජය තුළ සුලභව හමුවෙති. ඉතා අපහසුවෙන් ආරම්භ කළ කුඩා වෙළෙඳ ව්‍යාපාර අද වන විට මිනිසුන් ලක්ෂ ගණනකගේ ජීවන අරගලයට ශක්තිය සපයන ආයතන බවට පත්ව ඇත. එමෙන් ම ඇතැම් ව්‍යාපාර කෝටි ගණන් වියදම් කර ආරම්භ කළත්, ව්‍යාපාර බිඳ වැටී යෙදවූ මුදලවත් ආපසු ගැනීමට නො හැකිව අන්ත අසරණ දුගී භාවයට පත්ව ද ඇත.

> ධාර්මික ආර්ථික රටාවක් අනුව පුද්ගලයාගේ ජීවිතය ගොඩනැගී තිබීම ලෞකික හා ආධ්‍යාත්මික සංවර්ධනයට නිරන්තරයෙන් ඉවහල් වේ. ගෘහස්ථ ආර්ය ශ්‍රාවකයාට තමාගේ ආර්ථිකය සමෘද්ධිමත් වන තරමට නිරවුල් මානසිකත්වයකින් ජීවන ගමන සම්බාධක රහිත ව ඉදිරියට යා හැකි ය.

පුද්ගලයාගේ කර්ම ශක්තියේ බලපෑම එතරම්ම බලවත් බව අපට මෙම සූත්‍ර විවරණයෙන් මැනවින් පැහැදිලි වේ. එම නිසා වෙළෙඳ ව්‍යාපාර සිදු කිරීමේ දී වීර්යවන්ත වෙමින්, විශ්වාසය ගොඩනැගෙන පරිදි කටයුතු කරමින්, හැකි සෑම අවස්ථාවකම කර්ම ඵල පිළිගැනීමේ විශ්වාසය ඇතිව, සැමට සෑම විටම තමාට හැකි පරිදි උපකාර කරමින්, ධාර්මික පදනමක් මත පිහිටමින් ක්‍රියා කිරීමට සිත යොමු කළ යුතු ය. වෙළෙඳ ව්‍යාපාර සාර්ථක කර ගත හැක්කේ එවිට ය. තථාගත සම්බුද්ධ දේශනාව තුළ ලෝකයට විවරණය කරන ධර්ම පිළිවෙත ද එයයි.

ධාර්මික ආර්ථික රටාවක් අනුව පුද්ගලයාගේ ජීවිතය ගොඩනැගී තිබීම ලෞකික හා ආධ්‍යාත්මික සංවර්ධනයට නිරන්තරයෙන් ඉවහල් වේ. ගෘහස්ථ ආර්ය ශ්‍රාවකයාට තමාගේ ආර්ථිකය සමෘද්ධිමත් වන තරමට නිරවුල් මානසිකත්වයකින් ජීවන ගමන සම්බාධක රහිතව ඉදිරියට යා හැකි ය. එම පිළිවෙත ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ දී සම්මා ආජීවය ලෙස ද දක්වා ඇත.



## ධම්මපදයෙන්

චක්ඛුනා සංවරො සාධු
සාධු සොතෙන සංවරො
ඝාණෙන සංවරො සාධු
සාධු ජිව්හාය සංවරො

**ධම්මපදය**

ඇසින් සංවර වීම යහපති.
කනින් සංවරවීම යහපති.
නාසයෙන් සංවර වීම යහපති.
දිවෙන් සංවරවීම යහපති.



# මහා බල දෙන මෝර පිරිත

**අපේ බුදුරජාණන් වහන්සේ ඉහත ආත්ම භාවයක රණ මොනරෙකු ලෙස උපත ලැබුවා. දිගු කලක් ජීවත් වීම සඳහා තමන් භාවිත කළේ මෝර පිරිත යි.**

රණ මොනරා දිනපතාම වන්දනාවක් කරනවා. 'ඇස් ඇති ඒකරාජ වූ, රන්වන් පැහැයෙන් පොළෝ තලය බබළවන්නා වූ සූර්යයා උදා වෙනවා. එලෙස ස්වර්ණ වර්ණව පොළොව බබළවන්නා වූ සූර්යයාට වන්දනා කරමි. ඔබ විසින් මට අද ආරක්ෂාව සලසා දෙන්නැ'යි ඉල්ලීමක් කරනවා. එය සාමාන්‍ය දෙයක්. උතුම් දේ වන්නේ මහ රහතන් වහන්සේ නමක් සියලු දැනගත යුතු ධර්මයන් දැනගත්තේ නම්, ඒ බුදුරජාණන් වහන්සේට මම නමස්කාර කරමි. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ආරක්ෂාව මට ලැබේවා, අතීත බුදුරජාණන් වහන්සේලාට මාගේ නමස්කාරය වේවා.උන්වහන්සේලාගේ සෝවාන්, සකෘදාගාමී, අර්හත් මාර්ග ඵලයන්ට මාගේ නමස්කාරය වේවා. අරහත් ඵල විමුක්තීන්ට මාගේ නමස්කාරය වේවා. නිවනට පත් වුණා වූ අතීත බුදුවරයාණන් වහන්සේලා හට ද මාගේ නමස්කාරය වේවා, උන්වහන්සේලා තදංග විමුක්ති, විශ්කම්භන විමුක්ති, පංච විමුක්තීන්ට පත් වුණා, ඒ පංච විමුක්තීන්ටත් මාගේ නමස්කාරය වේවා, යනුවෙන් රණ මොනරා පිරිත සජ්ඣායනා කර දවසේ තනිව හැසිරෙනවා. එවිට මොනම දෙයකින්වත් කරදර බාධක නැහැ.

මෝර පිරිතේ රාත්‍රියට කියන කොටස සජ්ඣායනා කළොත්, රෑ පහන්වන තුරු ම ආරක්ෂාව පවතිනවා. මෙලෙස රණ මොනරා එය උදයටත්, සවසටත් කියන නිසා කරදර බාධා නැතිව ජීවත් වන්නට පුළුවන් වුණා. කිසිම දෙයකින් කරදර, පීඩා වුණේ නැහැ. බොහොම දර්ශනීය ව රන්වන් පැහැති වර්ණයෙන් බබළන නිසා රණ මොනරා යනුවෙන් සඳහන් කළා. බොහොම පිනැති, ගුණැති, වාසනාවන්ත සතෙක්. වනාන්තරයේ තනිව ම සැරි සරන මේ රණ මොනරා දුටු වැද්දෙකු රණ මොනරා අල්ලා ගන්නට වෙහෙස ගත්තත් එය අසීරු වූ නිසා රජතුමාට දැනුම් දුන්නා.

පසුව තවත් සෙබඩක් ගෙන ඒ අසලට පැමිණි මේ රණ මොනරා දැලකින් දවටා ගත්තා. එදා මේ මන්ත්‍රය සිහි නොකළ රණ මොනරා වැද්දාගේ දැලට අසු වුණා. එතැන දී මොනරා මෙලෙස පැවසුවා. 'මා ආරක්ෂක මන්ත්‍රය භාවිත කරන තාක් මට කරදරයක් වුණේ නැහැ. එදා මට මෙය කියන්නට නොහැකි වුණ නිසා සතුරාගේ ග්‍රහණයට ලක් වුණා යනුවෙන් පැවසුවා'

මෙලෙස ඔබ අප සැමටම උතුම් මන්ත්‍රයක් තිබෙනවා. බුද්ධ, ධම්ම, සංඝ රත්නත්‍රය. මෙයට වඩා ඉහළ රත්නයක් ලොවේ නැහැ. යන එන විටදී ද බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ සජ්ඣායනා කරන්න පුරුදු වන්න. එවිට අපේ ආරක්ෂාව, යහපත හොඳින් තිබෙනවා.

අද කොරෝනා වසංගතයෙන් ලෝකය බිලිගත් මොහොතක අපට සැනසුම ඇත්තේ තුනුරුවන්ගේ බලය සහ ශක්තිය නිස යි. රණ මොනරාට ආරක්ෂාව ලැබුණේ තුනුරුවන් සතු ගුණය නිස යි. එහෙමනම්, තුනුරුවන් සතු ගුණය හැර වෙන සරණක්, පිහිටක් අපට නැහැ. ඒ පාඨ තුනේ ගුණ විසි හතරක් තිබෙනවා. ඒ නිසා 'සූවිසි ගුණ' යනුවෙන් සඳහන් කරනවා. ලොවුතුරා බුදුරජාණන් වහන්සේගේ ගුණ නවයක්, නව ලොවුතුරා ධර්මයේ ගුණ හයක්, ආර්ය මහා සංඝරත්නයේ ගුණ නවයක්, ඉතිපි සෝ, ස්වාක්ඛාත, සුපටිපන්න වගන්ති තුන තරම් බලවත් තවත් දේශනාවක් ලොවේ කොහේවත් ම නැහැ.



අම්බලන්ගොඩ, කහව ගල්දූව ආරණ්‍ය සේනාසනයේ කම්මට්ඨානාචාර්ය ත්‍රිපිටකාචාර්ය, ත්‍රිපිටක විශාරද

**කහගොල්ලේ සෝමවංශ හිමි**

රතන සූත්‍රයේ තිබෙන්නේ ම බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ පමණ යි. ඒ නිස යි, රතන සූත්‍රයේ මහත් බලයක් තිබෙන්නේ. අක්ෂර දහක් පමණ තිබෙනවා. එක අකුරක තිබෙන ශක්තිය බලය සීමාවක් නැහැ. ඒ නිසා කවුරුත් තම රැකවරණය හොඳින් සකසා ගෙන ආරක්ෂාව සකසා ගන්න. රතන සූත්‍රය සජ්ඣායනා කරන විට මෝර පිරිත ද පරිශීලනය කරන්න. එය පිරිත් පොතේ සඳහන් ව තිබෙනවා.

මේ පිරිත අපට හොඳ පාඩමක්. මොකද? තිරිසන් සතෙක් ව වාසය කළ මොනරා කෙතරම් බලවත් ද? එසේනම්, අපට එහි ලොකු ශක්තියක් ලැබෙනවා. ඒ නිසා කවුරුත් තණ්හාවෙන්, තරහවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් නොසිට මෙවැනි පිරිත් පරිහරණය කරන්න. දවසට පිරිත් සූත්‍ර පහ හයක්වත් සජ්ඣායනා කරන්න. මෙයින් අපට පුදුම ආරක්ෂාවක් ලැබෙනවා. ලෝකයටම සෙත් පතන්න. මේ සෙත් පැතිය යුතු කාලය යි. ආශිර්වාද කළ යුතු යි. මෙහි බලය ලොවට පෙන්වා දිය යුතු යි. එය යි වැදගත් ම කාරණය.

බලන්න, රණ මොනරා සිටි යුගයේ තුනුරුවන් තිබුණා ද? නැහැ. එතුමා අතීත, අනාගත බුදුවරයාණන් වහන්සේලාට, මහ රහතන් වහන්සේලාට, සෝවාන්, සකෘදාගාමී, අනාගාමී උතුමන්ට වන්දනා කළා. ඒ වගේම අරහත් ඵල විමුක්තියට වන්දනා කළා. නිර්වාණයට වන්දනා කළා. බලන්න, වන්දනාව සුළු පටු වන්දනාවක් ද යනුවෙන්?

බුදුරජාණන් වහන්සේ වැඩ සිටින කාලයේ එක්තරා ළමයෙකුගේ පාදයක් යක්ෂ යකු ඇද ගත් මොහොතේ 'නමෝ බුද්ධාය' යනුවෙන් පවසා ඒ දරුවාට උතුම් රැකවරණය ලැබුණා.

අවසානයේ විශාල ධනයක් ලබන්නට හිමි කාරණයක් වුණා. එසේනම් සූවිසි ගුණයම කියන විට කෙතරම් බලවත් පිනක් ලැබෙයි ද? දවසක් අනාථ පිණ්ඩික සිටුතුමා ප්‍රථමයෙන් බුදුරජාණන් වහන්සේ දකින්න යන ගමනේ දී දිව්‍ය රාජයෙක් මෙලෙස පැවසුවා. 'සිටුවරය, ආපසු එන්නට එපා. ඉදිරියට යන්න. ඔබ බලාපොරොත්තු වන ජය සංකේතය ඉදිරියේ තිබෙනවා. ඔබ තබන පියවරක වැදගත්කම මා මෙලෙස කියන්නම්. 'ලෝකයේ මහා ධනවතෙක්, ඇතුන් සියයක්, අශ්වයන් සියයක්, ගවයන්, කිරිදෙනුන් සියයක්, රන් රුවන් පැළැඳි යුවතියන් සියයක්, මෙලෙස සෑම දෙයකින් ම සියය බැගින් පරිත්‍යාග කරනවා. ඒ පිනට වඩා ඔබ බුදුන් දක්නයි මේ යන්නේ. ඒ සඳහා තබන එක පියවරක් මේ සෑම දෙයකට ම වඩා වටිනා බව පැවසුවා. එය සොළොස් කලාවකට බෙදුවත්, එක වටයක් ඔබ තබන පියවර වටිනා බව පැවසුවා.

එහෙමනම්, මහා වස්තු පූජාවට වඩා තුනුරුවන් දකින්න යන එක් පියවරක් වටිනවා. පියවර සියයක් තැබුවොත් කොහොම පිනක් ලැබෙයි ද? ඒ නිසා තම රැකවරණය හොඳින් හදා ගන්න. ඒ සඳහා ම තුනුරුවන් හොඳින් අපට ලැබී තිබෙනවා. නැවත තුනුරුවන් ලැබෙයි යනුවෙන් කිසිවෙක් සිතන්න එපා. තුනුරුවන්ගේ ආශිර්වාදය සෑම දම, හැම තැනකම නැහැ. අපේ පිනට, අපේ වාසනාවට, බුද්ධ, ධම්ම, සංඝ රත්නත්‍රය ලැබුණා.

තින්දෙන් පිබිදුණු විගස 'බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි', යනුවෙන් තුනුරුවන් සරණ යන්න. රණ මොනරා ද කළේ මේ ටිකම යි. රණ මොනරාට දිගු ආයුෂ, ආරක්ෂාව ලැබුණා. පිහිට, රැකවරණය ලැබුණා. තනිවම ජීවත් වුණා. එහෙමනම්, අප තනිවම පැමිණියා. තනිවම ජීවත්ව තනිවම මරණයට යනවා. එසේනම්, සිතට අවංකව කටයුතු කරන්න, සොරකම, වංචාව, සත්ත්ව ඝාතනය දුරු කර දමා, වාසනාවන්තයෙක් ලෙස ජීවිකාව ගෙන යන්න. පෝයට අටසිල් ගන්න. ගෙදර දොරත් පිනට දහමට ලැදි පිරිසක් සමඟ කටයුතු කරන්න. හැකිතාක් යමක් දන් දෙන්න. බුද්ධ පූජාව ශ්‍රද්ධවෙන්, ගෞරවයෙන්, ඕනෑකමෙන් සිදු කර ගන්න. නැවත බුද්ධ ශාසනයක්, මනුෂ්‍යයෙක් වෙයි ද යනුවෙන් අපට සිතන්නට බැහැ. ඒ නිසා ජීවත්වන ටික කාලය පුරාවට ම බුදු දහමට ලැදිව කටයුතු කිරීම කෙතරම් වටිනවා ද? අපට සරණ පිහිට මෙපමණ යි. මරණයේ දී සිහි විය යුතු දෙයක් ඕනෑ.

දාන, ශීල, භාවනා වශයෙන් කොටස් තුනකට බෙදා දක්වා තිබෙනවා. ඒවායෙන් ලැබෙන ප්‍රතිවිපාක පහදා දුන්නා. මනු ලොව, දෙව් ලොව, බඹ ලොව උපදින්න පුළුවන්. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී,අර්හත් යන මාර්ග ඵල ලබන්නට පුළුවන්. බුදුන් වහන්සේගේ සරණ පිහිට හොඳින් ලැබී තිබෙන බව තප්පරයක් ගානෙම සිතන විට, ලොකු බලයක් ලැබෙනවා. දවස පුරාම සූවිසි ගුණය මෙනෙහි කර එහි බලය කෙතරම් ද බලන්න. පෝයට සිල් ගන්න ගිය විට රණ මොනරා සේ, උදේ සවස පමණක් මෙනෙහි නොකර සෑම මොහොතකම සූවිසි ගුණ මෙනෙහි කරන්න. එය පුදුම ශක්තියක්. බුදු ගුණ භාවනාව, දහම් ගුණ භාවනාව, සඟ ගුණ භාවනාව යනුවෙන්. තිරිසන් සතෙක් වුවද රණ මොනරා මෙලෙස ගුණ මෙනෙහි කළා නම්, මනුසත් බව ලැබූ අපට මෙලෙස මෙනෙහි කරන්න බැරි ඇයි? නිතර බණ අසන නිසා තමන්ගේ සිත පාලනය කරගත හැකි යි.

**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

බුදුසරණ

35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.

ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

ඇසළ පුර අටවක 2020.06.28

## සිතෙහි බැඳෙන මල

ආයුධයක මල බැඳෙන්නේ එහි විනාශය ළඟා වූ කල්හි ය. මල බැඳි ආයුධය මල නිසා ම විනාශ වන්නා සේ, අපගේ සිත තුළම ඉපද සිත ම විනාශ කරන මල විශේෂයක් ද වේ. ඒ ක්‍රෝධයයි. වෛරී බවයි. ආයුධයේ බැඳෙන මල එහි විනාශයත් සමඟ විනාශ වී ගිය ද සිතෙහි බැඳෙන මල උපනූපන් ආත්ම බවවලදී නැවත විකාශනය වෙමින් යයි. පෙර එක් ආත්ම බවයක දී දෙව්දත් තෙරුණුවෝ, තමන්ට රන්තලියක් අහිමි වීම නිසා බෝසතාණන් වහන්සේ වෙත මුදාහළ ක්‍රෝධ සහගත බව, වෛරී සිත සම්මා සම්බුද්ධත්වය ලැබීමෙන් පසුව ද මුදාහළහ. සසරෙන් සසරට පැමිණ අවසන ආනන්තරීය පාප කර්මයක් සිදු කර ගන්නා තරමට ඒ වෛරය, ක්‍රෝධය බලවත් විය.

බොහෝ දෙනා සිතා සිටින්නේ අනුන්ට මුදා හරින ක්‍රෝධයෙහි ඵල අනුන්ටම බව ය. එහෙත් එය තමන් නොදැනීම තමන් පීඩාවට පත් කරන භයානක සිතිවිල්ලකි. ක්‍රෝධය, වෛරය තුළ අන්ධ වූ පුද්ගලයාට හොඳ නරක නොපෙනේ. කළ යුතු දෙය, නොකළ යුතු දෙය නොදැනේ. අපේ සමාජයේ බොහෝ දෙනා බොහෝ විට පීඩාවට පත්වන්නේ, දුකට විපතට වැටෙන්නේ ක්‍රෝධය නිසා තමන් අන්ධ වී ඇති බව නොදකින නිසා ය.

සිතක ක්‍රෝධය වර්ධනය වන තරමට ඒ පුද්ගලයාගේ ප්‍රඥාව පිරිහෙන්නේ ය. බුදු දහමේ සඳහන් වන්නේ ඥාණය ගින්නක් නම්, එහි ආලෝකය ආවරණය කරන දුම ක්‍රෝධය වන බව ය.

නුවණ වැසී ගිය තැන මතුවන අඥානකම බොහෝ ගැටලු මතු කරන්නේ ය. අද අප අත් විඳින බොහෝ කටුක අත්දැකීම් එවැනි අමිහිරි ඵලයන් ය. දෙස්නගා ගැනීමේ සිට ඇතැම් විට මිනිස් ජීවිත බිලිගන්නා තරමට උත්සන්න වන ක්‍රෝධය, වෛරය, පාලනය කර ගැන්මේ හැකියාව ද තමන් විසින්ම ඇතිකරගනු ලැබිය යුතු ය.

අප විසින් කරනු ලබන සියලු අයහපත් දැයෙහි වගකීම ඇත්තේ අප වෙතම ය. එය අම්මාට, තාත්තාට හෝ අන් කවරෙකුට හෝ පැවරිය නොහැකි ය. ගොනා පසු පස ඇදෙන කරත්ත රෝදය සේ අප කරන කම් පල අප වෙතම ළඟා වේ. එහෙයින් මේ යථාර්ථය අප විසින් අවබෝධ කරගනු ලැබ යුතු වේ.

අපි බොහෝ විට අපේ ආගම, දර්ශනය පිළිබඳ උදම් වෙමු. උනන්දුවෙන් කතා කරන්නෙමු. වර්ණනා කරන්නෙමු. බොහෝ ගැඹුරු තැන් විමසමු. එහෙත් ප්‍රායෝගික ජීවිතයට සමීප කර නොගන්නා තාක් ඉන් ප්‍රයෝජනයක් නැත. හිස් ය. මේ නිසා දහම් මගට පැමිණීමට අවංක ඕනෑකමක් තිබිය යුතු ය. එකිනෙකාට දෙස් පවරා ගැන්ම හෝ චෝදනා කිරීම ඵල රහිත ය.


දිනක් දුර්වර්ණ, ඉතා මිටි, අප්‍රසන්න පෙනුමැති යක්ෂයෙක් සක් දෙවිඳුගේ අසුනෙහි හිඳගෙන සිටියේ ය. මේ දුටු අනෙක් දෙවිවරු කෝපයෙන් කෑ ගැසූහ. යක්ෂයාට දෙස් කීහ. දෙවියන්ගේ කෝපය හමුවේ අපූරු දෙයක් සිදුවිය. දුර්වර්ණ වූ යක්ෂයා බොහෝ ප්‍රසන්න වූයේ ය. දෙවියන්ගේ කෝපය හමුවේ බබළන්නට වූයේ ය.

ඒ මොහොතේ සක් දෙවිඳු පැමිණියේ ය. තම අසුනේ සිටින යක්ෂයා දැක ඉවසීමෙන් යුතුව, යටහත් බවක් දක්වා "මම සක් දෙවිඳු වෙමි"යි තෙවරක් පැවසී ය. ඒ සමඟ ම දුර්වර්ණ වී ගිය යක්ෂයා ක්‍රමයෙන් කුඩා ශරීර ඇති ව නොපෙනී ගියේ ය.

යක්ෂයා ලෙස මෙහි දැක්වෙන්නේ ක්‍රෝධයේ සංකේතයයි. ක්‍රෝධය, වෛරය ඇති පුද්ගලයා යක්ෂයෙක් වැනි ය. දුර්වර්ණ ය. අප්‍රසන්න ය. එහෙත් ඉවසීම ඇති තැන මේ යක්ෂයාට ඉඩක් නැත. එය ජීවිතයට පුරුදු කළ යුත්තකි. බොහෝ ප්‍රශ්නවලට විසඳුම ද එය වනු ඇත.

# සම්බුදු සසුනෙහි මිහිර විඳින්නෝ

**දිනක් බුදුරජාණන් වහන්සේ ශාක්‍ය ජනපදයේ නාගරක නම් නියම් ගමේ වැඩ වාසය කරද්දී ආනන්ද මාහිමියන් වහන්සේට අදහසක් පහළ විය.**



දිද්දෙණිය රණගිරිලෙන ආරණ්‍ය සේනාසනවාසී, ත්‍රිපිටක විශාරද, විද්‍යාවේදී, ශාස්ත්‍රපති,

**මහව ඤාණාලෝක හිමි**

බුදු සසුනක මිහිර විඳගන්නට ලැබෙන්නේ නිවැරැදි සත්පුරුෂ ඇසුරකින් ම නිසා බුදුසසුනේ පැවැත්මෙන් හරි අඩක් ම සත්පුරුෂ ඇසුර නිසා පවතින්නේ යැයි උන්වහන්සේට සිතක් විය. බුදුරජාණන් වහන්සේ හමු වී තමන් වහන්සේගේ සිතැඟි පැවසූ මොහොතේ බුදුරජාණන් වහන්සේ ඒ අනඳ මාහිමියන්ගේ ප්‍රකාශය වළක්වමින් වදාළේ මේ බුදුසසුනේ හරි අඩක් නොව සම්පූර්ණයෙන් ම කල්‍යාණමිත්‍රයන් ඇසුරු කිරීම මත ම පවතින බව යි.

බුදු සසුනක් ලැබෙන්නේ දුර්ලභ ව වේ. ඒ දුර්ලභ බුදුසසුනක මිනිසත් බවක් ලැබෙන්නේ දුර්ලභව වේ. එසේ මිනිසත් බවක් ලැබුණ ද ඒ බුදු සසුනේ මිහිර විඳගැන්මට නිසි සත්පුරුෂ ඇසුරක් ලැබෙන්නේ අතිශය දුර්ලභව වේ. 'දුල්ලභෝ සප්පුරිස සංසේවෝ' යැයි වදාළේ බුදුරජාණන් වහන්සේ ම වේ.

බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර විශාකා මහෝපාසිකාව විසින් ඉදිකර පූජා කරන ලද පූර්වාරාමයේ වැඩ වාසය කරන කාලයක එක් පුන්පොහෝ දිනක සඳ නැඟී පවතින රාත්‍රියේ භික්ෂූන් වහන්සේලා පිරිවරාගෙන එළිමහනෙහි වැඩ හිඳි සේක. එහි දී පැහැදීම ඇති කරවන ඉතාමත් සංයමයෙන් යුතු, අත් පා සෙලවීමක් හෝ නොමැති භික්ෂූන් වහන්සේලා දුටු භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂූන් අමතා අසත්පුරුෂයා හා සත්පුරුෂයා හඳුනා ගන්නා ආකාරය දන්නේ දැයි විමසූ හ. මෙහි දී බුදුරජාණන් වහන්සේ සත්පුරුෂයා හඳුනා ගන්නා කරුණු අටක් දේශනා කර වදාළ සේක.

එහි දී බුදුරජාණන් වහන්සේ වදාළේ සත්පුරුෂයා සද්ධර්මයෙන් සමන්වාගත වන බවයි (සද්ධම්මසමන්නාගතො). ඒ අනුව සත්පුරුෂයා ශ්‍රද්ධාවන්තයෙක් වේ. වර්තමානයේ සමහර කෙනෙක් බුදුරජාණන් වහන්සේ සියල්ල දත් සර්වඥයන් වහන්සේ නමක් ද යන්න ගැන සැක කරති. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයේ සිදු වූවා යැයි සඳහන් වන දේ වර්තමානයට ගළපා බලන්නට සිතති. ධ්‍යාන ලැබූවන්, අහසින් ගිය අය ආදීන් ඇත්තෙන්ම සිටියේ දැයි සැක කරති. අපාය, දිව්‍ය ලෝකයන් ඇත්තෙන්ම පවතී දැ යි සැක කරති. ඒ ශ්‍රද්ධාව නොමැති කම නිසා ම වේ. මෙසේ ශ්‍රද්ධාව නොමැති අසත්පුරුෂයන් ඇසුරු කිරීමෙන් ඇසුරු කරන අය ද අශ්‍රද්ධාවන්තයන් බවට පත් වී නිවන් මඟ සම්පූර්ණයෙන් ම හරස් කර ගනිති. එසේම සත්පුරුෂයා පව් කිරීමට ලජ්ජා ඇති, පව් කිරීමට බිය ඇති පුද්ගලයෙක් වේ. තථාගතයන් වහන්සේගේ ධර්මය මනාව කියවා අසා දැනගත් බහුශ්‍රැතයෙක් වෙයි. බුදුරජාණන් වහන්සේ මෙම බහුශ්‍රැත භාවය මංගල කරුණක් බව 'බාහුසච්චං ච සිප්පං ච' යනුවෙන් ද වදාළ සේක. එහෙත් ඒ මේ බහුශ්‍රැත බව නම් ලෞකික තිරශ්චීන විද්‍යාව පිළිබඳව නොව ත්‍රිපිටක ධර්මය පිළිබඳව ම වේ. බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍ර, විනය, අභිධර්මය මැනවින් ම ඉගෙනගත්, ඒවායේ අර්ථ විග්‍රහය මැනවින් ම ඉගෙනගත් කෙනෙක් විය යුතු ය. එසේ නොමැතිව තමාගේ හුදු ස්වාධීන වැටහීමට අනුව දහම් දේශනා කරන අයෙක් නොවිය යුතු ය. සත්පුරුෂයා එබඳු බහුශ්‍රැතයෙක් වෙයි. එපමණක් ද නොව සත්පුරුෂයා නිවන් දැකීම පිණිස වීර්යය කරන ඇරඹූ වීර්යය ඇති පුද්ගලයෙක් වෙයි. නිරන්තරයෙන් සිහියෙන් යුතුව කුසල ධර්මයන් සම්පාදනය කරගන්නා නුවණැති තැනැත්තෙක් වෙයි. මේ ආදි ගුණාංගවලින් යුතු සත්පුරුෂයා සද්ධර්මයෙන් සමන්වාගත බව බුදුපියාණන් වහන්සේ වදාළ සේක.

එසේම සත්පුරුෂයා නිරන්තරයෙන් තවත් සත්පුරුෂයන් ම ඇසුරු කරන බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක (සප්පුරිසභත්ති). ශ්‍රද්ධාවන්ත වූ, පවට ලැජ්ජා සහගත වූ, පවට බිය වූ මේ ආදි ඉහත දැක්වූ ගුණයන්ගෙන් සමන්වාගත සත්පුරුෂයන් හා මිතුරු වූයේ වෙයි. මෙකල හැටියට නිතර සිල්වත් ගුණවත් මහාසංඝරත්නය ඇසුරු කරන, නිති පන්සිල් රකින, පොහොය අටසිල් රකින මේ ආදි ලෙස නිවන් ගමනේ ගමන් කරන කෙනෙක් සිටී නම් ඒ පුද්ගලයා සත්පුරුෂයෙක් බව දැනගෙන ඇසුරු කළ යුතු වේ.

එසේම සත්පුරුෂයා කිසි කලෙකත් තමන්ට හෝ අනුන්ට හිරිහැරයක් වන ආකාරයට සිතන්නෙක් නොවේ (සප්පුරිසචින්තී). තමන්ට හෝ අනුන්ට හිරිහැරයක් වන දේ පිළිබඳ කතා කරන්නේ හෝ නොවෙයි (සප්පුරිසමන්තී). තමන්ගේ සිතිවිල්ලකින් හෝ අන් අයෙකුට හිරිහැරයක් කරදරයක් නොවේවා යන මෛත්‍රී සිතින් යුතු පුද්ගලයෙක් වෙයි. මේ දුර්ලභ බුදු සසුනේ නිවන් ගමන ශක්තිමත් කරගැනීමට වෙර දරන සියලුදෙනා ම මේ සත්පුරුෂ ගුණයන් ද ඇති කරගත යුතු වේ. නිරන්තරයෙන් තමාගේ සිතිවිල්ලකින් වත් අනෙක් කෙනෙකුට හිරිහැරයක් කරදරයක් නොවේවා යන අදහස නිතර ඇති කරගත යුතු වේ.

**මෙම ලිපියේ ඉතිරි කොටස ඇසළ පුර පසළොස්වක පෝද (ජූලි 04) කලාපයේ පළවේ.**






ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තම උපන් දිනය වෙනුවෙන් පසුගියදා (20) අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ පුදා ගත් අයුරු සහ අටමස්ථානාධිපති රාජකීය පණ්ඩිත පල්ලේගම සිරිනිවාස නාහිමිපාණන් බැහැදැක ආශිර්වාද ලබා ගත් අයුරු

ඡායාරූප
චිත්‍රානන්ද කළුආරච්චි
හිදෝගම සමූහ

කවරයේ කතාව

# තිස්ස හිමිට පූජා වූ අභයගිරිය

**වැව් බැඳි රාජ්‍යය නැතිනම් ඓතිහාසික රජරට රාජධානියේ අටමස්ථානයට අයත් සුවිශේෂී පුණ්‍ය භූමියක් වන අභයගිරිය සෑ රදුන් වහන්සේගේ සේයාරුවෙන් මෙවර කවරයේ කතාව සිතුවම් වෙයි. ලක්දිව ඉතිහාසයේ සුවිශේෂී පුණ්‍ය භූමියක් වන අභයගිරිය ඒ ඉතිහාසය කෙසේ සැකසුණුදැයි විමසීමම අනාගත වාදීන්ට ලබා දෙන්නා වූ උත්තේජනයක් ය. ඒ නිසාවෙන් අභයගිරිය රජමහා විහාරාධිපති ආචාර්ය පූජ්‍ය කල්ලංචියේ රතනසිරි ස්වාමීන් වහන්සේ ඒ ඉතිහාසයට වත්මනෙහි අප සතුව ඇති ඥානමණ්ඩලයයි.**



මනරම් මුතු මැණික්වලින් අලංකාර කරන ලද ධාතු ගර්භයෙහි රතින් කරන ලද ගවයකුගේ කුසෙහි තිලෝගුරු බුදුරජාණන් වහන්සේගේ ධාතූන් වහන්සේලා තැන්පත්කොට වළගම්බා මහා නිරිඳුන් විසින් අභයගිරිය කර පූජා කොට තිබෙනවා. අඩි 400 ක පමණ උසකින් හා අඩි 1100 ක වට ප්‍රමාණයකින් යුක්තව නිර්මාණය වී ඇති අභයගිරිය දාගැබ් වහන්සේ පිළිබඳ ලියැවුණු ඉතිහාස කතා බොහෝමයි.

මේ අතරින් ක්‍රි.පූ. 89 – 77 දී රාජ්‍යත්වයට පත් වට්ටගාමිණී අභය හෙත් වළගම්බා මහා නිරිඳුන් විසින් අභයගිරිය නිර්මාණය කළ බවයි වංශ කතා සාක්ෂි දරන්නේ. මේ පිළිබඳ මහා වංශය මෙන්ම නිකාය සංග්‍රහය දීප වංශය, වංසත්ථප්පකාසිනිය වැනි ඓතිහාසික ග්‍රන්ථ රැසක අභයගිරියේ ප්‍රභවය පිළිබඳ සඳහන් වෙන කරුණු කාරණාවන් රැසක් අඩංගුයි.

එක් මොහොතකදී වළගම්බා රජු හා ද්‍රවිඩ සොළී කුමාරවරු අතර ඇති වූ රාජධානි අරගලය නිසා සිය සේනා ශක්තිය පිරිහුණු වළගම්බා රජු රාජධානිය අත්හැර පළායාමට තීරණය කොට තිබේ. එහිදී රාජ්‍ය අතහැර පළායනවිට ගිරි නිඝන්ඨයා මහා කළු සිංහලයා පළායන්නේ යැයි' ඝෝෂා කර තිබේ.

එහිදී වළගම්බා රජු තමා කවදා හෝ රාජ්‍යත්වයට පත්වන්නේ නම් මෙම ස්ථානයෙහි විහාරස්ථානයක් ගොඩනගන්නේ යැයි අදිටන් කරගත් බවයි මහාවංශය සඳහන් කරනුයේ.

මෙහිදී අභයගිරිය කේන්ද්‍රකර ගනිමින් තවත් අපූරු හෙළිදරව්වක් සඳහන් කළ යුතුමයි. වළගම්බා රජු සිය සේනා සංවිධානය යුද ශක්තිය සියල්ල මැනවින් සකස්කොට යළි සිය බලය ලබා නොගත්තේ නම් මෙවැනි සැයක් බිහිනොවන්නට තිබුණි.

නමුත් ඒ සඳහා ශක්තිය ලබා දුන්නේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා. කුප්පිකල විහාරවාසී මහාතිස්ස හිමියන් සහ හඹුගල්ලක විහාරයේ තිස්ස හිමියන් එහිදී කැපීපෙනෙන චරිත. වළගම්බා රජු මානසිකව මෙන්ම කායිකව ශක්තිමත් කරලීමට උන්වහන්සේලා මහත් වීර්යයක් ගත් බව මහාවංශය පෙන්නුම් කරනවා. පිඩු සිඟා වඩමින් රජුට ආහාරපාන ලබාදුන් බව පවා සඳහන්. විශේෂයෙන්ම දුර්භික්ෂයන්ට පවා මුහුණ දෙමින් වළගම්බා රජු රාජ්‍ය බලයට පත්කළ බවයි ඉතිහාසයේ සඳහන් වෙන්නේ.

ඒ අයුරින් පාලනයට පත් වළගම්බා රජු සිය අරමුණ සඵල කර ගැනීම සඳහා ගිරි නිඝන්ඨයා වාසය කළ ආරාමය විනාශ කොට එම ස්ථානය ආශ්‍රිත ව රජුගේ නමෙහි අවසාන කොටස වූ අභය යන්න හා ගිරි නිඝන්ඨයාගේ නමද එකතු කොට අභයගිරිය යන නම යොදා පිරිවෙන් දෙළසකින් යුතුව දාගැබ් වහන්සේ සාදවා, තමන්ට උපකාර කළ කුප්පිකල විහාරවාසී මහාතිස්ස හිමියන්ට පූජා කොට තිබේ.

එතැන් පටන් ශාසනික අභිවෘද්ධිය වෙනුවෙන් අභයගිරිය විහාර ආශ්‍රිතව සිදුවූ සේවාව සුවිශාලයි. වළගම්බා රජු පමණක් නොව ඔහුගේ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින්ද අභයගිරිය විහාරයේ සංවර්ධනයේ කොටස්කරුවන් වූ බැව් දක්නට ලැබේ.

ඒ වගේම වළගම්බා රාජ්‍ය සමයෙන් පසුව වුවද අභයගිරිය විහාරයෙහි සංවර්ධනය උදෙසා පාලකයින් සිය අවධානය යොමුකර ඇති බැව් දකින්නට පුළුවන්. මෙතැන දී 'මහසෙන් රාජ්‍ය සමය' අභයගිරිය විහාරය සම්බන්ධ විශේෂ කාරණාවන් සඳහන්.

එහිදී මහා විහාරය පිළිබඳ යමක් සඳහන්කොට යුතුයි. එක් මොහොතකදී මහසෙන් රාජ්‍ය කාලයේ දී මහාවිහාරය බිමට සමතලා කොට උඳු වැපිරූ බව මහාවංශයේ සඳහන්. ඒ නිසා මහාවිහාර භූමියෙහි සියලුම ද්‍රව්‍ය අභයගිරියට ගෙන ගිය බවයි සඳහන් වෙන්නේ. මෙහිදී අභයගිරි වාසි භික්ෂූන් වහන්සේලාගේ ශක්තිමත් ස්වරූපය මහසෙන් රාජ්‍ය සමයෙන් මනාව හෙළිදරව්වන කරුණක්.



ආචාර්ය
**කල්ලංචියේ රතනසිරි හිමි**

මහසෙන් රාජ්‍ය සමයෙදී මහායාන ඉගෙනීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස ද අභයගිරිය විහාරය හඳුනාගෙන තිබෙනවා. වහඳුමූල, උත්තර මූල, කපාරා මූල හා මහනෙත්පසද මූල වශයෙන් මූල හතරකින් යුක්තව අධ්‍යාපනය ලබාදෙන අධ්‍යාපන ආයතනයක් පැවති අතර විදේශීය සිසුන් පවා පැමිණ අධ්‍යයන කටයුතු කළ බවයි අභයගිරිය පිළිබඳ ඉතිහාස කාරණා හෙළිදරව් කරනුයේ

රජරට රාජධානියේ අටමස්ථානයට අයත් සුවිශේෂ පුණ්‍ය භූමියක උරුමය අප ඉතිහාස මූලාශ්‍රයන්හි දීර්ඝව සඳහන් වෙතත් අභයගිරියේ උරුමය පිළිබඳ දීර්ඝ ඉතිහාසයක් ඇති අතර ජාතික හා ආගමික කේන්ද්‍රස්ථානයක් වශයෙන් අභයගිරි රජමහා විහාරය සැලකීම යුක්ති යුක්ත ය.

**වසන්ත ජයසිංහ ආරච්චි**

# ජයග්‍රහණයේ ඇරඹුම දරාගැනීමයි

**පසුගිය අමාවක පෝය දින සඳහන් කළ ධර්ම විවරණය, අනුව අවබෝධයෙන්, අකුසල කර්ම රැස් නොවන ආකාරයෙන් සිතෙහි, වචනයෙහි, ක්‍රියාවෙහි ඇති කර ගන්නා වූ පාලනය, සංසිඳීම, ඉවසීමේ ගුණයයි.**

සාමාන්‍යයෙන් වයස අවුරුදු තුන, හතර, පහ කාලයේ පටන් ඉවසීමේ ගුණය ආරම්භ කළ හැකියි. පුංචි දරුවෙකුගේ සිතේ ආදරයත්, කරුණාවත් මතු කරගෙන සතෙකුටවත් ගහන්න එපා. පීඩාවක් කරන්න එපා කියන අදහස පුරුදු කරන්න.

එවිට දරුවාගේ සිතෙහි කරුණාවක්, මෛත්‍රියක් ඇතිවෙනවා. යමක් හෝ තේරුම් ගත හැකි අවධියේදී "මගේ දුවට පුතාට මම ගැහැව්වොත්, දෙස් කිවහොත් කැමැති නැහැ නේද? එසේ නම් අන් අයත් අම්මා, තාත්තා, ආච්චි, සීයා, නැන්දා, මාමා හෝ කවුරුවත් එවැනි දෙයකට කැමැති නැහැ. සතුන්ට කතා කර ගන්න බැරි වුණාට සතුන්පවා පීඩාවකට කැමැති නැහැ. ඒ නිසා පීඩාවක් කරන්න එපා.

එවිට පුංචි දරුවා ප්‍රශ්න කළොත් "හොඳයි එතකොට මට යම් කෙනෙක් ගහන්න, බණින්න ආවොත් අය්යා, අක්කා, නංගී, මල්ලී කවුරු හෝ මට ගහන්න, බණින්න ආවොත් කුමක් ද වෙන්නේ?. මගේ දේ උදුරාගත්තොත් කුමක් ද වෙන්නේ?. මම කැමැති දෙයක් මට නොදුන්නොත්, මම අකැමැති දේ ම මට කරනවා නම් මොකක් ද වෙන්නේ. මේවා සමහර විට වයස අවුරුදු හත, අට හා තරුණ දරුවන්ටත් ගළපා සිතන්න පුළුවන්. එවැනි වෙලාවක දී පවා පුතේ, දුවේ බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය පුරුදු කරන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඉවසීමේ ගුණය පුරුදු කරන්න. බලන්න, බුදුරජාණන් වහන්සේටත් බැන්නා, දෙස් කිව්වා, මරණයට පත් කරන්න උත්සාහ කළා. ඒ හැම වෙලාවක ම බුදුරජාණන් වහන්සේ ආරක්ෂා වුණා. හැබැයි බුදුරජාණන් වහන්සේ නපුරු වචනයෙන් බැණ වැදුණේ නැහැ. බුදුරජාණන් වහන්සේගේ සිත තුළ මහා කරුණා ගුණයම පැවතුණා. බුදුහාමුදුරුවෝ වගේ නොවේ යැයි කියා ඔබ කියන්න පුළුවනි. තවම රහත්වෙලා නොවේ යැයි කියන්න පුළුවනි.

ඒ වුණත් "බුද්ධං සරණං ගච්ඡාමි" යනුවෙන් බුදුරජාණන් වහන්සේ සරණ යනවා කියන අප ක්‍රමයෙන් ඒ ගුණයන් ට පුරුදු විය යුතුයි. තරුණ දරුවන්ට හෝ වැඩිහිටියන්ට මෙය පුරුදු කරන විට අප මුලින් ම පෙන්වාදිය යුත්තේ අටලෝ දහම ගැනයි. බුදුරජාණන් වහන්සේගේ තාදි ගුණය දෙස බලන්න. අටලෝ දහමෙහි කම්පා නොවීම යනුවෙන් අදහස් කරන්නේත් මේ පරමාර්ථ ධර්මයයි. ඒ සියලු සංස්කාරයෝ අනිත්‍ය, දුක්ඛ, අනත්ත නම් වූ ත්‍රිලක්ඛන ධර්මයට යටත් ය යන ශ්‍රී සද්ධර්මය තේරුම් ගන්නා විට සිතේ ඇතිවන ස්වභාවයයි.

ලාභ – අලාභ, අයස –යස, නින්දා – ප්‍රශංසා, සැප – දුක් යනු අටලෝ දහමයි. කැමැති අරමුණු ඉටුවීමේ දී සකස් වන සිත හඳුන්වන්නේ ලාභය හැටියටයි. අන්න ඒ ලාභයේ දී ධර්මානුකූල ව එය පරිහරණය කරනවා. කටයුතු කරනවා. නමුත් ඒවා රැකගන්න හෝ නැති දේ නැවත ලබන්න හෝ ක්‍රියා කරන්නේ නැහැ. තිබෙන දේ ලබන්න හෝ රැක ගන්නට පස් පව් දස අකුසල්වලින් යුක්තව ක්‍රියා කරන්නේ නැහැ. තියෙන දේ වැඩිකර ගන්නට හෝ පස් පව් දස අකුසල්වලට සම්බන්ධ වී ක්‍රියා කරන්නේ නැහැ. ලෝභයෙන්, මෝහයෙන්, ද්වේෂයෙන්, තරහවෙන්, වෛරයෙන් දැඩි ආශාවෙන් කටුතු කරන්නේ නැහැ. මිල මුදල්, ගේ දෙර, වතුපිටි, යානවාහන, තනතුරු, ඇඳුම් පැළඳුම්, ආහාර මේ මොනවා ලැබුවත් මේවා හට අරගෙන බිඳී නැතිව යනවා. මේ නිසා ඒවා ධර්මානුකූල ව පරිහරණය කරනවා. හැබැයි ඒවා මමයි, මගෙයි, ස්ථිරයි යනුවෙන් ලෝභ, ද්වේෂ, මෝහ තණ්හා මද මාන දිට්ඨිවලට සම්බන්ධ ව ක්‍රියාකරන්නේ නැහැ. ඒ වගේ ම ඒ දේවල් නැතිවී, බිඳී, ගිලිහී යනවිට අපේ සිත තරහවට, අකමැත්තකට පත් කර ගන්නේ නැහැ.

යම් පුද්ගලයෙක් ඉතා ම හොඳින් සිටින කෙනෙක් ඉක්මනින් ම ලෙඩවෙලා දිරාගෙන ගොස් මරණයට පත්වෙන්නත් පුළුවන්.

එවැනි වෙලාවක දී පවා නොහඬා, නො වැළපී සිටීමේ ස්වභාවය පවා සිත තුළින් අවබෝධයක් ඇති කර ගැනීමේ ස්වභාවය පවා ඉවසීමේ ගුණය හැටියට දකිනවා. මේ ආකාරයට අටලෝ දහම දෙපැත්ත ම තේරුම් ගන්න අවශ්‍යයයි. හොඳ සහ නරක දෙපැත්ත ම තේරුම් ගන්නා විට තණ්හා මද මාන මතු කරන්නේ නැහැ. අකැමැතියි කියන තැනත් අපි සිතින් දකිනවා. දරා ගන්නවා. හැබැයි තරහවක්, වෛරයක් ඇති කර ගන්නේ නැහැ. මෙන්න මේ අදහස කුඩා කාලයේ සිට දරුවන්ට උගන්වනවා. අප දරුවන්ට හැකි ආකාරයෙන් යමක් ලබාදෙනවා. ඒ පැනක්, පැන්සලක්, පොතක් විය හැකියි. ඒ වගේ ම දරුවන්ට උගන්වනවා. මේ මව්පියන්ට හැකි ආකාරයෙන් තමයි ඉහළින් ම අපි ලබාදුන්නේ. සමහර දේ අපට දැන් ම කරන්න බැහැ. මේ අපිට තියෙන ආකාරයෙන්. අන්න එවැනි වෙලාවක පවා දරුවන්ගේ සිතට අර ඉවසීමේ ගුණය පිළිබඳ යම් ආධ්‍යාත්මික සිතිවිල්ලක් සිතට ලබාදිය යුතුයි. එසේ නම් සිත සකස් කර ගන්න ඕනේ. මව්පියන්ට හැකි ඉහළම ආකාරයෙන් තමයි අපිට මේ උදව් කරන්නේ.



බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක ආචාර්ය
**මිරිස්සේ ධම්මික නා හිමි**

ඒ නිසා මව්පියන් කෙරෙහි තරහවක්, වෛරයක් හෝ කැගැසීමක් හෝ හැඬීමකින් තොරව මෙය දරාගැනීමේ හැකියාවක් මට තියෙන්න ඕනේ.

මෙන්න මේ ආකාරයෙන් කුඩා කාලයේ පටන් කරුණාවයි, මෛත්‍රියයි මුල් කරගෙන ලද දෙයින් සතුටුවීමේ ගුණයත්, සියල්ලම තමන්ට ඕනේ ආකාරයට සිදු කර ගන්නට නොහැකි යි. කියන අදහසත් ධර්මානුකූල ව පෙන්වා දෙන විට දරුවන් සමාජය තුළ පෙන්වා දෙන ඉවසීමේ ගුණයට පුරුදු වෙනවා.

ඒ වගේ ම ධර්මානුකූල ව පෙන්වා දෙන කැමැති ප්‍රිය අරමුණුවල තදින් ඇලී ඒවා වෙනුවෙන් කලබල වී නො කටයුත්තකට යොමු නොවෙන්නත් ඒ වගේ ම තමන් අකමැති දේ සිද්ධ වෙන විට එහි දී කලබල වී හඬන්නේ නැතිව, කේන්ති ගන්නේ නැතිව, කෑ ගසන්නේ නැතිව සිත සංසුන්ව පවත්වා ගැනීමටත් හැකියාවක් තිබෙනවා. මෙය අපට අත්හදා බලන්න පුළුවන්, දරුවන්ගේ විභාගය සම්බන්ධයෙනුයි.

සමහර විටක දරුවෙක් විභාගයකට මුහුණදීමේ දී දරුවා කැමැති ආකාරයෙන් ප්‍රතිඵලයක් නොලැබෙන්න පුළුවන්. මව්පියන්, ගුරුවරුන් විසින් අවබෝධයෙන් යුක්තව දරුවාට උපදෙස්දිය හැකියි. අපට කැමැති ආකාරයෙන් සියල්ල ම සිදුවන්නේ නෑ.

එහෙත් උත්සාහය, අධිෂ්ඨානය, නුවණ සැබෑ ලෙස පවත්වන්නට හැකි නම් අපට කැමැති දේ යම් වූ ද ආකාරයකට දිනා ගන්නට පුළුවනි. ඒ නිසා කලබල නොවී කේන්ති නොගෙන අප විසින් උත්සාහයෙන්, මහන්සියෙන්, වීර්යයෙන් කටයුතු කිරීමෙන්, ඉන් අදහස් කරන්නේ ඉවසීමෙන් කටයුතු කිරීමෙන් නැවතත් ජයග්‍රහණයක් ලබන්න පුළුවනි. ඒ වගේ ම නිවසේ දී වෙන්න පුළුවනි, මව්පියන් ඉදිරියේ කේන්ති නොගෙන අවබෝධයෙන් යුතු ඉවසීමේ ගුණය පුරුදු කරන්න. සහෝදර සහෝදරාදීන් සමඟත් එසේමයි. ඒ වගේ ම බස් රථයේ දී, දුම්රියේ දී පවා තමා ආරක්ෂා වෙන්න. ඒ වගේ ම අන්‍යයන්ගේ අකටයුතුකම් ඉදිරියේ නපුරු වචනයෙන්, ක්‍රියාවන්ගෙන් යුක්ත නොවෙන්නට අවබෝධයක් තිබිය යුතුයි. එයට හේතුව සියල්ල හට අරගෙන බිඳී යනවා. ස්ථිර වෙන්නේ නැහැ.

මෙන්න මේ ගැඹුරු අදහස දරුවන්ට දැනෙන්නේ මම මගේ සිත තුළ පාලනයක් නැතිව කෑ ගැසුවොත්, ගහ බැණ ගන්න ගියොත් මට ම විපතක් වෙන්න පුළුවන්. ඒ වගේ ම මගෙ අනාගත ජීවිතය යහපත් නොවෙන්නට පුළුවන්. සමහර විටක නීතියෙන් දඬුවම් ලැබෙන්න පුළුවන්. බරපතළ වරදක් ජීවිතයට වෙන්න පුළුවන්.


මම රැකෙනවා. නමුත් මගේ සිත තුළ තරහ, වෛරය එළියට එන්න නොදී වචනය ක්‍රියාව ඔස්සේ මගේ සිත තුළ සංසිඳීමක් මට ඇති කරගන්න පුළුවන්. මබා දේව ජාතකයේ එන කලාබු රජතුමා තාපසතුමාට අප්‍රමාණ කරදර කළා. ගහල, බැණලා, අත් පා ඇඟිලි කපා, නාස්පුඩුවලට, ඇස්වල, කන් කුහරවල කෝටු කැබලි ඔබද්දීත් තවමත් ඉවසීම තියෙනවා දැයි ප්‍රශ්න කරනවා. පපුවට පහර දෙමින් තවමත් ඉවසීමේ ගුණය තියෙනවා දැයි ප්‍රශ්න කරනවා. එවිට 'බාහිරව මේ ශරීරය තුළ නොව මගේ සිත තුළයි ඉවසීමේ ගුණය පවතින්නේ යැයි' තාපසතුමා පවසනවා.

අපට ධර්මානුකූල ව දකින්න පුළුවන්. දහමින් ම පුරුදු කළ යුතු ඉවසීම අනුක්‍රමයෙන් ඒ ඒ තැනට ගළපා අපි පුරුදු කළොත් "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය" කියන සිංහල අදහස් පෙළ ජීවිතය තුළ දකින්න පුළුවන්. එමගින් ධර්මාවබෝධය පිණිසත්, සමාජ සම්මතය තුළ පුංචි දරුවන්ගේ, තරුණ දරුවන්ගේ, වැඩිහිටියන්ගේ හා රටක ලෝකයක නායකයන්ගේ පවා ශාන්තියක් සැනසිල්ලක් ලබන්න පුළුවන්.

**දීපා පෙරේරා**



# සැනසීම දුරු කරන සංසාරගත පුරුදු



**මව්පියන් දරුවන්, සහෝදර සහෝදරියන්, ඥාතීන්, ගුරුවරු ශිෂ්‍යන්, මිතුරු පසමිතුරන්, අසල්වැසියන්, සේවක ස්වාමින්, පැවිද්දන් දායකයන් ආදි වශයෙන් වූ චරිත මේ ජීවන ගමනේ දී අපට නිරන්තරයෙන් හමු වෙනවා.**

එහෙත් මේ හැමෝ ම අපගේ අවසාන මොහොත දක්වා සැම දා සැම අයුරින් රැඳී සිටින්නේ නැහැ. ලෝභ ද්වේෂ මෝහයන් තුළ සිදු වන විවිධ ගැටුම් නිසා හෝ හමුවනවාට වඩා ඉක්මණින් වෙන්ව යනවා. සමහර අවස්ථාවල දී සංසාරගත පුරුදු ලෙස වෛරයෙන්, ද්වේෂයෙන්, පළිගැනීම්වලින් යුතුවනවා. මේ අයුරින් මිනිස් ජීවිත සන්තානයේ ඇතිවන නොයෙක් මානසික අඩුපාඩුකම් පෙන්වා දෙමින් සමාජයේ එකමුතු බව, විශ්වාසය සතුට සමගිය ආරක්ෂා කර ගනිමින් ජීවත් වන්නට හොඳම මාර්ගෝපදේශකයන් වහන්සේ පන්සිය පණස් ජාතක පොත් වහන්සේ බව ජාතක පොත් වහන්සේ කියවන කොයි කාටත් වැටහෙනවා.

ඉතින්, මෙම ජාතක පොතේ එන මිත්තා මිත්ත නම් ජාතක කතාව තුළින් පැහැදිලි කරනු ලබන්නේ ද මිනිස් මනසේ ඇති වන වෛරී, ද්වේෂ සහගත සිතුවිල්ලේ ස්වභාවය පිළිබඳවයි. එසේ ම තමන් ඇසුරු කරන මිතුරා තමා කෙරෙහි වෛරයෙන්, ද්වේෂයෙන්, තරහෙන් සිටිනා බව හඳුනා ගන්නේ කොහොම ද කියලත් කරුණු සපයනවා.

බුදු රජාණන් වහන්සේ දෙව්රම් වෙහෙරෙ වැඩ වාසය කරන අවදියේ එක් ආරාමයක එක්තරා භික්ෂුණී වහන්සේ නමක් සාමණේර භික්ෂුණී වහන්සේ නමකට උපාධ්‍යන් වහන්සේ වුණා. මෙම උපාධ්‍යන් වහන්සේ සහ කුඩා සාමණේරයන් වහන්සේ විශ්වාසයෙන්, එකිනෙකා තුළ පිය පුතු සෙනෙහසින් සතුටින් වාසය කළා. ඒ නමුත් සැම විටම තම ගුරුවරයා කෙරෙහි ගෞරව සම්ප්‍රයුක්ත ව කටයුතු කරන්නට වග බලා ගත් අතර උන් වහන්සේ සමඟ ඉතාමත් ම හිතවත් විදියට වත් පිළිවෙත් කළා. දිනක් මෙම කුඩා සාමණේරයන් වහන්සේ තම ගුරු හාමුදුරුවෝ කෙරෙහි බොහෝ ආදර ගෞරව උපදවා, උපාධ්‍යන් වහන්සේගේ පාවහන් දැමීමට පසුම්බියක් අවශ්‍ය බව දැනගෙන ගුරු හිමියන් සමඟ පැවතුන විශ්වාසය මත,

මා කළ දෙයකට ගුරු හිමියන් වහන්සේ අමනාප නොවෙයි.'

සිනා රෙද්දක් ගෙන පසුම්බියක් මසා පූජා කොට උපාධ්‍යන් වහන්සේට ඒ බව පසුව පැවසුවා. මෙසේ ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ගුරු හිමියන් වහන්සේ බොහෝ සෙයින් කේන්ති ගෙන

'මාගේ රෙදි කඩ කුමකට මගෙන් නොඅසා අරගත්තේ ද?' සැරෙන් ඇසුවා

'ඔබ වහන්සේ මට ඇති විශ්වාසය නිසා මෙම රෙදි කැබැල්ල අරගෙන ඔබ වහන්සේට පාවහන් තබා ගැනීමට පසුම්බියක් කළා'

'තොප හා මා අතර කුමන විශ්වාසයක් ද?' 'ඔබ කළේ වරදක්' කියා සාමණේරයන් වහන්සේ ට අතින් පහර කිහිපයක් ගැසුවා. මෙම කතා පුවත දම් සභා මණ්ඩපයේ සිටි භික්ෂුණී වහන්සේලා අතර කතා බහට ලක් වුණා. බුදු රජාණන් වහන්සේ එහි වැඩම කොට එම පුවත අසා

'මහණෙනි පෙරත් මෙම උපාධ්‍යන් වහන්සේ කෝපයෙන් යුක්තව කටයුතු කළා.' යැ යි අතීත ආත්ම භාවය මතක් කළා.

එවිට බුදු රජාණන් වහන්සේ, භික්ෂුණී වහන්සේලාගෙන් ලද ආරාධනාවට එම අතීත ජාතක කතාව දේශනා කළා.



අනුරාධපුර කුට්ටම්පොකුණ විහාරාධිකාරී ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත
**කිවුලතලාවේ සමිත හිමි**

පෙර බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍ය කරන කාලයේ බෝසතාණන් වහන්සේ එකී රටේ බමුණු පවුලක ඉපිද වැඩි වයසට පත්ව ගිහිගෙයි ඇල් ම අතහැර දමා හිමාල වනයට ගොස් තවුස් පැවිද්දෙන් පැවිදිව නිරන්තරයෙන් අත් තාපසයන් උදෙසා අවවාද අනු ශාසනා ලබා දෙමින් බොහෝ තාපසවරුන් ට නායක ව වාසය කළා.

උන් වහන්සේ යටතේ කටයුතු කළ තාපසයන් අතර සිටි එක් තාපසයෙක් ඇත් පැටවෙකුට පුත්‍ර ප්‍රේමයෙන් යුතුව කෑම බීම ලබා දෙමින් ඇති දැඩි කළා. ඒ ඇතා ලැබීමෙන් බොහෝ උවදුරු ඇති වන බව නායක තාපසතුමා දැන ගත්තා. පසුව තමන් ළඟට කැඳවූ තාපසයන් වහන්සේට අවවාද කොට එම ඇතා කැළයට මුදා හරින ලෙස කියා සිටියා. බෝසතාණන් වහන්සේ කිහිප විටක් ම අවවාද කළ එම තාපසයා එසේ නොකර ඇත් පැටවා ව හදා වඩා ගත්තා.

මෙලෙස ආදර සැලකිලි ලද ඇත් පැටවා බොහෝ ම හොඳින් උස් මහත් වුණා. මද වැගිරෙන වයසේ දී ඇතා දරුණු වුණා. දිනක් තාපසයා පලතුරු ගෙනෙන්නට ගොස්දින කීපයක් ගතවී පැමිණියා. තාපසයා දුටු ඇතා ඔහු මරා කැළයට පලා ගියා. බොහෝ තාපසවරු එම තාපසයාගේ මෘත දේහය ආදාහනය කොට බෝසතාණන් වහන්සේට ඒ බව කීවා. එවිට බෝධි සත්වයන් වහන්සේ 'යම් හිතවත් මිනිසකු දුටු විට සතුටින් කතා නොකරයි ද? සිනා සෙන්නේ නැද්ද? ඇසට ප්‍රිය ආකාරයෙන් නොබලයි ද? දැන සතුටු නොවෙයි ද? යන මේ කරුණුවලින් යුත් තැනැත්තන් වෛරයෙන් යුක්ත වෙනවා' ද්වේෂයෙන් යුක්ත වූ අවස්ථාවේ, කැලඹුණු දියමත ගැඹුර නොපෙනෙන්නා සේ පියවි සිහියෙන් මිදී බොහෝ අපරාධ කරනවා. තමන්ට කොතෙක් උපකාර කළත් එම අසත් පුරුෂකම තුළ අම්මා තාත්තා ගුරුවරයා කවු ද කියලා හඳුනන්නට නොහැකි වෙනවා. ඒ තාපස නායකයා මෙසේ වදාරා අනෙක් තාපස පිරිස සත් ධර්මයේ පිහිටුවා බොහෝ කලක් සතර ඹබ විහරණයෙන් තාපස ප්‍රව්‍රජාවෙන් වැඩ සිට මරණින් මතු බඹ ලොව උපන්නා.

"එදා ඇති දැඩි කරනු ලැබූ ඇත් පැටවා මේ උපාධ්‍යයන් වහන්සේ යි. ඇත් පැටවා ඇති දැඩි කළ තාපසයා මේ සාමණේර භික්ෂුවයි. තාපසයන් ට ප්‍රධාන ව සිටියේ තථාගත වූ මම් ම නොවේ දැ'යි වදාරා බුදු රජාණන් වහන්සේ ජාතක කතාව වදාළ සේක.

ද්වේෂය යනු අකුසල් මූලයන්ගෙන් එකකි. එය යකඩ පිහියෙහි බැඳෙන මළකඩ මෙනි. පිහියේ ම ඇති වී පිහිය විනාශ කරන්නේ යම් සේ ද? ද්වේෂය ද පුද්ගලයාගේ සිතෙහි හටගෙන පුද්ගලයාගේ නිවීම වැනසීමක් බවට පත් කරනු ලබනවා. මෙලොව වශයෙන් හා පරලොව වශයෙන් දෙලොවට ම එය බාධාවක් වෙනවා. සිතේ සැනසීම, විශ්වාසය, බවයේ නිරුද්ධත්වය, යහපත් ආත්මභාව මේ සියල්ල ම විනාශ කරනු ලබන ද්වේශය අපේ සිතේ ඇතිවන විට අපි ද එය නුවණින් දැන දුරු කරමු.

# පින් අනුමෝදන් වීම



**රේරුකානේ චන්දවිමල නා හිමි**

**අනුන් අනුමෝදන් කරවන, දෙන පින් සතුටින් පිළිගැනීම පින් අනුමෝදන් වීම ය. පත්තානුමෝදනා යනු ද එයට නමෙකි.**

පින් කැමැති සත්පුරුෂයෝ, ශ්‍රමණ, බ්‍රාහ්මණ, දුගී මගී යාචකාදීන්ට දන් දී පින් සිදු කර ගනිති. එයින් ඔවුන්ගේ කීර්තිය ද පැතිර යයි. ප්‍රතිග්‍රාහකයෝ ද ඒ පින්වතුන්ගේ ප්‍රත්‍යය ලබා සැපවත් වෙති. පර සම්පත්තිය නො ඉවසන ස්වභාවය වූ ඊර්ෂ්‍යාව සත්ත්වයන් තුළ දීර්ඝ කාලයක පටන් පැවත එන පාපයෙකි.

ඒ නිසා සැම දෙනාට ම දන් දෙන සත්පුරුෂයන්ට වන පුණ්‍යලාභය ගැන හා ප්‍රතිග්‍රාහකයන්ට වන ප්‍රත්‍යය ලාබය ගැන ද සතුටු විය නො හැකි ය. එබැවින් ඊර්ෂ්‍යා ඇතියෝ දායක, ප්‍රතිග්‍රාහක දෙපක්ෂයට ම නින්දා කරති. පින් අනුමෝදන් නො වෙති. ප්‍රතිග්‍රාහකයන්ට වන ලාභය ගැන අසත්පුරුෂයන් තුළ වඩාත් ඊර්ෂ්‍යාව ඇති වේ. එබැවින් ඔවුහු වඩාත් ප්‍රතිග්‍රාහකයන්ට නින්දා කෙරෙති. ලාභය වැළැක්වීමට තැත් කෙරෙති. පින් අනුමෝදන් වීම වනාහි ඊර්ෂ්‍යාවට ප්‍රතිපක්ෂ පුණ්‍ය කර්මයෙකි. එබැවින් එය ලැබිය හැක්කේ දායක ප්‍රතිග්‍රාහක දෙපක්ෂයට ඊර්ෂ්‍යා නො කරන්නා වූ සත්පුරුෂයන්ට පමණකි. යම් කිසිවකු පිනක් කොට අනුමෝදන් විය හැකි සත්පුරුෂයාට පින් අනුමෝදන් වීමේ කුසලය ලැබේ. අනුන් පිනක් කරනු දකින අසන කල්හි පින් නුදුන්නෝ ද ඒ පින අනුමෝදන් විය හැකි ය. කෙනෙකු භික්ෂූන්ට දන් දෙනු දුටු කල්හි "මේ සත්පුරුෂයා දන් දී පින් සිදු කර ගන්නේ ය. මොහු නිසා භික්ෂූන් වහන්සේ ද සුවපත් වන්නාහ. මොහු ද පින් සිදුකර ගනී වා. භික්ෂූන් වහන්සේ ද මොහු නිසා සුවපත් වෙත්වා"යි සිතන තැනැත්තා හට පින් අනුමෝදන් වීමේ පින ලැබේ.

පින් අනුමෝදන් වීමෙන් වන්නා වූ කුසලය අනුමෝදන් වන කුසලයාගේ කුඩා මහත්කමේ සැටියට ද, අනුමෝදන් වන තැනැත්තා කෙරෙහි ඒ අවස්ථාවේ දී ඇති වන ශ්‍රද්ධා දී ධර්මයන්ගේ සැටියට ද කුඩා මහත් වේ. එහි විපාකය පරදත්තූපජීවික ප්‍රේතයන්ට හා ඇතැම් භූතයන්ට එකෙණෙහි ම ලැබේ. සෙස්සන්ට සුදුසු අවස්ථාවල දී ලැබේ.


**බෞද්ධයාගේ අත්පොත ඇසුරෙනි.**

# සැබෑ උපාසකයා ප්‍රඥාවන්තයෙකි



**උපාසකයා යනු කවරේ ද යනුවෙන් නිශ්චිතව ම හඳුනාගත හැකි සාධක රැසක් ත්‍රිපිටක සාහිත්‍යයේ විද්‍යාමාන වේ. බොහෝ අටුවා ග්‍රන්ථවල ද උපාසක භූමිකාව ධර්මානුකූල ව විග්‍රහ කර ඇත. මේ අතර පරමත්ථජෝතිකා නම් වූ ඛුද්දක පාඨ අට්ඨ කථාව ප්‍රමුඛ වේ. එහි සඳහන් අන්දමට බෞද්ධ උපාසකයා අර්ථ ගන්වා ඇත්තේ බුදුරජාණන් වහන්සේ ඇසුරු කරන නිසා, බුදුරජාණන් වහන්සේ වදාළා වූ ශ්‍රී සද්ධර්මය පයිරුපාසනය කරන නිසා, ආර්ය සඟරුවන භජනය කරන නිසා උපාසක නම් වන බවයි.**

බුදු සිරිත අනුගමනය කරමින්, නව අරහාදී බුදු ගුණවලට අවනත වන්නා ඒ අනුව චරිතය සකස්කරගත් උපාසකයෙකි. ඒහි පස්සික ආදී දහම් ගුණ ආවර්ජනා කරමින්, ආර්ය දහම් මගේ ගමන් කරන්නා බෞද්ධ උපාසකයෙකි. බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවක ආර්ය සංඝ සමාජයට අනුව සංසාර විමුක්තිය පිණිස උජුපටිපන්න මාවතට පිළිපන් තැනැත්තා බෞද්ධ උපාසකයෙකි.



හෝමාගම පුරාණ විහාරාධිපති
පළාත් සහකාර අධ්‍යාපන
අධ්‍යක්ෂ (පිරිවෙන්)
**මාදෝවිට වජිරබුද්ධි හිමි**

උපාසකයා යනු කවරේද? උපාසකයා සිල්වත් ගුණවත් අයෙකු වන්නේ කෙසේද? යන කාරණය මහානාම ශාක්‍යයා හමුවේ අප බුදුරදුන් පැහැදිලි කළ සේක. යමෙක් යම් දිනක සිට බුදුන් සරණ ගියේ ද, දහම් සරණ ගියේ ද, සඟ සරණ ගියේ ද එපමණකින් ම හෙතෙම උපාසකයකු බවට පත් වේ. එසේ ම යම් දිනක සිට උපාසකයා ප්‍රාණඝාතයෙන් වළකී ද, එසේම සොරකමෙන්, කාම මිථ්‍යාචාරයෙන්, මුසාවාදා දෙඩීම, සුරාපානයෙන් වැළකුණේ වේ ද, මෙපමණකින් උපාසකයා සිල්වත්, ගුණවත් අයෙකු බවට පත්වන බව ද, අංගුත්තර නිකායේ මහානාම සූත්‍රයේ සඳහන් වේ. මේ අනුව බෞද්ධ උපාසක භූමිකාවේ සමාරම්භය තිසරණ සහිත පංචසීල ප්‍රතිපදාව මත පදනම්ව සැකසී ඇත.

බෞද්ධ උපසකයා සතු තවත් අචල ගුණාංගයක් නම්, අචල ශ්‍රද්ධාවෙන් සමන්විත වීමයි. හෙතෙම නිත්‍යශීලය වූ ආර්යකාන්ත පංචශීල ප්‍රතිපදාව සුරක්ෂිත කරන අතර, අමූලිකා ශ්‍රද්ධාව නොව ප්‍රඥාව සමඟ මුහුකුරා දිවයන ආකාරවතී ශ්‍රද්ධාව වර්ධනය කර ගැනීමට වෑයම් කරයි.

නව අරහාදී බුදුගුණ සිහි කරමින් බුද්ධානුස්සති භාවනාව ප්‍රගුණ කරන අතර, ධර්ම ඥානයෙන් පොහොසත්ව අනිත්‍යග, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණ ධර්මය මෙනෙහි කරමින් එයට විෂය වූ විපස්සනා භාවනාව ද ප්‍රගුණ කරයි. තම ශ්‍රද්ධාව සමඟ ප්‍රඥාවට විෂය වූ කරුණු කෙරෙහි සැබෑ උපාසකයා අනුධර්මචාරී ව හැසිරෙන බව බුදුදහම සනාථ කරයි.

පංච නීවරණ ධර්මයන් දුරු කිරීමට සැබෑ උපාසකයා පිළිපන්නේ වෙයි. හෙතෙම නිතර සාවධාන ව ධර්මය ශ්‍රවණය කරයි. ව්‍යක්ත, විනීත විශාරද සිල්වත් මහා සංඝයා වහන්සේ ඇසුරු කරයි. ධර්ම සාකච්ඡා කරයි. දහම් ගැටලු නිරාකරණය කරගනිමින් විචිකිච්ඡා හෙවත් සැකය දුරු කරගනී. විශේෂයෙන් බෞද්ධ උපාසකයා පොහොය දින අෂ්ටාංග උපෝසථ ශීලය සමාදන් ව එය සුරක්ෂිත කරයි. ලාභ සත්කාරවලින් තොරව ධාර්මික දිවි පෙවත භජනය කරයි.

අෂ්ටාංග උපෝෂථ ශීලය සමාදන් වන සැබෑ උපාසකයා බුදුරජාණන් වහන්සේ තහනම් කොට වදාළ දෙතිස් කතාවලින් වැළකිය යුතු බව මජ්ඣිම නිකායේ චූලසකුළුදායී සූත්‍රයේ සඳහන් වේ. තහනම් කළ දෙතිස් කතා නම්, රජුන් පිළිබඳ කතා, සොරුන් මහ ඇමතිවරු පිළිබඳ කතා යුද්ධ, ආහාරපාන, වස්ත්‍ර, සයනාසන, මල්මාලා, සුවඳ, ඥාති, යාන වාහන, ජනපද ස්ත්‍රී පුරුෂ කුමාර කුමාරි, විවිධ වස්තු ලෝකාරම්භ මහා සමුද්‍ර මෙසේ සිදුවන්නේ ය. යනාදී කතාවලින් වැළකිය යුතු ය. මෙම කරුණු දෙතිස දීඝ නිකායේ කේවඩ්ඩ සහ ලෝහිච්ච යන සූත්‍රවල ද අවධාරණය කර ඇත. මෙම දෙතිස් කතාවලින් වළකින ශ්‍රද්ධාවන්ත උපාසකයා සීල සමාධි ප්‍රඥා විමුක්ති ඥාන දර්ශනාදී මෙලොව සහ පරලොව උභයාර්ථ සිද්ධිය සැලසෙන කතාවල නිරතවීම බුදු දහම අගය කර ඇත.

සැබෑ උපාසක උපාසිකාවෝ මෙලොව මෙන්ම පරලොව පිළිබඳව හැඟීමෙන් අවංකව ක්‍රියා කරති. සිත, කය, වචනය යන තිදොර සංවර කරගනිති. තිදොරින් සිදුවිය හැකි ප්‍රාණඝාතාදී දස අකුසල කර්මපථවලින් විරමණය වෙති. මුසාවාදාදී පරොස් බස් නොදෙඩති. මිථ්‍යා දෘෂ්ටියෙන් වැළකී සම්මා දිට්ඨිය පූර්වාංගම කොට ජීවත් වෙති. බෞද්ධ ආර්ය මාවතේ පළමු පියවර යහපත් නිවැරදි දැකීම හෙවත් සම්මා දිට්ඨියයි. සම්මා දිට්ඨිය නිසාම පරලොව පුනර්භවය විශ්වාස කරති. විශේෂයෙන් පව් කිරීමට ලජ්ජාව, බිය පූර්වාංගම කොට ජීවත් වෙති.

මෙම හිරිඔතප්ප දෙක දේවධර්ම ලෙස දේවධර්ම ජාතකයේ සඳහන් කොට ඇත. තිරිසන් සතුන් පවා ධර්ම ශ්‍රවණයට තම සවනත යොමු කර තිරිසන් ආත්මවලින් මිදී දිව්‍ය මනුෂ්‍ය ආත්ම බව ලබාගත් ආකාරය රසවාහිනීය, සද්ධර්මාලංකාරය වැනි පැරණි බණ කතා පොත්වලින් තොරතුරු වාර්තා වේ. සැදැහැවත් මනුෂ්‍යයන් ගැන කවර කතා ද? පන්සියයක් වවුලන් සුමදුර ධර්ම දේශනාවකට නිමිත්ත මෙහෙයවා ක්‍රියා කිරීම නිසා එම වවුල් ආත්මයෙන් මිදී මිනිස් ලොව ඉපිද මහණ වී සංසාර දුකින් අත්මිදුණු පුවතක් ගම්පොළ යුගයේ ලියවුණු සද්ධර්මාලංකාරයේ පංචසතික භික්ෂු පුවතින් අනාවරණය වේ. වළගම්බා රාජ්‍ය සමයේ හටගත් බැමිණිතියා සාය නම් දෙළොස් අවුරුදු දුර්භික්ෂ සමයේ පවා ශ්‍රද්ධාවන්ත උපාසක උපාසිකාවෝ මහ රහතුන් විෂයයෙහි දාන මාන ආදී පූජා කර සංසාර විමුක්තිය ලබාගත්හ.

බුදු දහමේ විස්තර වන සැබෑ සැදැහැවත් සැබෑ උපාසකයා සතු අන්‍යයක සාධාරණ තවත් ලක්ෂණයක් වන්නේ, ස්වල්පමාත්‍ර වරදේ පවා බියගන්නා සුළුව වාසය කිරීම වේ. සුළු වැරැද්ද පවා මහාසාවද්‍ය වරදක් ලෙස දකින උපාසකයා සංසාර ගමනට බාධා වන එබදු සුළු වැරැදිවලින් පවා වළකී. මෙය ත්‍රිපිටක සාහිත්‍යයේ බොහෝ සූත්‍රවල සඳහන් වන්නේ අණුමත්තේසු වජ්ජේසු භය දස්සාවි යනුවෙනි. මෙබදු ගුණ යහපත් වූ ආකල්ප සමුදායෙන් පිරි උපාසකයාගේ කීර්තිය දසදිග පැතිරේ. මෙලොව පරලොව සංසාර ගමන නිර්භය වේ. කාම වස්තූන් අධික ලෙස පිනවීමෙන් වළකින උපාසකයා ඇස්, කන්, නාසා ආදී ඉන්ද්‍රිය සංවර කර ගනී. සමාදන් වූ සිල්පද ආරක්ෂා කරනවා පමණක් නොව ඉන්ද්‍රිය සංවර සීලයෙන් ද, පිරිපුන් වේ. දැඩි තරහව හෙවත් ව්‍යාපාදය දුරු කරන මෙබඳු සිල්වතා සව්ලොව සතුන් වෙත ජීව අජීව පරිසරය වෙත, කරුණා දයාව පතුරුවා හරී. සිතේ උදාසීනතාව අත්හරින සැබෑ උපාසකයා සිත කලබල කරන, නොසන්සුන් කරන ක්‍රියා සහමුලින් දුරු කරයි. නිතර සමථ විදර්ශනා භාවනා ප්‍රගුණ කරයි. සැක සංකා දුරු කරයි. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්මවිහරණ ප්‍රගුණ කරන සැබෑ උපාසකයා දිවි හිමියෙන් ත්‍රිවිධ රත්නය සුරක්ෂිත කරයි. ත්‍රිවිධ රත්නය සරණ පරායන උපාසක උපාසිකා පිරිස මුළු ජීවිතයම ඒ වෙනුවෙන් කැප කරයි.

> **සැබෑ උපාසක උපාසිකාවෝ මෙලොව මෙන්ම පරලොව පිළිබඳව හැඟීමෙන් අවංකව ක්‍රියා කරති. සිත, කය, වචනය යන තිදොර සංවර කරගනිති.**

ආර්ය මාවතට බුදුන් වදාළ අරහත්ත ප්‍රතිපදාවට පිළිපන් උපාසකයා ක්‍රියා කළ යුතු ආකාරය ද ථේරගාථා පාලි මහා කච්චාන ථේර ගාථාවේ සඳහන් කර ඇත. බාහිර අරමුණු විෂයෙහි යොමුවන උපාසකයා ඉන්ද්‍රිය පාලනය කර ගැනීමට අපහොසත්වුවහොත් බාහිර කෙලෙස් ප්‍රවාහයට ගොදුරු වේ. මේ බුදු දහමේ විස්තර වන්නේ ඕඝ යනුවෙනි. කාම ඕඝ, භව ඕඝ, දිට්ඨි ඕඝ, අවිජ්ජා ඕඝ යනු මෙමු සතර ඕඝ වේ. කාමයට, භවයට ගිජුවීම, මිථ්‍යාදෘෂ්ටියට පක්ෂපාතී වීම, අවිද්‍යාව හෙවත් සංසාරය යථාපරිදි නොදැනීම නොදැකීම ආදී කරුණු විෂයෙහි අතරමං වන උපාසකයාගේ සංසාර දුක්ඛ දෝමනස්ස සංවර නොවේ. පාලනය නොවේ.

එබැවින් විශේෂයෙන් උපාසකයා වෙත බුදුරජාණන් වහන්සේ උපදෙස් දෙනු ලබන්නේ ඇස් ඇත්තේ නමුත් අන්ධයකු මෙන් වාසය කළ යුතු වේ. කන් ඇත්තේ නමුත් බිහිරකු සේ විය යුතු ය. නුවණ ඇත්තේ නමුත් අඥනයකු සේ ක්‍රියා කළ යුතු ය. නොකළ යුත්තේදී මර ඇඳක හෝනා අයෙකු මෙන් නිහඬ ව කාලය ගත කළ යුතු බව මහාකච්චාන ථේරගාථ පාලියේ විස්තර වේ.

විලෙහි හටගන්නා පියුම එම විලෙහි ඇති මඩ ගොහොරුවේ නො ගැටී උඩට එසවී යන්නා සේ බෞද්ධ උපාසකයා පද්මාකාර සමාජයේ විකසිත පියුමක් බඳු පුද්ගලයකු වන්නේ ය. සියලු පව් දුරු කරන්නේ ය. ප්‍රබුද්ධ මනසකින් ලෝකය අවලෝකනයකිරීමේ ගැඹුරු විඥනයක් බෞද්ධ උපාසක සමාජ ස්ථරය තුළ තිබේ. එදා බුද්ධ කාලීන භාරතයේ බොහෝ ගෘහස්ථ උපාසකයෝ සෝතාපන්න වූහ. වෙනත් මාර්ග ඵල ආදිය අවබෝධ කර ගත්හ. මේ අනුව බෞද්ධ උපාසක භූමිය අර්ථවත් චරිතයක් බව පැහැදිලි ය.

**හේමමාලා රන්දුනු**

## චූල සුභද්‍රා

අනේපිඬු සිටුතුමාට චූල සුභද්‍රා, මහා සුභද්‍රා, සුමනා යැයි දියණියන් තිදෙනෙක් වූහ. එයින් චූල සුභද්‍රා උග්ග නම් සිටුවරයාගේ පුතාට විවාහ කරදෙන ලදී. උග්ග සිටුතුමාගේ පවුලේ අය නිගන්ඨනාත පුත්තගේ දායකයෝ වූහ. තම නිවසේ දානයට පැමිණි නිගන්ඨයන්ට දානය බෙදීමට තබා ඔවුන් දැකීමට පවා ඇය අකමැති වූවා ය. එයට හේතු විමසූ විට ඇය ඉතා මිහිරි ගීයෙන් මහා සංඝරත්නයේ ගුණ වර්ණාවක් කළා ය. එයින් පැහැදීමට පත් උග්ග සිටුතුමා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නයට දානයක් දීමට අවස්ථාව ලබා දුන්නේ ය. බුදුරාජාණන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් වූ මහා සංඝරත්නය උදෙසා මහා දානයක් පිදුවා ය. මෙහිදී බණ ඇසූ උග්ග සිටුතුමා ඇතුළු ගම්වැසි ජනතාවද තෙරුවන් සරණ ගියහ.

**ගොඩකවෙල සුචිත්ත හිමි**
02 ශ්‍රේණිය
ශ්‍රී සුමණ සාමණේර ආයතනය
හඳපානාගල



## අම්මා

ලොවක් අභියස සිටගතිද්දී දෑත දිගුකර ළංවෙලා
දිනක් කඳුලින් දුක ගෙනෙද්දී ළංව උණුහුම පුදකලා
රැයක් අඳුරේ යැයි සිතද්දී ළඟට විත් දිවි එළිකළා
මවක් යනු අර්ථය සොයද්දී නුඹ මගේ ලොව රජවෙලා

මාස දහයක් කුසේ රඳවා දිවිය නුඹ ළඟ තද කරන්
නිතර මා සුවයෙන් තබන්නට දිරිය හිතයට රජ කරන්
මාව රැකගත් මැණියනි නුඹ මගේ ලෝකය එළි කරන්
අනාගතයේ විශ්වයේ බැබළෙනව නුඹෙ දූ සත්තකින්

එළිය දුටු ද මා ලොවේ නුඹ හිනැහුණාලූ සෙනෙහසින්
කඳුළු දුටු ද මාගෙ දෙනෙතේ නුඹත් ඇඩුවලූ මට හොරෙන්
වැරැදි කළ ද හරි මගට මා ගෙනගියාලූ වීරියෙන්
වඳින්නම් මැණියනි දිනෙක දී ඔටුනු පළඳා හදබැතින්

**ඕෂධී කණිකා ශ්‍රී විද්‍යාතිලක**
11 ශ්‍රේණිය
ආනන්ද මෛත්‍රිය ජාතික පාසල
බලංගොඩ

## මහියංගණ සෑ රජාණෝ

බුද්ධත්වයෙන් නමවන මස ගෞතම බුදුරජාණන් වහන්සේ පළමුකොට මහියංගණයට වැඩම කොට, වත්මන් සෑය පිහිටි ස්ථානයෙහි අහසේ වැඩසිටිමින් යක්ෂයන් දමනය කළ සේක. උන්වහන්සේ සුමන සමන් දෙවිඳුන්ගේ ඉල්ලීම පරිදි කේශ ධාතූන් වහන්සේ ලබාදුන් අතර, ඒ දිව්‍ය රාජයා බුදුන්රදුන් වැඩ සිටි ස්ථානයේ සෑයක් ඉදිකළ සේක.

**වැල්ලවායේ සුබෝධ හිමි**
1 ශ්‍රේණිය
ශ්‍රී සුමන සාමනේර ආයතනය – හඳපානාගල

## පෙර කුසලය

ගෞතම බුදුරදුන්ගේ සිරිපා සිඹ, ලක් දෙරණ සිව් කොන තෙක් පෝෂණය කරන කළු, කැලණි, වලවේ හා මහවැලි යන සිව් මහා ගංගා පෙරටුකර ගනිමින් විරාජමාන ව වැඩ සිටින, ඉන්දීය සාගරයේ මුතු ඇටය නමින් විරුදාවලිය ලත් උදාර භූමිය ශ්‍රී ලංකාව යි.

උතුම් මානුෂීය ගුණාංගයන්ගෙන් හෙබි ජනයාගෙන් සමන්විත ලක්දිව තුළ ස්වභාවික සම්පත්, සංස්කෘතික උරුමයන්, ජෛව විවිධත්වයෙන් අනූන ස්වභාව සෞන්දර්ය සැමගේ නෙත් සිත් පැහැර ගන්නේ නො පැකිළව ය. ගෞතම බුදුරජාණන් වහන්සේගේ උතුම් බෞද්ධ දර්ශනයට අනුව සැවොම ජීවත් වන්නේ එකිනෙකා හා සහයෝගයෙනි. සහජීවනයෙනි. නිල්වන් දිය දහරා හරිත වර්ණ තුරු වන පෙත් මතින් ගලා ගොස් මහ මුහුද කරා ඇදී යන ගංගාවෙන් ද, සොබා දහමේ අපූරු මහිමය ද ලක් මාතාවටත්, ඇයගේ දූදරුවන් වන අපටත් ලැබී ඇත්තේ පෙර කුසලයකින්ම ය.

**පී.ඩී.එම්.එන්. නිර්මාල්**
අවසාන ශ්‍රේණිය
ශ්‍රී ඥාණින්ද දහම් පාසල – කුරුණෑගල





## දහම් පාසල

බෞද්ධ දරුවන් වන අප විධිමත් අධ්‍යාපනයක් පාසලෙන් ලබා ගන්නා අතර ම හරවත් ගුණ දහම් ඉගෙන ගැනීමට පිය නගන්නේ දහම්පාසල වෙතට ය. ලංකාව විදෙස් ආක්‍රමණවලට යටත් ව තිබූ කාලයේ විධිමත් අධ්‍යාපන කටයුතු පාසල මූලිකව සිදුවූ අතර, ඊට පෙර ශ්‍රී ලංකාවේ සියලු ම අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක වූයේ පන්සල කේන්ද්‍ර කොටගෙන ය. පන්සලෙන් ආරම්භ වූ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු අද වන විට අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ විධිමත්ව සිදුවෙයි. හරවත් ගුණදහම් වලින් දරුවා පෝෂණය කර ගැනීම දහම් පාසල ආරම්භ කළ බව අපි දනිමු. ශ්‍රී ලංකාවේ දහම් පාසල් සංස්කෘතිය ශ්‍රී ලංකාවේ බෞද්ධ දූවා දරුවන්ගේ සිත් තුළ බුද්ධ ධර්මය ගැන පමණක් නොව යහපත් ගුණාංග ගැනත් වෙනද නොවූ උනන්දුවක් ඇති කළේ ය. මෙම දහම් පාසල් අධ්‍යාපනය තුළින් බෞද්ධ දරුවන් වන අපහට ලැබෙන ප්‍රයෝජන බොහෝ ය.

**ටමිත් අබේවර්ධන**
10 ශ්‍රේණිය
සුවිශුද්ධාරාමය දහම් පාසල
වැල්ලවත්ත

# සදහම් අරණ

සංස්කරණය
**නයනා නිල්මිණී**



## මගේ රට

මගේ රට ශ්‍රී ලංකාව යි. එය ඉන්දියන් සාගරයේ පිහිටි සුන්දර දූපතකි. ලස්සන අපේ රටේ සහෝදර විවිධ ජාතීන් ලෙස සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, යුරෝපීය ජාතීන් ජීවත් වේ. මගේ රටේ ඉතා වැදගත් පෞරාණික ස්ථාන තිබේ. මෙම ආකර්ෂණීය ස්ථාන නැරඹීම සඳහා විදේශ ජාතිහු බොහෝ සේ පැමිණෙති. මේ සුන්දර අපේ රට ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙස ප්‍රසිද්ධියට පත්ව ඇත.

**ඒ.පී. චානිකා ලක්මාලි**
5 වන ශ්‍රේණිය
විජිත ප්‍රාථමික විදුහල
පොළොන්නරුව

## ආදර්ශය ලැබ ගනිමු

අපේ බුදුරජාණන් වහන්සේගේ අගසව් දෙනම සැරියුත්, මුගලන් මහ රහතන් වහන්සේ ය. උන්වහන්සේලා පැවිද්දෙන් පසු ගතකළ ජීවිතය බෙහෙවින් ම ආදර්ශවත් ය. ඒ චරිත දෙකෙන් අපට උගත හැකි බොහෝ දේ ඇත. සසර රැස් කර ගත් අපමණ කුසල් බලයෙන් බුදු සසුනෙහි අගසව් පදවි ලැබූ උන්වහන්සේලාගේ ජීවන චරිත අප ජීවිත ආලෝකවත් කර ගැනීමට මනා පූර්වාදර්ශයක් සපයයි. වගකීම් නිසි පරිදි දැන හැඳින ක්‍රියා කිරීමත්, ගුරු ගෞරවයත්, කල්‍යාණ මිත්‍ර ආශ්‍රයත්, නිහතමානී චාම් පැවැත්මත්, පරාර්ථ සේවාවත් ඒ අතර ප්‍රධාන ය.

**චන්දිමා ප්‍රියදර්ශනී**
08 ශ්‍රේණිය
ශ්‍රී ගෝතම දහම් පාසල

## කලා වැව

රජරට හඳුන්වන නම් කිහිපයක් වෙයි. වැව් බැඳි රාජ්‍ය, නුවර කලාවිය එයින් කිහිපයකි. නුවරවැව, කලාවැව, පදවිය වැව යන වාපී කර්මාන්ත පිහිටා ඇති නිසා නුවර කලාවිය යන නාමය පට බැඳී ඇති අතර, කලාවැව එතරම් ම වැදගත් වූ ද, විශාල වූ ද, ප්‍රදේශයක් බව අපට වටහා ගත හැකි වෙයි. අවුකන බුදු පිළිමය ඉදිකර තිබෙන හෙයින් මෙහි අගය තවත් වැඩි වී තිබේ.

කලාවැව යන පොදු නාමය වැව නිසා යෙදී ඇති අතර, මුළු භූමියම ඒ නමින් හැඳින්වීමට ජනතාව පුරුදු වී සිටිති. ධාතුසේන රජතුමා මේ වැව තැනීමට මුල් වූ බව ඉතිහාසගත ප්‍රකට කතාවකි. ඊට පසුබිම් වූයේ එම රජතුමාගේ කාලයේ සිදුවීමක් යයි මුඛ පරම්පරාගතව පවතින තොරතුරුවලින් අනාවරණය වෙයි.


**ඩබ්.ජී. යසන්තා ප්‍රදීපිකා**
13 ශ්‍රේණිය
ශ්‍රී රතනසාර පිරිවෙන – බද්දේගම

### ගිරා පවුල



**වල්පොල සුබෝධ හිමි**
01 වන ශ්‍රේණිය
විද්‍යාවාස මහා පිරිවෙන
මීරිගම

### මගේ නංගී



**ඉසුරු සම්පත්**
10 ශ්‍රේණිය
සුවිශුද්ධාරාම දහම් පාසල – වැල්ලවත්ත

## බුදුසරණ සදහම් අරණ ළමා සමාජය

**සම්පූර්ණ නම** :– ....................................................

**පාසල / දහම් පාසල** :– ....................................................

**ඉගෙනුම ලබන ශ්‍රේණිය** :– ....................................................

**ලිපිනය** :– ....................................................

**දුරකථන අංකය** :– ....................................................

**අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ සදහම් අරණ පිටුවේ පළවේ. සංස්කාරිකා, සදහම් අරණ ළමා සමාජය, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස්, කොළඹ.**

### තිස් වසරක යුද්ධය මැද නාගදීපය රැකගත් නා හිමියන්ගේ කතාව

8 කොටස

# දඟකාරයින්ට පාඩමක්

**නාගදීපයේදී නවදගල පදුමකිත්ති හිමි නමින් පැවිදි වූ පද්මසිරි මැන්දිස්ගේ දඟකාරකම්, දඩබ්බරකම් නම් අඩු වූයේ නැත. දෙමළ කණ්ඩායම් 1975 වසරෙන් පසුව උතුරේ තැන් තැන්වල කල කෝලාහල නිසා නාගදීපයේ ද නාවික හමුදා කඳවුරක් ස්ථාපනය කරන ලදී. ඒ දහසක පමණ පිරිසකි.**

එයින් බොහෝ නිලධාරීන් කතා කෙළේ ඉංගිරිස් බසිනි. ඔවුන් ගමන් කළේ කඩිසර ලීලාවෙනි. ප්‍රිය මනාප ය. පොඩි හාමුදුරුවන් ඔවුන් දෙස බලා සතුටු වූ අතර, නාවික නිලධාරීන් ද පොඩි හාමුදුරුවන් සමඟ ඉතා ඉක්මනින් මිතුරු විය. නායක හාමුරුවන් පහර දුන් විට පොඩි හාමුරුවන්ට තෙල් ගෑවේ නාවික හමුදා නිලධාරීන් විසිනි. නාවික හමුදා නිලධාරීහු හවසට හොඳ බත්වේලක් ආහාරයට ගනිති. එහි ඉස්සන් වරදින්නේ නැත. පදුමකිත්ති හිමියෝ ද හවසට ගොස් ඉස්සන් සමඟ බත් වළඳති. පදුමකිත්ති හිමියන්ට රාත්‍රී කුසගින්නේ සිටීම අපහසු වන්නේ දිවා කාලය පුරාම සිදු කරන දඟකාරකම් නිසා ය. මේ නිසා දිනපතා ම කඳවුරට ගොස් රාත්‍රී ආහාර ලබාගන්නට පදුමකිත්ති හිමියෝ පුරුදුව සිටියහ. ඒ විනාඩි දෙක තුනක කාලයකදී වන අතර, ආහාර ලබා ගත්තේද සිටගෙන ය.

පදුමකිත්ති හිමියන් නාවික හමුදාව සමඟ වැඩි වශයෙන් මිතුරු වීමට තවත් ප්‍රධාන හේතුවක් තිබුණි. ඒ විහාරස්ථානයේ ඒ වන විට ස්ථිරව නේවාසික ව සිටියේ ලොකු හාමුදුරුවන් සහ පදුමකිත්ති හිමියන් පමණක් වූ නිසා ය. පදුමකිත්ති හිමියන් සමඟ පැවිදි වූ රත්දෙඹේ සෝමකිත්ති හිමියෝ සහ නාගදීපයේ සිටි අනෙක් වැඩිමහල් ස්වාමීන් වහන්සේ ද ඒ වන විට අධ්‍යාපනික කටයුතු

> කළුවරේ ගසෙන් බිමට බැසගත් පොඩි හාමුදුරුවෝ, "ටෝච් එළියක් ආව වගේ දැක්ක, ලොක්ක ආවෙ නෑ නේද?ආ මේ පොල් ගෙඩිය ගන්න" යැයි කියමින් අඳුරේ නොපෙනෙන ලොකු හාමුදුරුවන්ට පොල් ගෙඩිය දිගු කෙළේ ය.

පිණිස නේවාසික ව පිරිවෙන් අධ්‍යාපනය ලබමින් සිටියහ.

පිරිවෙන් නිවාඩු සමයේ එම ස්වාමීන් වහන්සේ දෙනම පැමිණීම පදුමකිත්ති හිමියන්ට සතුට උපදවන්නක් විය. මේ ස්වාමීන් වහන්සේ තිදෙනාටම රාත්‍රියේ නිරාහාරව සිටීම ඉතාම අපහසු කාර්යයක් විය. නාවික හමුදා කඳවුරට ගොස් සවස ඉස්සන් සමඟ බත් ආහාරයට ගැනීමට පදුමකිත්ති හිමියන් උත්සාහ කළත් අනෙක් හිමිවරුන් දෙනම ඊට බිය වීම නිසා එම කාර්යය ක්‍රියාත්මක නොවුණි.

මේ නිසා තිදෙනා වහන්සේ ම රාත්‍රියට රොටී සෑදීම කළහ. පදුමකිත්ති හිමියෝ මුළුතැන්ගෙයින් පිටි රැගෙන එති. මුහුදු වතුර ටිකක් දමා ඇනූ විට ලුණු ප්‍රශ්නය ද ගැටලුවක් නැත. පොල් සපයා ගැනීම පිණිස ආවාසයට ඈතින් පිහිටි පොල් ගස් තෝරා



නාගදීපයට පැමිණි නාවික හමුදාව සමඟ පදුමකිත්ති හිමියන්...

ගෙන තිබුණි. පදුමකිත්ති හිමියන් සහ රත්දෙඹේ සෝමකිත්ති හිමියන් ඇහිපිල්ලන් ගහන්නටත් පෙර අනෙක් හාමුදුරුවන් පොල් ගසට නැඟ අවසන් ය. ඒ තරම් හැකියාවක් උන් වහන්සේට තිබුණි. මේ කාර්යය දින ගණනාවක් තිස්සේ ඔවුහු කළහ. පිටි අඩුවීම ගැන නායක හාමුදුරුවන්ට දැන ගන්නට තිබුණු නමුත් උන් වහන්සේ ඒ ගැන එතරම් තැකීමක් කෙළේ නැත.

එහෙත් පදුමකිත්ති හිමියන්ගේ ක්‍රියාකාරකම් ගැන හොඳින් දන්නා නිසා නායක හාමුදුරුවෝ විපරමින් සිටියහ. නායක හාමුදුරුවන් සැතපෙන්නට ගිය පසුව පොඩි හාමුදුරුවරු රොටී පිච්චීම පිණිස ගියහ. පොල්ගහට නැඟ පොල් ගෙඩියක් කඩා ගත් ගසට නැගුණු පොඩි හාමුදුරුවෝ ගෙඩිය බිමට අත නොහැරියේ ශබ්දයට ලොකු හාමුදුරුවන් අවදිවන්නට ඉඩ තිබූ හෙයිනි. පොල් ගෙඩියේ නැට්ට කටින් අල්ලාගෙන උන් වහන්සේ ගසෙන් බසින්නට වූහ.

ඒ අතරේ එල්ල වූ විදුලි පන්දම් එළියෙන් පදුමකිත්ති හිමියන්ට සහ සෝමකිත්ති හිමියන්ට තරු විසිවිණි. නායක හාමුදුරුවන්ට එතනට වැඩම කරන්නට ගත වූයේ තත්පර කිහිපයකි.

"පදුමකිත්ති හිමියන්ට හා සෝමකිත්ති හිමියන්ට දන ගසා ගෙන සිටින ලෙස සෙමෙන් අණ කළ ලොකු හාමුදුරුවෝ අනෙක් හිමිනම ගසෙන් බසින තුරු බලා සිටියේ විදුලි පන්දම් එළිය ද නිවාගෙන ය. කළුවරේ ගසෙන් බිමට බැසගත් පොඩි හාමුදුරුවෝ, "ටෝච් එළියක් ආව වගේ දැක්ක, ලොක්ක ආවෙ නෑ නේද? ආ මේ පොල් ගෙඩිය ගන්න" යැයි කියමින් අඳුරේ නොපෙණුනු ලොකු හාමුදුරුවන්ට පොල් ගෙඩිය දිගු කෙළේය.

"ලොක්ක ගියේ නෑ ලොක්ක ඉන්නව" යැයි කියූ නායක හාමුදුරුවෝ පොල් ගෙඩියෙන්ම ගසට නැගුණු හාමුදුරුවන්ගේ පයට ගැසූහ.

තිදෙනා ම කැඳවාගෙන ගිය ලොකු හාමුදුරුවන්ගෙන් එදා රොටී වෙනුවට තිදෙනාටම වේවැල් කිහිපයක් කැඩෙන තුරු වේවැල් පහර වැදුණි.

'ශාසනයේ පැවිදි වෙනකොට කියපු සිල් පද අමතක වුණාදැයි' අසමින් ලොකු හාමුදුරුවෝ පහර දුන්හ.

මෙලෙසින් කාලය ගතව ගොස් පදුමකිත්ති හිමියන්ට වයස අවුරුදු 18 වන විට ලොකු හාමුදුරුවන් වේවැල් පහර දීම නවත්වන ලදී. ඒ දඩබ්බර කම් නොකරන ලෙස අවවාද දෙමිනි.

එහෙත් පදුමකිත්ති හිමියන්ට සාමණේර භික්ෂුවක් වුවත් තමන් තරුණයකු යැයි සිතුණි. උන් වහන්සේ අනෙක් අය සමඟ රණ්ඩුවට නොගිය ද



අනෙක් සාමාන්‍ය ක්‍රියාකාරකම් නම් අඩුවක් වූයේ නැත. මේ නිසා ලොකු හාමුදුරුවන් වේවැල් පහරදීම නැවැත්වුව ද පසුව දඩබ්බරකම් කළ විට බෙල්ලට අතින් පහර දෙන්නට පටන් ගත්හ.

දිනකට අවම වශයෙන් බෙල්ලට පහර 10ක් පමණ වැදීම නිසා පදුමකිත්ති හිමිගේ බෙල්ලේ වේදනාවක් හට ගැනුණි. එම නිසා උන් වහන්සේ ඇතැම් විට වැඩම කරන විටදී බෙල්ල පැත්තකට වැනුණි. එය දුටු නායක හාමුදුරුවන් එය නොකරන ලෙස අවවාද කළහ.

"මොකද ඔය බෙල්ල වැනිල්ල නවත්තන්නේ නැද්ද? ආයෙත් වැනුවොත් බලාගෙනයි කටුස්සා වගේ" කියමින් ලොකු හාමුදුරුවන් දිනක් අවවාද කරද්දීම පදුමකිත්ති හිමිගේ බෙල්ල පැත්තකට ගියේ ය. නායක හාමුදුරුවන් වැරෙන් බෙල්ලට පහර දුන්හ. එවිට බෙල්ල අනෙක් පැත්තට නැවුණේ ය. නායක හාමුදුරුවෝ ඒ පැත්තට ද පහර දුන්හ. එතැනින් බෙල්ල වැනිල්ල අවසන් විය.

නාගදීපයට පැමිණෙන ඥාති හිතවතුන්ට ගෙන යාම පිණිස දිවුල් කඩවා දීම නා හිමියන්ගේ සිරිත ය. ඒ කාර්යය පැවරෙන්නේ විහාරස්ථානයේ වැඩ කටයුතු කළ සිත්තදෙරේට සහ පදුමකිත්ති හිමියන්ටය. ගසට නගින සිත්තදෙරේ කෙක්කක ආධාරයෙන් ළංවීමට බැරි දිවුල් පළමුව කඩන්නේ අගට කම්බියක් දමා නැමූ දිග කෙක්කෙනි. පසුව තමන්ගේ අතේ දුරින් ඇති දිවුල් කඩා දමයි. බිම සිට පෝර උරයක් අල්ලමින් ඒවා එකතු කරනනේ පදුමකිත්ති හිමියන් විසිනි.

**(මතු සම්බන්ධයි)**

**තාරක වික්‍රමසේකර**

# ජයභූමියෙහි ඉදිවන සඳහිරු සෑය





*ජනපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හා වත්මන් අගමැති, එදා ජනපති මහින්ද රාජපක්ෂ මැතිතුමා චෛත්‍යයේ සර්වඥ ධාතූන් වහන්සේ හා නිධන්වස්තු තැන්පත් කිරීමේ අවස්ථාව.*

**වසර 40 ක් අන්‍ය ආගමික පාලනයක් සතුව තිබූ ශ්‍රී ලංකාව එක් සේසත් කර මුදවා ගැනීමේ විජයග්‍රහණයේ සංකේතයක් ලෙස දුටුගැමුණු රජතුමා රුවන්වැලි මහා සෑය ඉදිකරවීය. එය එදත් අදත් අපේ මහා ස්තූපයයි. 1980 සිට අපේ රටේ ත්‍රස්තවාදී යුද්ධයක් පැවතිණ. වත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ හා වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ සෘජු නායකත්වය හා මෙහෙයවීම මත ඒ යුද්ධය 2009 මැයි 19 වැනිදා විජයග්‍රහණය කිරීමට අපේ ආරක්ෂක හමුදාවලට හැකි විය.**

ථූපවංශයේ සඳහන් අයුරින් විශාල ස්තූප අපේ රට පුරා ඉදිවී ඇත්තේ මේ අයුරින් රට සැබෑ නිදහස හා ස්වෛරීභාවය ලැබූ අවස්ථාවල දී ය. ඒ අනුව යමින් ඒ යුද ජය සැමරීමත් එම යුද්ධයේදී ජාති, ආගම් භේදවලින් තොරව දිවි පිදූ සියලු දෙනා හට පින් අනුමෝදන් කිරීමත් අරමුණු කරගෙන 2009 දී ජනපති ලෙස සිටි මහින්ද රාජපක්ෂ මහතාගේ මග පෙන්වීම අනුව වත්මන් ජනපති එවකට ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාගේ පූර්ණ මෙහෙයවීම් හා අධීක්ෂණය ඇතිව මෙරට විශාලත්වයෙන් හතරවැනි චෛත්‍යය ලෙස අනුරාධපුරයේ මහ මෙවුනා උයනේ සඳහිරු සෑය' මහා චෛත්‍යය ඉදිවීම ඇරැඹිනි.

2010 නොවැම්බර් 22 වැනිදා එය ආරම්භ කළ අතර 2014 නොවැම්බර් 23 වැනිදා එහි ධාතු නිධන් කිරීම සිදුවිය.

අනුරාධපුරය ශ්‍රී මහා බෝධිය අසල පිහිටි දුටුගැමුණු රජ හා එළාර රජ මුහුණට මුහුණලා සටන් කර දුටුගැමුණු රජ ජයගත් ජය භූමියේ සඳහිරු සෑය ඉදිවීම ද විශේෂ ත්වයකි. එහි වැඩ කටයුතු දැන් වේගවත් අයුරින් සිදුවෙන අයුරු පසුගියදා එහි ගිය අපට දැකගත හැකි විය.

රුවන්වැලිසෑය එදත් අදත් අපේ රටේ විශාලතම හා උසම ස්තූපයයි. එහි උස අඩි 299 කි. බුදු රජාණන් වහන්සේගේ වැඩිම සර්වඥ ධාතූන් වහන්සේ ප්‍රමාණයක් තැන්පත් කර ඇති ස්තූපය ලෙස එදත් අදත් අපේ බෞද්ධ ජනතාව එයට ගෞරවය පුද පූජා පවත්වති. මහ සෑ රදුන්ට ගරු කිරීමක් ලෙස සඳහිරු සෑය එයට අඩි 18 ක් අඩුවෙන් එනම් අඩි 281 ක් උසින් යුක්තව ඉදිකිරීම කරනු ලැබේ.

අඩි 281 ක් උසට ඉදිවන මෙහි පළල අඩි 255 කි. වට ප්‍රමාණය අඩි 801 කි. සඳගිරිසෑය ඉදිවන සම්පූර්ණ භූමිය අක්කර 13 කි. වැලි මළුව අක්කර 6 ක් රූඩ් එකක් හා පර්චස් 30 ක් අයත්වේ. සලපතල මළුව අක්කර 4 ක් හා රූඩ් 2 ක් ආවරණය කරයි. චෛත්‍යයට පමණක් අයිතිවන මුළු භූමි ප්‍රමාණය අක්කරයක් හා පර්චස් 20 ක් වෙයි.

අටමස්ථානාධිපති පූජ්‍ය පල්ලේගම සිරිනිවාස නාහිමියන්ගේ, රුවන්වැලිසෑය චෛත්‍යාධිකාරී නුවර කලාවිය ප්‍රධාන සංඝනායක පල්ලේගම හේමරතන නාහිමියන් හා මිරිසවැටිය රජමහා විහාරාධිකාරී ඊතලවැටුණු වැවේ ඥානතිලක මාහිමියන් ප්‍රමුඛ මහා සංඝරත්නයේ අවවාද අනුශාසනා ඇතිව මෙහි සියලු ඉදිකිරීම් සිදු කෙරෙන බව යුද හමුදා ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ සිවිල් ඉංජිනේරුවරු පවසති.

ස්තූපය සම්පූර්ණ යෝධ ඉදිකිරීම සඳහා ගඩොල් ලක්ෂ 300 ක් සිමෙන්ති කොට්ට 150000 ක් වැලි කියුබ් 12300 ක් කළුගල් කියුබ් 50000 ක් ඒබීසී මිශ්‍රණය කියුබ් 20000 ක් අවශ්‍ය බව සිවිල් ඉංජිනේරුවන් ඇස්තමේන්තු කර තිබේ. සඳහිරුසෑය ඉදිකිරීම පිළිබඳව කරුණු දක්වන පුරාවිද්‍යා චක්‍රවර්ති මහාචාර්ය එල්ලාවල මේධානන්ද හිමියන් පවසන්නේ 21 වැනි සියවසේ ලෝකයේ ඉදිකෙරුණු විශාලතම හා සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කෙරෙන එකම දාගැබ මේ සඳහිරු සෑය වනු ඇති බවයි.

'සඳහිරුසෑය' යන්නෙහි තේරුම සඳමෙන් සෞම්‍ය හා හිරු මෙන් තේජස් බවින් යුක්ත රජුන් යන්න බවත් උන් වහන්සේ පැවසූහ. මේ පිළිබඳව කරුණු දක්වන පුරාවිද්‍යා කොමසාරිස් ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක මහතා පවසන්නේ මෙම ඉදිකිරීම අවුරුදු දහසකට වඩා වැඩි කාලයකට පසු ලෝකයේ රටවල් ඇතුළත සිදු කෙරෙන ඓතිහාසික ඉදිකිරීමක් බවයි.

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ථූප වංශයට අනුව මෙතරම් විශාල චෛත්‍යයක් පාදමේ සිට සම්පූර්ණයෙන් ඉදිකිරීම් කිරීමේ කර්මාන්තයක් අනුරාධපුර – පොළොන්නරු යුගයෙන් පසු සිදු කෙරී නැත. රුවන්වැලි සෑය, අභයගිරිය, ජේතවනාරාමය, මිරිසවැටිය ආදී මහා චෛත්‍යය ඉදිකර ඇත්තේ දුටුගැමුණු සමයේදීය. ඊට පසු පොළොන්නරුවේ රන්කොත් වෙහෙර හා කිරිවෙහෙර ඉදිවී ඇත. ඊට පසු රටපුරා විවිධ ප්‍රමාණයේ චෛත්‍ය ඉදිවුවත් සඳහිරු සෑය තරම් විශාලත්වයෙන් යුත් සර්වඥ ධාතූන් නිධන් කරන පාදමේ සිට ඉදිකරන චෛත්‍යයක් වසර 1600 කින් මෙපිට මෙරට ඉදිවී නැති බව පුරාවිද්‍යාඥයෝ පවසති. යුද හමුදාවේ සිවිල් ඉංජිනේරුවරු පවසන පරිදි මෙම චෛත්‍ය සඳහා ස්තූප ගඩොල් ලක්ෂ 310 ක් අවශ්‍ය වේ. මෙම සඳහිරු සෑය ඉදි කරන ගඩොල් සුවිශේෂී ස්තූප ගඩොල් ලෙස හැඳින්විය හැකි ය. එහි දිග අඟල් 16 කි. පළල අඟල් 8 කි. උස අඟල් 2 කි.

කර්මාන්තතයට අවශ්‍ය වැලි සියල්ල නාවික හමුදාව මගින් ලබාදෙන අතර කළුගල් ගුවන් හමුදාව මගින් ලබාදෙයි. පොලිසිය සිවිල් ආරක්ෂක බලකා නිලධාරීහු ශ්‍රම දායකත්වය සපයන අතර එකල ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මේ සඳහා රුපියල් දස ලක්ෂ 25 ක් ලබාදී තිබේ.

සර්වඥ ධාතූන් වහන්සේ හා නිධන් වස්තු චෛත්‍යයේ තැන්පත් කිරීමේ මහා පුණ්‍යෝත්සවය 2014 නොවැම්බර් 23 වැනිදා උත්කර්ෂවත් ලෙස

මහා නාහිමිවරු ඇතුළු මහා සංඝ රත්නයේ ආශිර්වාදය ඇතිව එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ හා වත්මන් ජනපති ගෝඨාභය රාජපක්ෂ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් සිදුවිය. රත්රන් වලින් නිම කළ බුදු පිළිමයක්, රත්රන් වලින් සැකසූ බෝධින් වහන්සේ නමක්, රන් පත් ඉරුවල ලියන ලද ත්‍රිපිටකය ද මෙහි තැන්පත් කෙරිණි.

මෙම සඳහිරු සෑයේ තවත් විශේෂ ත්වයක් වනුයේ අනුරපුර විශාලතම ශෛලමය කලාගාරයක් ද මෙම දාගැබ පරිශ්‍රයේ ඉදිකිරීමට නියමිත බැවිනි. සෑයේ සලපතල මළුව හා වැලි මළුව අතර ප්‍රාකාරයේ සතර දෙසට අඩි 400 බැගින් වූ ප්‍රදේශයේ ගලින් නෙළන ලද බෞද්ධ කැටයම්, දස පාරමිතා බුදු දහමේ විකාශය, ශාසන ඉතිහාසය මෙන් ම යුද්ධය අවසන් කිරීම දක්වා විවිධ අවස්ථා නිර්මාණය කිරීමට කටයුතු යොදා ඇත.

දැන් මෙහි ඉදිකිරීම් වලින් සියයට 70 ක් අවසන් අතර චූඩාමාණික්‍යය මැණික් ඔබ්බවා සකස් කිරීම ද දැන් සිදුවෙමින් පවතින බව මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමිපාණෝ පැවසූහ. චූඩා මාණික්‍යය හා රන්කොත ඉදිරි දිනවලදී දිස්ත්‍රික්ක 20 ක ජනතාවට වන්දනා කිරීමට අවස්ථාව සලසා දීමට ද කටයුතු යොදා ඇති බවත් දැන් චෛත්‍යයේ අඩි 97ක් උසට හතරැස් කොටුව දක්වා ඉදිකිරීම් අවසන් කර ඇති බවත් සඳහිරුසෑය ව්‍යාපෘති සම්බන්ධීකාරක 9 වැනි ඉංජිනේරු රෙජිමේන්තුවේ ලුතිනන් කර්නල් මොහාන් කුමාර මහතා පවසයි.

මෙම චෛත්‍යය ලබන වසරේ මැයි මාසයේ වෙසක් පසළොස්වක දින සිට ජනතාවගේ වන්දනා හා පූජා කටයුතු සඳහා විවෘත කිරීමට නියමිතය.

**නිහාල් පී. අබේසිංහ**

# ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නාහිමි


**පැලියගොඩ විද්‍යාලංකාර පිරුවනෙහි තෘතීය පරිවේණාධිපති ව වැඩවිසූ, කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝ නායක, සාහිත්‍යශූරී, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, උපාධ්‍යාය ධුරන්දර ලුණුපොකුණේ ධර්මකීර්ති ශ්‍රී ධර්මානන්දාභිධාන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ සැත්තෑ පස්වන ගුණානුස්මරණය ජූනි මස 22 වන දිනට යෙදී තිබුණි.**

1869 සැප්තැම්බර් 13 වැනි දින මෝදර ලුණුපොකුණේ දී ජන්ම ලාභය ලද නාහිමිපාණන් වහන්සේ ස්වකීය ජන්ම භූමියට ආසන්න ව පිහිටි කොටහේන දීපදුත්තමාරාමයෙහි ඇසුර ලද අතර, එහි විසූ වාදීභසිංහ මොහොට්ටිවත්තේ ගුණානන්ද නාහිමිපාණන් වහන්සේගේ ද මෙහෙයවීමෙන් බලබෝවේ රජමහා විහාරාධිපති මාබඩ ගුණරතන හිමියන්ගේ ආචාර්යත්වයෙන් ලුණුපොකුණේ රතනපාල නමින් ප්‍රවජ්‍යාව ලබා ඉනික්බිතිව පැලියගොඩ විද්‍යාලංකාර පිරුවනෙහි ආදිකර්තෘ ගණාචාර්ය රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහා ස්වාමින්ද්‍රයන් වහන්සේගේ සහ තච්ඡිෂ්‍යවර සාර්වභෞම පණ්ඩිත රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමින්ද්‍රයන් වහන්සේගේ ශිෂ්‍යභාවයට පත්ව ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය සිදු කොට ධර්මානන්ද යැයි නම් ලබමින් 1892දී මහනුවර මල්වතු මහාවිහාරයීය මංගලෝපෝෂථාගාරයේදී අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදාව ලැබූහ. පැලියගොඩ විද්‍යාලංකාර පිරුවනෙහි උපාචාර්ය පදවියකට සහ ඉනික්බිතිව 1901 වර්ෂයේදී බෙලිගම්මන ශ්‍රී විද්‍යාවර්ධන පිරුවනෙහි සහ 1904 දී නාත්තන්ඩිය වීරහේන විද්‍යාරත්න පිරුවනෙහි ආරම්භක පරිවේණාධිපති පදවියට පත්ව 1917 වර්ෂයේදී රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමියන් ගිලන්භාවයට පත් වූයෙන් විද්‍යාලංකාර පිරුවනෙහි උප පරිවේණාධිපති පදවියට සහ කොළඹ හලාවත දෙදිසාවේ උපප්‍රධාන සංඝනායක පදවියට පත්ව 1918 වර්ෂයේදී තත් නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ අපවත් වීමෙන් පසු විද්‍යාලංකාර පරිවේණාධිපති පදවියට පත්ව ධර්මකීර්ති ශ්‍රී සහ ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ගෞරව නාම සම්මුතීන් සහිතව කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝ නායක ධුරයෙන් සහ උපාධ්‍යාය පදවියෙන් සම්මානිත වූහ.

ස්වකීය ආචාර්යයන් වහන්සේලාගේ ජන්ම ග්‍රාමය වූ රත්මලාන ග්‍රාම නාමය ව්‍යවහාරයට ගනිමින් රත්මලානේ ධර්මානන්ද යනුවෙන් තත්කාලීන සමාජයෙහි ප්‍රසිද්ධියට පත් වූහ.

ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නාහිමියන්ගේ යුගය විද්‍යාලංකාර පිරුවනෙහි ස්වර්ණමය අවධිය ලෙසින් සඳහන් කිරීමට හැකි ය. සහස්‍රාධික දෙස් විදෙස් ශිෂ්‍යයන් විද්‍යාලංකාර පිරුවනෙහි ඉගෙනුම ලැබීමට පැමිණියේ මේ අවධියේදී ය. ඉන්දියාව, නේපාලය, චීනය, මහා බ්‍රිතාන්‍යය, තායිලන්තය, බුරුමය, ඕලන්දය, ලාඕසය, මැලේසියාව ආදී රටවලින් පැමිණි විදේශීය ශිෂ්‍යයන් මෙම වකවානුවෙහි විද්‍යාලංකාර පිරුවනට ඇතුළත්ව අධ්‍යාපනය ලැබූයේ එම වකවානුවෙහි පිරුවනෙහි කීර්තිය එම රටවල ද පැතිරී තිබූ නිසාවෙනි. විද්‍යාලංකාර පිරුවනෙහි භෞතික සම්පත්වල සුවිශාල දියුණුවක් ඇති වූයේ ශ්‍රී ධර්මානන්ද යුගයේදී ය. ඉන්දියාවේ පුරාවිද්‍යා කැණීම්වලින් හමුවූ සර්වඥ ධාතූන් වහන්සේලා පිරුවනෙහි දීප්තිමත් ආදිශිෂ්‍ය, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභානායක ශ්‍රීමත් ඩී. බී. ජයතිලක මැතිතුමාගේ මෙහෙයවීමෙන් විද්‍යාලංකාර පිරුවනට වැඩමවූයේ ද ශ්‍රී ධර්මානන්ද යුගයේදී ය.

රත්මලානේ ශ්‍රී ධර්මාරාම නාහිමියන් ආරම්භ කළ මොග්ගල්ලාන සම්ප්‍රදායේ පාලි



ව්‍යාකරණ සම්ප්‍රදායට පුනර්ජීවනය සැපයීම තවදුරටත් ඉදිරියට රැගෙන ගිය ශ්‍රී ධර්මානන්ද නාහිමිපාණෝ මොග්ගල්ලාන විරිත සත්‍යය, සුත්ත වුත්ති සහිත මොග්ගල්ලාන පඤ්චිකාව, පද සාධනය, මොග්ගල්ලාන ණ්වාදිවුත්තිය, මොග්ගල්ලාන පඤ්චිකාව ඇතුළු පොත්පත් සංස්කරණය කොට අනුපමේය සේවයක් සිදු කළේ මතු නොව හේවාවිතාරණ අටුවා සංස්කරණ සඳහා ද දායකත්වය ලබා දුන් සේක. ලංකාවේ ත්‍රිපිටකය හදාරන විද්‍යාර්ථීන්ට ඒ සඳහා සුදුසු වැඩපිළිවෙළක් මේ කාලයේ නොවූයෙන් විද්‍යාලංකාර පිරුවනෙහි ත්‍රිපිටක ධර්ම පරීක්ෂණ ක්‍රමයක් ආරම්භ කළහ. විද්‍යාලංකාර පිරුවන විශ්වවිද්‍යාල තත්වයට සකස් කිරීමේ මූලාරම්භය සනිටුහන් කරමින් පිරුවනෙහි විෂය නිර්දේශය සංශෝධනය කොට ත්‍රිපිටකාචාර්ය, ධර්මාචාර්ය, සාහිත්‍යාචාර්ය, විද්‍යා චක්‍රවර්තී, වෛද්‍ය ශිරෝමණී යන උපාධි පාඨමාලා සඳහා ඉගැන්වීම් සිදු කොට 1944දී උපාධි ප්‍රදානෝත්සව පැවැත්වීමද ආරම්භ කළහ. 1938 වර්ෂයේදී කැලණිය ධර්මාලෝක විද්‍යාලය ආරම්භ කරන ලද්දේද නාහිමියන්ගේ අනුශාසනා පරිදි විද්‍යාලංකාර සභාව මගිනි. අමරපුර සිරි සද්ධම්මවංස නිකායේ මහානායක පදවියට පත් කොස්ගොඩ ධම්මවංස හිමියන් විද්‍යාලංකාර පිරුවනෙහි ආචාර්ය පදවියකට පත් කරන ලද්දේ ශ්‍රී ධර්මානන්ද නාහිමියන් විසිනි. 1946 වර්ෂයේදී විද්‍යාලංකාර භික්ෂු දේශපාලන ප්‍රශ්නය ලෙසින් සමාජයේ කතිකාවතක් ඇති කළ සිද්ධි දාමයෙහි මූලාරම්භය ඇති වන්නේ ශ්‍රී ධර්මානන්ද නාහිමියන්ගේ යුගයේදීය. විධිමත් ධර්ම විනයානුකූල අධ්‍යයනයත් ඔස්සේ භික්ෂුවකගේ උරුමය තහවුරු කිරීමට කැප වූයේ ශ්‍රී ධර්මානන්ද නාහිමියන් ප්‍රමුඛ විද්‍යාලංකාර ගුරු කුලයයි.

විද්‍යාලංකාර ගුරුකුලය බැබළ වූ කිරිවත්තුඩුවේ ශ්‍රී ප්‍රඥාසාර නා හිමි, යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම නා හිමි, කොටහේනේ ප්‍රඥාකීර්ති මා හිමි, හැඩිපන්නල ප්‍රඥාලෝක හිමි, මාදෝවිට ඥානානන්ද මා හිමි, නාත්තන්ඩියේ ප්‍රඥාකර නා හිමි, නාරාවිල ධම්මරතන මා හිමි, වල්පොළ රාහුල හිමි, බඹරැන්දේ සිරි සීවලී හිමි, කලල්ඇල්ලේ ආනන්ද සාගර හිමි ඇතුළු පාණ්ඩිත්‍යයෙන් පිරිපුන් යතිවරයන් වහන්සේලා ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නාහිමියන්ගේ පා සෙවණෙහි ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණයෙහි වරම් ලැබූහ.

සහ ස්වකීය ආචාර්ය පරපුර කෙරෙහි අප්‍රමාණ ගෞරවයකින් කටයුතු කරමින් සැහැල්ලු නිරහංකාරදිවි පෙවෙතක් ගත කළ ලුණුපොකුණේ ශ්‍රී ධර්මානන්ද නාහිමිපාණන් වහන්සේ 1945 ජූනි මස 18 වන දින අපවත් වී වදාළ සේක.

මොරටුව විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය,
ඉංජිනේරු,
**දිමුතු පුන්සර කොළඹගේ**

## පිහිට පතයි



කොස්ගම, සාලාව, එන්.සී. නිවාස අංක 1/9 බී හි පදිංචි එච්.ඒ. සෝමරත්න මහතා දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. වෛද්‍ය එල්.එම්. නසාර් මහතා විසින් ඔහුට "ඕ පොසිටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බවට දන්වා ඇති බවද කියයි. පරිත්‍යාගශීලියෙකු වේ නම් දුරකතන 071 9504735 හෝ 071 5653627 අංකයට දැනුම් දෙන ලෙස ඉල්ලීමක් කෙරේ.



හමුදා නිලධාරියෙකු වන තුෂාර චන්දන (33) මහතා දරුණු වකුගඩු රෝගයෙන් පෙළෙන බව කියයි. ඔහුට "ඕ පොසිටිව්" හෝ "ඕ නෙගෙටිව්" වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු බ වෛද්‍ය නිර්දේශය වී ඇති බව ද කියයි. වකුගඩුවක් පරිත්‍යාග කළ හැකි අයෙක් වේ නම් දුරකතන 076 6375469 අංකයට දන්වා සිටින ලෙස ඉල්ලීමක් කරයි.

**විහාරස්ථානයක් අවශ්‍යයි**

ස්වාමීන් වහන්සේ නමකට විවේකීව සිටීමට / පන්සලක් සෑදීමට ඉඩමක් හෝ විහාරස්ථානයක් පරිත්‍යාග කිරීමට කැමති නම් දන්වන්න.

**0773586421**

**සියම් නිකායික**

සියලු ආගමික කටයුතු කිරීමෙහි දක්ෂ මැදිවියේ සාමණේර හිමි නමක් කාරුණික ගුරු හිමියන් කෙනෙක් යටතේ පැවිදි උපසපන් බව ලබා ස්ථානයක් භාරව කටයුතු කිරීමට සොයයි.

**(කොළඹ - ගම්පහ) විශේෂයි.**

**දු.ක. 077-6080940**

## පෝය ලබන සහ ගෙවෙන වේලාවන්

### ඇසළ පුර අටවක පෝය

ජූනි 28 ඉරිදා පූර්වභාග 02.53න් පුර අටවක පෝය ලබා 29 වැනිදා සඳුදා පූර්වභාග 00.35 පෝය ගෙවේ. ඉරිදා සිල්.

### ඇසළ පුර පසළොස්වක පෝය

ජූලි 04 සෙනසුරාදා පූර්වභාග 11.34 ට පුර පසළොස්වක පෝය ලබා 05 ඉරිදා පූර්වභාග 10.14 ට පෝය ගෙවේ. සෙනසුරාදා සිල්.

### ඇසළ අව අටවක පෝය

ජූලි 12 ඉරිදා අපර භාග 03.48 න් අව අටවක ලබා 13 සඳුදා අපර භාග 06.09 න් ගෙවේ. ඉරිදා සිල්.

### ඇසළ අමාවක පෝය

ජූලි 20 සඳුදා පූර්වභාග 00.10 න් අමාවක පෝය ලබා එදිනම අපරභාග 11.02 න් ගෙවේ. සඳුදා සිල්.

# පහන් සිතක කවි

## දහම පැතිරුණා



පොසොන් සඳ නැඟී ලොව එළිය කරනවා
මිහිඳු සමිඳු මිහින්තලා ගිරට වඩිනවා
දම් කඳ රට හැම තැනකම පැතිර ගලනවා
මහින්ද මහ රහතුන් අප දුකින් මිදෙව්වා

අනු බුදු නමින් රට හැම තැන ප්‍රකට වුණා
සාමය ඇති කරවූවා රට හතර තැනා
දෙවන මහා පෑතිස් රජු මවිත වුණා
රට තුළ දහම පතුරන්නට වැඩ වුණා

**මාරස්සන සුභූති හිමි**
ශ්‍රී සාරානන්ද විහාරය
කටුගස්තොට

## සමනොළ පුරාණය

මිහිඳු හිමි වැඩම කළ කාලයට පෙර
සුමණ නමැති පාලකයකු කුළුණු බර
වැඩ විසූ වගයි යහගුණ දම් දියුණු කර
සමනොළ අඩවිය යි මොහු විසූ දැහැමි පුර

සැම දෙන නගිති සිරිපද තම මුනිදුන්ගේ
බුදු සිරිපතුල බව හැඟුමයි බොදුවන්ගේ
මහ අසිරියකි සැලකිලි හැම මිනිසුන්ගේ
මෙය හුදු හාස්කම විය හැක දෙවියන්ගේ

**එන්. කරුණාවතී**
ගල්නෑව

## සාධු හඬ



දීඝවාපිය පුදබිමේ සාධු හඬ නැගෙනවා
ෂඩ් වර්ණ ධජයෙන් අහස් කුස දිලෙන වා
කසාවත් පොරවගත් සඟරුවන වඩිනවා
උවැසි උවැසියො නිසා සිල් සුවඳ හමනවා

සසර දුක් දැනෙන විට සසර බිය දැනෙනවා
දහම් හඬ නැගෙන විට දෙසවන්ද පිනනවා
නිවන ගැන අහන විට නිවන් සුව දැනෙනවා
සාධු හඬ නැගෙන විට සියලු දුක් නිවෙනවා

**ගොඩරත්මලේ විපස්සී හිමි**
ශ්‍රී තපෝදනාරාමය
ගල්කිරියාගම

## සෙත සදමු



අපේකම රැකගන්න උරුම දෙය සුරකින්න
දිවි මගම ජයගන්න හොඳම මිනිසකු වන්න
ඉරු දිනයෙ විදු බිම යි පන්සලට පිවිසෙන්න
මගෙ පුතේ මගේ දුවේ එපා කම්මැලි වන්න

අප ගැනම සිතා අප හෙට දිනය සරු කරමු
ගුණ දහම් පිරි ලොවක නිදහසේ දිවි ගෙවමු
අපිට හැකි හැම විටම පොදු ජනට සෙත සදමු
මගෙ පුතේ මගෙ දුවේ ලක්මවට මල් පුදමු

කිතුල්ගල
**රත්නසේකර රූපසිංහ**

## වඳිමි සිරස නමා

වඳිමි වඳිමි සිරස නමා
උතුම් පොසොන් දිනය අමා
සිව් බුදුවරු දෙසූ දහම
තවම නැත නිමා
සුරත් වඩින නිවන් පුරේ
මඟින් සිතුම් පහන් කෙරේ
දහම් හඬින් පොසොන් දිනේ
නිවන් මඟ පෙනේ

මිරිජ්ජවිල
**සිරි දන්තනාරායන**

## දහම් ආලෝකය



දම්සෝ රජුන්ගේ කාලයෙ මේ රටට
මිහිඳු සමිඳු හා පිරිවර වැඩ මෙරට
දැල්වූ දහම් ආලෝකය දස දෙසට
ඒකාලෝක වී විහිදෙයි මුළු රටට

හරයක් නොමැති ඇදහිලි වෙත තබා සිත
යොමුවුන හෙළයන්ගෙ පාද අඳුරු නෙත
ආලෝකවත් කළ අනුබුදු මිහිඳු වෙත
මේ මල් පුදමි හිමි පා මුල යොමා සිත

**කරුණා අමරකෝන්**
වැලිගල්ල

## සදහම් සිසිල

එද දඹදිව සිට
වැඩම කරමින් මෙරටට
අප හැරෙව් දහමට
වඳිමි අනුබුදු මිහිඳු සමිඳුට

ඔබ ගෙනා දහමින්
දුරාචාරය නගමින්
මෙරට දන යහමින්
හැදුනි සදහම් සිසිල නගමින්

බදුල්ලේ
**කෝට්ටේගොඩ පියදස හේරත්**

## මටත් ඉඩක්

මලක් පුදන තැන
දනක් බෙදන තැන
බණක් ඇසෙන තැන
මටත් පුංචි ඉඩක් ලැබේවා
සසරේ දවසක
මෙතේ බුදුන් දැක
නිවා ගන්න දුක
අනේ! මටත් පිනක් ලැබේවා!

**චන්ද්‍ර වාකිස්ට**
පොල්ගහමුල්ල - දික්වැල්ල

## උපාසිකාව



සල් සපු සමන් නා මල් සිඹගෙන ආව
විල් වල නෙළුම් මානෙල් සිසිළස නැව
ඇල්මක් ඇතත් ඒ මඳ නල සුව පැව
සිල් සුවඳක් පමණී දැනුනේ ඔබ ගාව

වළකාගෙන හැඟුම් රාගික බොළඳ සිතා
පෙළ පෙළ දහම් රස මීවිත සිතට ගෙනා
හළ යුතු දේම අත්හළ බව ලෙසට මනා
මල සුන මතට පූජා කළ මලක් වුණා.

**වික්‍රමසිංහ අතපත්තු**
තලවත්තේගෙදර

## මෙවර ජයග්‍රාහී කවිය

## අජරාමර නිවන



රූපය ලස්සනයි සුන්දර යැයි සිතලා
ඇතැමෙක් එහි ඇලෙති මෙය මාගේ කියලා
වයසත් සමඟ වියැකෙන රූපය දැකලා
හැකි වෙද සිතන්නට එය අනියත කියලා

හඬ කන්කලු වේවි හැක සිත් සනසන්න
නහයට හැකි ය සුවඳෙහි තතු දැනගන්න
වූ විට දුබල ඔබගේ ඉඳුරන් ගොත්න
හැකිදෝ මිහිරි වුවත් එය විඳ ගන්න

ගොරහැඩි වියළි සම නැහැ දෙන්නේ පහසක්
විකුවට අහර දෙනවද පිවිතුරු රසයක්
දුබලව ගිය සිතට මෙත් ගතට ද සැපයක්
ලැබුමට ඇත්තේ බුදු දහමයි එය සතුටක්

හැකි නම් දුරලන්න ඉඳුරන් ගේ පහස
වැළකිය හැකි ය වීමෙන් සිත අපහරණ
දුරු කළ හොතින් සිත තුළ ඇති දුර්වර්ණ
හැකි වේ පතන්නට අජරාමර නිවන

**සුදත් විජේසුන්දර**
ඇමරිකා එක්සත් ජනපදය

## දම් දීපය

බුදු හිමි තෙවරක්ම වැඩි මේ දම් දීපේ
බුදු ගුණ පැතිරුණා මුළු සදහම් දීපේ
අනුබුදු මිහිදු සමිඳුන් වැඩි මේ දීපේ
සදහම් පිරි රටකි අපගේ ලක් දීපේ

**ඒ. හේමාමාලනි**
බළන්ගොඩ

සංස්කරණය
**ජම්මික ප්‍රබෝධනී වැලිකල**

## කවි කිවිඳියනට සතර පෝදාටම දහම් තුටු පඬුරු

බුදුසරණ 'පහන් සිතක කවි' නිර්මාණ පිටුව සරසන ලේඛකයන් ඇගයීම පිණිස දෙහිවල නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය සහ කොළඹ සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති නා හිමියන්ගේ අනුග්‍රහයෙන් දහම් පඬුරු තිළිණ කෙරේ. සතර පෝදට ම හොඳම නිර්මාණ එවන ජයග්‍රාහකයන් සතර දෙනෙකුට එම තිළිණ පිරිනැමෙනු ඇත.

බුදුසරණ
පහන් සිතක කවි
BCC

සම්පූර්ණ නම :- ....................................................
ලිපිනය :- ....................................................
දුරකථන අංකය :- ....................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක පෝය දිනකම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ. ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න. සංස්කාරිකා, පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.


LAKE HOUSE
ශ්‍රී ලංකාවේ
පත්තර මහගෙදර යළිත් දැනුම බෙදන
තක්සලාවක් අරඹන වගයි...
පෙර පාසලට
අතුරු මිතුරු
Athuru Mithuru அதுருமிதுரு
මුතු ඇට 1 ශ්‍රේණිය දරුවන් සඳහා
මුතු ඇට 2 ශ්‍රේණිය දරුවන් සඳහා
මුතු ඇට 3 ශ්‍රේණිය දරුවන් සඳහා
මුතු ඇට 4 ශ්‍රේණිය දරුවන් සඳහා
විදුනැණ
නිසැක ශිෂ්‍යත්ව ජය
5 ශිෂ්‍යත්ව
10 - 11 ශ්‍රේණි සඳහාමයි
සා/පෙළ
සිත්මිණ
උසස් පෙළට නියත වරම්
2020 ජූලි මස 1 වැනි දා සිට

# ගමන් මඟ කිව නොහැකි රහත් මඟ



කුරුණෑගල රතනසෙල
ඓතිහාසික මහ පිරිවෙනෙහි
නියෝජ්‍ය පරිවේණාධිපති
**ගලගෙදර
රතනවංස හිමි**

**භවයෙන් භවයට සැරිසරන සත්ත්වයා සංසාර චක්‍රයට හසු වී ඇත. එක භවයක් අවසන් කොට අලුත් භවයකට පිවිසීම එහි ස්වභාවය යි. එම සැරි සැරීමේ දී කාම රූප, අරූපාදී, ලෝකවලට මාරුවෙන් මාරුවට හසු වේ. එහෙත් බහුල වශයෙන් කාම ලෝකවලට අයත් සතර අපාය, දිව්‍ය ලෝකය හා මිනිස් ලෝකය, තුළ සැරි සැරීම පුහුදුන් මානසිකත්වයට අනුව සාමාන්‍ය ස්වභාවයයි. එයිනුත් බොහෝ පිරිසක් අභෞව්‍යස්ථානවල සැරි සරන අතර, ස්වල්ප දෙනෙක් පමණක් සුගතිවල උපදිනු ඇත.**

බව ගමනෙහි මිනිස් ලෝකයේ ඉපදීමට ලැබීම ඉතා භාග්‍ය සම්පන්න ය. මිනිසෙක් වී ඉපදීම දුර්ලභ කරුණක් වශයෙන් බුදුදහම පෙන්වා දී ඇත. උසස් මනසක් ඇතිව ඉපදීම එහි විශේෂත්වය යි. සාමාන්‍ය වශයෙන් අවුරුදු සියක්, එකසිය විස්සක් මිනිසාට පරමායුෂ තිබුණ ද, වර්තමානය වන විට පරමායුෂ හැටක්, හැත්තෑවක් පමණ අවම ප්‍රමාණයට සීමා වී තිබේ.

කෙටි කාලයක් තුළ ජීවත් වන මිනිසා ආයුෂ අවසන් වූ කල මිය යනු ඇත. ආයුෂ හා විඥානය පහ වූ කල දර කැබැල්ලක් සේ මෙම ශරීරය අක්‍රිය වනු ඇත. ඊටපසු ඔහු වෙනත් භවයකට සම්බන්ධකම් කියනු ඇත. ශරීරය පොළ වට වැළලූ කල, පස් බවට පත් වී පොහොර වනු ඇත. මරණින් පසු කුමන තැනකට ගියා ද කියන වග නිශ්චිත වශයෙන් ම කීමට අපහසු ය.

ශරීරයක් පරීක්ෂා කොට ශරීරයට සිදු වූ හානිය පිළිබඳ ඒ ඒ ලක්ෂණ පරීක්ෂා කොට කීමට වෛද්‍ය විද්‍යාවට අනුව සමත්කම් දැක්වුව ද, මිය ගියාට පසු කො තැනට ගියා ද, කො තැනක ඉපදුණා ද කියා කීමට සමත්කම් දක්වන්නෝ නොවෙති.

ශරීරය විනාශ වූයේ බාහිර බලපෑමකින් ද, යම් කෙනෙකුගේ පහර දීමකින් ද, නැත්නම් වෙඩි තැබීමකින් ද යන්න පිළිබඳ වෛද්‍ය වාර්තාවක් දීමට ඔවුනට පුළුවන්කමක් ඇතත්, මියගොස් නැවත උපදින තැන කො තැනද කියා කීමට හෝ ඒ පිළිබඳ සහතිකයක් දීමට සමත්කමක් දක්වන්නෝ විරල වෙති.

බුදුන් දවස සිටි වංගීස නම් බමුණා මියගොස් ඉපදෙන තැන කීමට තරම් සුවිශේෂී හැකියාවක් තිබූ බමුණෙකි. ධම්ම පදයේ ඒ පිළිබඳව කතා පුවතක් ඇත. බුදුරදුන් කල සිටි වංගීස බමුණා මිය ගිය අයගේ හිස් කබල් ගෙන, එයට නිය පොත්තෙන් තට්ටු කොට ඔහු ඉපදී ඇත්තේ කොහේද යන්න පවසයි. එය කෙනෙකුට ඇති සුවිශේෂී හැකියාවක් බව අමුතුවෙන් කිවයුතු නැත. ඔහුගේ

> **බුදුරදුන් කල සිටි වංගීස බමුණා මිය ගිය අයගේ හිස් කබල් ගෙන, එයට නිය පොත්තෙන් තට්ටු කොට ඔහු ඉපදී ඇත්තේ කොහේද යන්න පවසයි. එය කෙනෙකුට ඇති සුවිශේෂී හැකියාවක් බව අමුතුවෙන් කිවයුතු නැත.**

හැකියාවට අනුව හිස් කබල්වලට තට්ටු කොට,

**නිරයෙහි උපන් කෙනෙකුගේ ය මේ හිස**
**තිරිසන් යෝනියෙහි උපන් කෙනෙකුගේ ය මේ හිස**
**ප්‍රේත ලෝකයෙහි උපන් කෙනෙකුගේ ය මේ හිස**
**මිනිස් ලෝකයෙහි උපන් කෙනෙකුගේය මේ හිස**
**දෙව්ලොව උපන් කෙනෙකුගේ ය මේ හිස**

ආදී වශයෙන් කීමට ඔහුට හැකියාවක් තිබුණි. විවිධ මිනිසුන් තම තමන්ගේ ඥාති සමූහයා, පවුලේ කෙනෙකු මියගියාට පසු කොතැනක උපන්නේ ද කියා දැන ගැනීමට වංගීස බමුණා ළඟට හිස් කබල රැගෙන ඒම සුලභ ව සිදු වන්නක් විය. ඔහුට විශාල වශයෙන් මුදල් ද ඒ සඳහා ලබා ගැනීමට හැකි විය.

නුවර වැසියන් මේ බමුණාගේ දක්ෂතාවය නිසා ම බුදුරජාණන් වහන්සේ ළඟට කැඳවාගෙන යන්නට විය. පසුව බුදුරජාණන් වහන්සේ රහතන් වහන්සේ කෙනෙකුගේ හිස් කබලක් දී 'බමුණ ඔබ කෙනෙකු මියගිය පසු උපදින තැන් කීමට සමර්ථයක් බව දැන ගන්නට ලැබිණ.

එසේනම්, මේ හිස් කබල පරීක්ෂාකොට ඔහු ගිය මඟ කිවහැකිද'යි ප්‍රශ්න කළහ. පසුව වංගීස බමුණා එම හිස් කබල ගෙන නියෙන් තට්ටුකොට ඒ පිළිබඳ කිසිවක් කීමට අපහසුව ලජ්ජාවෙන් මිරිකී මිරිකී සිටියේ ය.

පසුව බුදුරදුන් මතක් කර සිටින්නේ "බමුණ, ඔහු ගියමඟ මම දනිමි" යනුවෙනි. පසුව එම මන්ත්‍රය කුමක්දැයි, එය මටත් කියා දෙන්නැයි යනුවෙන් ඉල්ලා සිටියේ ය. බුදුහිමි ඔහුට දේශනා කළේ එම මන්ත්‍රය දැන ගැනීමට නම් පැවිදි ව, වත් පිළිවෙත් ඉටුකොට, බවුත් වැඩීම කළ යුතු බව ය. පසුව වංගීස බමුණා පැවිදි ව, ප්‍රතිපත්ති පුරමින් විදසුන් වඩා රහත් භාවය ද ලැබී ය. බුදුසසුන තුළ වංගීස තෙරුන් යනුවෙන් ප්‍රකට වූයේ ය.

රහතන් වහන්සේ කෙනෙකු යනු දස සංයෝජන ධර්ම සිඳ බිඳ දැ උතුම් නිවන් සුවයට පත් වූ උත්තමයෙකි. එවැනි උත්තමයෙකුගේ හිස් කබලක් හෝ ශරීර ඇට කැබැල්ලක් සාමාන්‍ය කෙලෙස් බරිත කෙනෙකුට පරීක්ෂණය කිරීම අපහසු කාර්යයකි. පුහුදුන් බුද්ධියට ඔවුන්ගේ පිරිනිවීමෙන් පසු ගිය මඟ කීම අපහසු ය. එය හරියට කුරුල්ලන් අහසේ ඉගිලී යැමෙන් පසු ගිය මඟ කීමට අපහසු වූවාක් මෙනි. ඒ බව ධම්ම පදයේ අරහත්ත වග්ගය තුළින් පැහැදිලි වේ.

යෙසං සන්නිචයො නත්ථි
යෙ පරිඤ්ඤාතභොජනා
සුඤ්ඤතො අනිමිත්තො ච
විමොක්ඛො යස්ස ගොචොරො
ආකාසෙව සකුන්තානං
ගති තෙසං දුරන්නයා


නිවන අරමුණ කොටගත් රහතන් වහන්සේගේ ස්වභාවය දැන ගැනීම අපහසු ය. අහසේ පක්ෂීන් ගිය මඟ නො දත හැකිවාක් මෙනි.

රහතන් වහන්සේ පිළිබඳ ත්‍රිපිටකය තුළ සඳහන් කරුණුවලට අනුව රහතන් වහන්සේගේ ස්වභාවය, ඉපදීම කෙනෙකුට නො දත හැකි ය. එය බුදු කෙනෙකුගේ ම ඥානයට හසු වන්නකි. අද වුව ද සෝවාන්, සකෘදගාමි, අනාගාමි හෝ අර්හත් වී ඇති කෙනෙකු සිටිද්ද, නැද්ද කීම අපහසු ය. ඔවුන් කිසි දිනක සෝවාන් වූවා හෝ රහත් වූවා හෝ කියා ප්‍රකට නොවෙති.නමුදු එසේ කියන ඇතැම් පිරිසක් භික්ෂු සමාජයේ හා ගිහි සමාජයේ දක්නට ලැබේ. එය දසමාර සේනාවන්ගෙන් එකක් හැටියට පෙන්වා දීමට පුළුවන. බොරු සිල් පෙන්වමින්, සතර මඟ හා ඵලවලට පත් වූ ආකාරයෙන් අනුන්ගේ ලාභ ප්‍රයෝජන බලාපොරොත්තුවීම ඔවුන්ගේ එකම අරමුණ වී ඇත.

රහතන් වහන්සේගේ ගුණ නො දැන රහතන් වහන්සේට නින්ද, අපහාස කිරීම හෝ තාඩන, පීඩන කිරීම තුළින් සිදුවන අකුසලය ඉතා බරපළ ය. රහතන් වහන්සේ මැරීම, ආනන්තරිය පාපකර්ම වලින් ද එකක් වන්නේ ය.

මහරහතුන්ගේ චරිත කතා සම්බන්ධ කොටගෙන ප්‍රතිපත්ති පිරීම සිදු කළ යුතුව ඇත. එතුළින් සතර මඟ හා ඵලත්, නිවන් සුවයත් ක්ෂාත් ක්ෂාත් කර ගැනීමට පුළුවන් කමක් ඇත.





# සීගිරිය අසල පිහිටි
# පිදුරංගල මහා බුදු පිළිම වහන්සේ

**සීගිරියට කිලෝමීටරයක් පමණ උතුරින් පිහිටි පිදුරංගල පුරාණ ගල්ලෙන් පිළිබඳ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස් එච්.සී.පී. බෙල් මහතා 1899 වර්ෂයේ දී පුරාවිද්‍යා වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. සීගිරියේ වාගේම පිදුරංගල ගල්ලෙන්වලත් ක්‍රිස්තු පූර්ව සියවස් කාලයේ දී භික්ෂූන් වහන්සේලා වැඩ වාසය කර තිබෙනවා.**

පුරාණ ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප 61

මේ බව දැනට එහි විහාරයක් ලෙසට භාවිත වන ලෙනේ කටාරමට යටින් බ්‍රාහ්මී අක්ෂරයෙන් කොටා ඇති පාඨයෙන් පෙනෙනවා. ගල මුදුනට කිට්ටුව විශාල ලෙනක ගඩොලින් සහ හුණු බදාම යොදා සාදා ඇති යෝධ සැතපෙන බුදුපිළිම වහන්සේ සීගිරියේ මාලිගා සෑදූ කාලයේ දී ම සාදා ඇති බව ඉතා පැහැදිලි ය. මෙසේ කීමට හේතුව මේ සැතපෙන බුදු පිළිම වහන්සේ පිහිටි ලෙන ඉදිරිපිට ඇති ගලක පස්වැනි සියවසට හෝ ඊට ආසන්න කාලයකට අයත් වන එක ශිලා ලිපියක් තිබෙන නිසා ය.

*(පුරා විදු පරියේෂණ - මහාචාර්ය සෙනරත් පරණවිතාන. පි. 182 - 1972)*

මෙම සැතපෙන බුදු පිළිම වහන්සේ පිළිබඳ මහාචාර්ය මාලිංග අමරසිංහ මහතා මෙසේ සඳහන් කරයි.

සීගිරියේ ඉහළ ගල් ලෙනක පිහිටා තිබෙන සැතපෙන බුදු පිළිමය ගඩොලින් සාදන ලද, සොරුන් විසින් කඩා බිඳ දමන ලද්දකි. මෙහි ශරීරයේ කොටස් කීපයක් ඉතිරි වී ඇතත් ඒ අනුව මෙම බුද්ධ ප්‍රතිමාවේ ස්වරූපය පැහැදිලි ය. බුදු පිළිමය ගඩොලින් සාදා සම්පූර්ණයෙන් ම හුණු බදාමයෙන් කපරාරු කර ඇතත්, එය වර්ණ ගන්වා නැත. ලංකාවේ හමුවන ගඩොලින් කරන ලද පැරණිතම බුදුපිළිමය මෙය වන අතර මේ පිළිමය ක්‍රිස්තු වර්ෂ පස්වන සියවසේ දී පළ මුවන කාශ්‍යප රජතුමා විසින් කරවන ලද්දකැයි විශ්වාස කෙරේ.

මෙම ප්‍රතිමාවේ වම් අතත්, උකුල ප්‍රදේශයෙන් පහළ කොටස් හා දෙකකුල් ආදියත් දක්නට ලැබෙන අතර, සිවුර අනුරාධපුර කාලයේ සාදන ලද බුදුපිළමවල දක්නට ලැබෙන ආකාරයේ තනි රැලිවලින් යුක්ත වේ. බුදු පිළිම වහන්සේගේ අත්වල ඇඟිලි බෙහෙවින් ම සජීවී බවක් පෙන්වයි. ශරීරය දිගට ගලා යන සිවුරුපට එකතු කරන ලද රැළි සමූහයකින් යුක්ත වේ. සිවුරට යටින් අඳනයේ කොටසක් දැකිය හැකි ය.

එකිනෙක මත පිහිටි පාද දෙකේ ඇඟිලි සියල්ලම විනාශ කර තිබේ.

මේ පිළිම වහන්සේගේ සිරසට සම්බන්ධ වූ අක්බමරු කෙහෙරැළි බොහෝ ප්‍රමාණයක් හමුවී ඇත. ඒවා වෙනම තැනක තැන්පත් කර තිබේ. දිගින් අඩි 49 වන මෙම සැතපෙන ඉරියව්වෙන් යුත් බුදුපිළිම වහන්සේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිසංස්කරණය කර තිබේ.

*(ලක්දිව බුද්ධ ප්‍රතිමා මහාචාර්ය මාලිංග අමරසිංහ - පි. 140 - 141 - 2010)*

මෙම විශේෂිත වූ බුදුපිළිම වහන්සේ අපේ පුරාණ මූර්ති ශිල්පීන්ගේ දක්ෂතාවය හෙළි කරන නිර්මාණයකි. සැතපෙන ඉරියව්වෙන් යුක්ත මෙම බුදු පිළිමයට අමතර ව පිදුරංගල පුදබිමෙහි පර්වතය පා මුල සම බිමෙහි ද ගැබක බෝධිඝරයක්, පෝය ගෙයක් (උපෝසථඝරයක්) පිළිම ගෙයක හා ආවාස රාශියක නටබුන් (භික්ෂූන් වහන්සේ වාසය කළ) හමු වී ඇත.

> සීගිරියේ ඉහළ ගල් ලෙනක පිහිටා තිබෙන සැතපෙන බුදු පිළිම වහන්සේ ගඩොලින් සාදන ලද, සොරුන් විසින් කඩා බිඳ දමන ලද්දකි. මෙහි ශරීරයේ කොටස් කීපයක් ඉතිරි වී ඇතත් ඒ අනුව මෙම බුද්ධ ප්‍රතිමාවේ ස්වරූපය පැහැදිලි ය.

පිදුරංගල පිහිටි ස්තූප (දාගැබ්) ගොඩනැගිල්ලක පෙදෙසේ වාසය කළ ජනතාවගේ විශේෂ ගරු සැලකිලිවලට ලක් වී ඇති බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි. ඒ සඳහා එතුමා විසින් දාගැබ තිබූ ස්ථානය එළි පෙහෙළි කර පුරාවිද්‍යා කැණීමක් ද සිදුකර ඇත.

ඒ අනුව 1951 දී මෙම පුදබිම පුරාවිද්‍යා ආරක්ෂිත භූමියක් ලෙසට ප්‍රකාශයට පත් කර ඇත. ඒ වර්ෂයේ දී පරණවිතාන මහතා විසින් ස්තූපය තිබුණු ස්ථානය ගවේෂණය කර, කැණීමක් ද සිදුකර තිබේ. ඒ අනුව දාගැබේ ගොඩැල්ල හෙළි කර ගැනීමත්, සුන්බුන් ඉවත් කර දාගැබේ නටබුන් සහ ඒවා පිහිටි මළුව පාදා ගැනීමත් එහි අභ්‍යන්තරය පරීක්ෂා කර බැලීමත් 1951 දී ආරම්භ කර තිබේ.

එම දාගැබ පිහිටා ඇත්තේ සතරැස් මළුවක ය. අවට බිම් මට්ටමට වඩා අඩි හයක් උස් කර සාදා ඇති මෙම මළුවේ එක් පැත්තක දිග අඩි 80 කි. එහි බැම්මේ උඩ කොටස හා යට කොටස කැටයමින් අලංකාර කර ඇත. මෙම මළුවේ සතර පැත්තේ ගල් පඩි පේළි තිබුණි.

*(පුරා විද්‍යා පාලන වාර්තාව 1951 ආචාර්ය සෙනරත් පරණවිතාන පි. 1718)*



පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු සහකාර පුරාවිද්‍යා අධ්‍යක්ෂ
**සිරිසමන් විජේතුංග**
පුරාවිද්‍යා Msc පර්යේෂණ

වර්ෂ 2020 ක් වූ ජූනි 28 වනදා ඉරිදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.